
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ ඇසළ පුන් පොහෝ ද රාජ්‍ය වර්ෂ 2020 ජූලි 04 වැනි දා සෙනසුරාද BUDUSARANA, SATURDAY JULY 04, 2020

55 වැනි කාණ්ඩය, 05 වැනි පත්‍රය, පිටු 32 ආරම්භය 1965 - 06 - 13 මිල රු. 40.00 ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.





# සදහම් ආලෝකයෙන් විශ්වය ඒකාලෝක විය

**බුද්ධ ජීවිතය සම්බන්ධයෙන් සිතන පතන ඕන ම කෙනෙකුට සිහියට නැගෙන එක ම පළමු සූත්‍රය වන්නේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව යි. මේ දේශනාව සිදු කර ඇත්තේ අද වැනි ඇසළ පුර පසළොස්වක පොහෝ දිනක යි. ඉතින් අපේ බුදුරජාණන් වහන්සේ මේ දේශනාවෙන් අනතුරු ව යම් දහමක් ලෝකය හමුවේ ප්‍රකාශ කළා නම්, ඒ හැම දහමක ම පදනම වෙලා තිබෙන්නේ මෙම ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව යි.**




මහනුවර අස්ගිරි
මහාවිහාරයේ
කාරක සංඝ සභික
වයඹ පළාතේ
ප්‍රධාන සංඝනායක
මහාචාර්ය **තුඹුල්ලේ**
**ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**


අප දන්නවා බුදුරජාණන් වහන්සේ විශේෂයෙන් ගිහි විනය සම්බන්ධයෙන් දේශනා කළ සූත්‍ර ධර්මයන් වන සිඟාලෝවාද, ව්‍යග්ඝපජ්ජ, වසල, මංගල වැනි සූත්‍ර රාශියක් ගැන.

මේ සම්බන්ධයෙන් සලකන විට ත් ඒ හැම එකකට ම පදනම් වෙලා තිබෙන්නේත් මෙම දම්සක් සූත්‍ර දේශනාව යි.

ඒ කියන්නේ සිද්ධාර්ථ ගෞතම නම් වූ අප බෝධිසත්වයන් වහන්සේ එදා දීපංකර පාදමූලයේ දී මෙයින් සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයකට මත්තෙහි සිද්ධාර්ථ ගෞතම නමින් සම්මා සම්බුද්ධත්වයට පත් වන බවට දීපංකර බුදුරජාණන් වහන්සේ නියත විවරණ ලබා දුන් අවස්ථාවේ සිට එදා සුද්ධෝදන රජතුමාට දාව මහාමායා නම් දේවීන් කුසින් බිහි වී මේ මිහිපිට මිනිසත් බව ලබා ගත්තා.

එතැන් සිට 29 වන අවුරුද්දක් මුළුල්ලෙහි අධික ලෙස කාමභෝගී, අතිශය ලෞකික සැප සම්පත්වලට ගිජු වී, එහි ආශ්වාදය ලබා එහි ආදීනව ද මැනවින් දැන හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් යසෝදරා දේවීන් හට රාහුල පුත්කුමරු ලැබුණු දිනයේ එම ජීවිතයෙන් ඉවත්වීම හෙවත් නිස්සරණය අරමුණු කර ගිහිගෙයින් නික්මුණා. ඉන් අනතුරු ව උන්වහන්සේ අවුරුදු හයක් පුරා අත්වින්දේ එදා භාරතීය සමාජයේ විවිධ ආගමික ශාස්තෘවරයන් විසින් අධික ලෙස ශරීරයට දුක් දීමෙන් ලැබෙනවා කියන විමුක්තිය සොයා ගැනීම අරමුණු කොට අත්තකිලමථානුයෝගී දිවි පෙවෙතක් ගත කිරීමෙන් ලැබූ අත්දැකීම් රාශියක්. මෙය බැලූ බැල්මට සුළුපටු කාලයක් නොවේ. අවුරුදු හයක්.

ඉතින් මේ අන්ත දෙකේ ම ආශ්වාදය, ආදීනව (විපාක), වගේම මෙයින් විමුක්තියක් නොමැති බවත්, එහි නිසරු බවත් අවබෝධ වීම තුළ එයින් මිදීම හෙවත් නිස්සරණය පිණිස තෝරා ගත්තේ ඒ අන්ත දෙකට ම නොයන මැදුම් පිළිවෙත යි. මේ මග අනුගමනය කරමින්

උන්වහන්සේට කල් ගෙවන්ට වූයේ පැය 12 කට වැනි සීමිත කාලයක්. උන්වහන්සේ ස්ථිර අධිෂ්ඨානයෙන් චතුරංග සමන්නාගත වීර්යයෙන් යුක්ත ව එම මධ්‍යම ප්‍රතිපදාව තුළ ක්‍රියාකරමින් ආනාපානසතියෙන් ලොවුතුරා බුද්ධත්වයට පත් වී තමන් වහන්සේගේ අරමුණ සඵල කර ගත්තා. ඒ අවස්ථාවේ උන්වහන්සේ ප්‍රකාශ කළ "අනෙකජාති සංසාරං" යනාදී ප්‍රීති වාක්‍යයෙන් හෙවත්, ප්‍රථම උදානයෙන් පැහැදිලි ව ප්‍රකාශ කළේ අනන්ත සංසාරයෙහි ඉපදෙමින් මැරෙමින් සත්වයා ගමන් කරන මෙම සංසාර ගමනේ නැවතීම උන්වහන්සේ සොයා ගත් බවත්, මේ සසර ගමන ඇති තෘෂ්ණාව නමැති ඇලීම සුණු විසුණු කිරීමෙන් එම උදාර අරමුණ ඉටු කර ගත හැකි ආකාරය යි.

එහෙත් සුදුසු අවස්ථාව එළඹෙන තුරු එසේ සොයා ගත් විමුක්ති මාර්ගය අන් කවරෙකුට හෝ පැහැදිලි කිරීමෙන් බුදුරජාණන් වහන්සේ වැළකී සිටියා. අනතුරුව සහම්පතී මහා බ්‍රහ්මයා උන්වහන්සේ හමුවට පැමිණෙන අවස්ථාව වන විට උන්වහන්සේ තමන් වහසේට සෙවණ ලබා දුන් ඇසතු බෝ රුක මුල කේන්ද්‍ර කර ගත් සත්සතිය අවසාන කර අටවන සතියේ නැවතත් අජපාල නම් නුගරුක මුලට වැඩම කළ අවස්ථාව උදා වුණා. ඒ අවස්ථාවේ මහා බ්‍රහ්මයා විසින් ආරාධනා කළේ උන්වහන්සේ අවබෝධ කර ගත් නවතම ඒ අපූරු දහම ලොවට හිත පිණිස දේශනා කරන ලෙසට යි.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ද එම දහම දේශනා කිරීමට සුදුසු කාලය බව අවබෝධ කර ගෙන යුතුකමක් වශයෙන් කෘතවේදීත්වය පළ කරනු පිණිස පළමුවෙන් ම එම දහම දේශනා කරන්නට කල්පනා කළේ තමන් වහන්සේට මේ විමුක්තිය සොයා යන ගමනේ දී දුෂ්කර ක්‍රියා සමයෙහි උපකාරී ව සිටි, එහෙත් පසුව තමන් වහන්සේ අතහැර ගිය පස්වග තවුසන්ට මේ දහම දේශනා කිරීමට යි.

උන්වහන්සේ පස්වග තවුසන් උතුම් පැවිදි බවෙහි පිහිටුවා බරණැස ඉසිපතනාරාමයේ දී එදා අද වාගේ ඇසළ පුර පසළොස්වක පොහෝ දා තමන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව ලෙස මේ දම්සක් පැවැතුම් සූත්‍රය දේශනා කරන්නට වූවා. එදා මනුෂ්‍ය ගණයට වැටෙන අය වශයෙන් එහි ධර්ම ශ්‍රවණයට හිටියේ පස්වග භික්ෂූන් වහන්සේලා පමණි. අනිත් සියලු දෙනා දිව්‍ය බ්‍රහ්ම පිරිස් ය. උන්වහන්සේ දම් දෙසුම ආරම්භ කරන්නේ ම මෙතෙක් කලක් තමන් වහන්සේගේ අනන්ත සංසාර ගමනේ දී ප්‍රත්‍යක්ෂ කර ගත් කාමසුඛල්ලිකානුයෝගයත්, අත්තකිලමථානුයෝගයත් යන අන්ත දෙකේ ආදීනව පෙන්වා දෙමිනු යි. මෙය තමා සැබෑ ආචාර්යවරයෙකු ලෙස බුදු රජාණන් වහන්සේගේ පළමු අනුශාසනය. උන්වහන්සේ අසංඛ්‍ය කල්ප ලක්ෂ හතරක් තුළ අවබෝධ කර ගත්තේ මේ අන්ත දෙකේ ආදීනවයන් අත්දැකීමෙන්, ඒ අනුව ම දේශනාව සිදු කළා. බුදුවන ආත්ම භවයෙහි දී උන්වහන්සේ වඩාත් ප්‍රත්‍යක්ෂ කර ගත්තේ එම අන්ත දෙක පිළිබඳ වෙන කවරදාටත් වඩා විශාල අත්දැකීම් රාශියක්. උන්වහන්සේ ඒ සියල්ලක් අවබෝධයෙන් තේරුම්ගත් ගත්තා.

උන්වහන්සේ විසින් මේ ආකාරයෙන් දේශනා කරන ලද දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේ දී දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය හා දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා සත්‍යය යන සත්‍ය හතර පැහැදිලි කරන අවස්ථාවේ දී මුල් සත්‍යය තුනම විග්‍රහ කිරීමෙන් පසුව අවසානයට ගන්නා මේ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය මගින් සමස්ත සූත්‍ර දේශනාවේ ම සාරාංශය ඉදිරිපත් කිරීමකු යි කර තිබෙන්නේ. උන්වහන්සේ මේ සූත්‍ර දේශනාවේ දී ප්‍රශ්නාර්ථයක් ඉදිරිපත් කරනවා.

මේ කියන අන්ත දෙකින් ඉවත් වුණා නම් එවිට තිබෙන්නේ මේ අන්ත දෙකට අයත් නො වන මැද මාවත යි. ඉතින් ඒ මැද මාවත කුමක්දැ යි උන්වහන්සේ විසින් ම ප්‍රශ්නාර්ථයක් ඉදිරිපත් කරනවා. දුක නැති කිරීමේ මාර්ගය හෙවත් මධ්‍යම ප්‍රතිපදාව කුමක්දැ යි යන්න උන්වහන්සේ විසින් ම දේශනාවේ දී නගන ලද ප්‍රශ්නයක්. එනම් දුක නැති කරීමේ මාර්ගය අන් කවරක් නොව ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. එතකොට මේ දුකින් තමා අප හැම මොහොතක ම පෙළෙන්නේ.


**මෙම ලිපියේ ඉතිරි කොටස ඇසළ අව අටවක පෝද (ජූලි 12) කලාපයේ පළවේ.**

ඇසළ පුර පසළොස්වක පෝය

## දම් දෙසුම



# දැන දැක දුරු කළ යුතු අකුසල් මුල්



අමරපුර සිරි සද්ධම්මවංස මහා නිකායේ
මහ නායක
**අහුන්ගල්ලේ සිරිසීලවිසුද්ධි
මහ නාහිමි**

**කුසලය නැමැති ශ්‍රේෂ්ඨ ධර්මයට විරුද්ධ ව ඇති එකම ධර්මය අකුසලය යි. ඒ නිසා කුසල් නොවන සියල්ල අකුසල ලෙස හඳුන්වා තිබේ. එය දැක්වූයේ “න කුසලං අකුසලං” යනුවෙනි.**

අටුවාව අකුසලය යන වචනයට තේරුම් දී ඇත්තේ මිත්‍ර ධර්මයට ප්‍රතිවිරුද්ධ ක්‍රියා ඇති තැනැත්තා අමිත්‍රයා වන්නා සේ, කුසල ධර්මයන්ට ප්‍රතිවිරුද්ධ වූයේ අකුසලය වෙයි යනුවෙනි. මේ අනුව කුසල ධර්මයන්ට ප්‍රතිවිරුද්ධ සියලු දේ අකුසල් යනුවෙන් හඳුනා ගත හැකි ය. සියලු භය උපද්‍රවයන්ට හිතවත් ව, පවතින, පහත් ලාමක හීන ධර්මයන්ගේ පැවැත්මට හේතු වන කරුණු අකුසල නම් වේ.

සියලු අකුසල ධර්මයන්ට ලෝභ, ද්වේශ හා මෝහ යන අකුසල මුල් තුන හේතු වන බව සර්වඥයන් වහන්සේ දේශනා කළ සේක.

ලෝභය යනු වස්තුකාම, ක්ලේශ කාම දෙකෙහි පවත්නා ගිජු බවයි. ආශාව, කැමැත්ත, සෙනෙහෙස, බැඳීම, කාමය, රාගී බව, ඇලී ගැලී සිටීම, පංච ඉන්ද්‍රියන් පිනවීමට ඇති කැමැත්ත, ධනය බලය කීර්තිය යනාදියට ඇති ආශාවත්, ලෝභය ලෙස හැඳින්විය හැකි ය. ලෝභය කපුටු වසුරක් මෙන් වැටුණු තැන ඇලී සිටියි. රත් වූ තැටියකට දැමූ මස් වැදැල්ලක් එහි ඇලෙන්නේ යම් සේ ද ලෝභයත් එසේ මය. ලෝභය ලාම්පු දැලි මෙන් බැඳුණු දෙය අත් නොහරී. ප්‍රබලව ගලා යන සැඩ පහරින් ගංගා ජලය මුහුදට ගලා යන්නා සේ ලෝභය සත්වයා දුක කරා ඇද ගෙන යයි.

> **ලෝභය ලාම්පු දැලි මෙන් බැඳුණු දෙය අත් නොහරී**


ද්වේශය යනු අනුන් කෙරෙහි සිතේ උපදනා දුෂ්ට වූ සිතිවිලියි. නොකැමැති බව, පිළිකුල, කෝන්තරය, නොරිස්සීම, විරෝධය. වෛරය, පළිගන්නා සුළු බව ද්වේශය ලෙස හැඳින්විය හැකි ය. ද්වේශය තුළ කුපිත වූ නාගයෙකුගේ විෂ වැනි බිහිසුණු බවක් ඇත. නාග විස ඉතා ඉක්මනින් ශරීරය තුළ පැතිර යන්නාක් මෙන් ද්වේශය ද සිත තුළ ඉතා ඉක්මනින් පැතිර යයි. ද්වේශය සත්වයා දවාලයි. හරියට වනයේ පවතින ලැව් ගින්නක් හා සමාන ය. ලැව්ගින්නෙන් හසුවන සියලු දේ දවාලයි ද, එසේම ද්වේශයෙන් සත්වයා දවා විනාශ කරයි.

මෝහය යනු යථා ස්වභාවය වසාලන මුළාවයි. අනුවණකම, ව්‍යාකූලතාව, මෝඩකම, නොදැනීම, දෘෂ්ටියක එල්බ සිටීම, අවිචාරවත් විශ්වාසය, මිථ්‍යාදෘෂ්ටිය මෝහය ලෙස හඳුන්වාදිය හැකි ය. මෝහය අන්ධභාවය හා සමානයි. නොදැනුවත්කම ස්වභාවය කොට ඇත. මෝහය තිබෙන තාක් කිසිවක හොඳ නරක, යහපත අයහපත, අභ්‍යන්තරය පරීක්ෂා කර නොබලයි. මෝහයේ ඇත්තම ස්වරූපය යථා ස්වරූපය බැහැර කිරීම යි.

මෙම අකුසල මූලයන් තුන දැන දැක දුරු කළ යුතු ය. නොඑසේනම් සිදුවන්නේ මහා විනාශයකි. මහා දුක්ඛයකි. ඒ බව සර්වඥයන් වහන්සේ ම මෙසේ පැහැදිලි කළ සේක. මහණෙනි, ලෝභයෙන් උපන් ලාමක අකුසල ධර්මයන් විසින් මඩනා ලද සිත් ඇති පුද්ගලයා මේ ආත්මයේදී ම උපද්‍රව සහිත වූ, උපායාස සහිත වූ කායික චෛතසික පරිළාහයෙන් යුක්ත වූයේ නිරතුරුව ම දුකසේ වාසය කරයි. මරණින් මතු දුගතියට ද පැමිණේ. මහණෙනි, ද්වේශයෙන් උපන් ලාමක අකුසල ධර්මයන් විසින් මඩනා ලද සිත් ඇති පුද්ගලයා මේ ආත්මයේදී ම උපද්‍රව සහිත වූ, උපායාස සහිත වූ කායික චෛතසික පරිළාහයෙන් යුක්ත වූයේ නිරතුරුව ම දුකසේ වාසය කරයි. මරණින් මතු දුගතියට ද පැමිණේ. මහණෙනි, මෝහයෙන් උපන් ලාමක අකුසල ධර්මයන් විසින් මඩනා ලද සිත් ඇති පුද්ගලයා මේ ආත්මයේ දී ම උපද්‍රව සහිත වූ, උපායාස සහිත වූ කායික චෛතසික පරිළාහයෙන් යුක්ත වූයේ නිරතුරුව ම දුකසේ වාසය කරයි. මරණින් මතු දුගතියට ද පැමිණේ.

අකුසල මුල් තුනෙන් ඇති වන මහා විනාශය තව තවත් පැහැදිලි කිරීම සඳහා සර්වඥයන් වහන්සේ මාලුවාලතෝපමාව දැක් වූ සේක. යම්කිසි සල් ගසක තුන් පැත්තෙහි මාලුවා වැල් තුනක් ක්‍රමයෙන් වැඩී සල් ගසේ අතුපතරාදිය වෙළා ගසත් වසාගෙන වැඩෙන්නේ ය. ඒ වැලේ කොළ ගොටු සහිත ව විශාල වර්ගයක් බැවින් වර්ෂා කාලයේ දී ඒ කොළ ගොටුවල ජලය පිරෙයි. සුළං කාලයේ දී සල් ගසේ ලොකු කුඩා අතු කැඩී ගසේ කඳ පමණක් ඉතිරි වෙයි. මාලුවා වැල් වර්ධනය වීමෙන් අන්තිමේ දී ඒ කඳත් විනාශයට පැමිණෙයි. ලෝභ, ද්වේශ, මෝහ අකුසල මුල් තුන සල් ගස වෙළා ගත් මාලුවා වැල් තුන හා සමානයි. ඒ වැල් තුන වැඩීමෙන් සල් ගස විනාශ වූවා සේ සිත් තුළ අකුසල මුල් තුන වැඩීමෙන් අපේ ජීවිත ද විනාශයට පත් වෙයි. ඒ නිසයි මෙම අකුසල් මුල් තුන දැන දැක දුරු කළ යුත්තේ.





# ශාසනය වනසන හැටි පැවසෙන සද්ධම්ම පතිරූපක සූත්‍රය

**සංයුත්ත නිකාය නම් ත්‍රිපිටක ග්‍රන්ථයේ කස්සප සංයුත්තයේ අවසන් සූත්‍රය සද්ධම්ම පතිරූපක සූත්‍රයයි.**

මෙය තථාගතයන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් දම් පුරා අවබෝධ කොට දේශනා කළ, ධර්මය වනසන පුද්ගලයන් පිළිබඳ ව උන්වහන්සේ විසින් ම හෙළි පෙහෙළි කළ සූත්‍ර දේශනාවකි. බුදුරදුන් ලොවට හෙළි කළ දහම රත් මිණි මුතුවලට වඩා වටිනා බව අපි දනිමු. එයින් ලොව අදටත් අත් විඳින සහනය හා සැනසිල්ල මිල කළ නො හැකි ය. කුහුඹුවාගේ සිට චක්‍රවර්තී නරපතියන් දක්වා සත්ත්ව වර්ගයා ද, විශ්වයේ පැතිර පවතින්නා වූ සකලවිධ ජීවී අජීවී පරිසරය ද, අවනත වූ දහමත්, බුහුමන් කළ දහමත් ශ්‍රී සුගත තථාගත සද්ධර්මයම වේ.

මෙම දහම ගැඹුරු බුද්ධියක් මෙන්ම පිවිතුරු ශ්‍රද්ධාවක් ඇතිව රැක ගැනීමට වෙහෙසෙන්නා වූ උතුමෝ බොහෝ වූ අතර, අද ද එසේම සිටිති. එමෙන්ම එය දැන හෝ නොදැන වනසන්නන් ද අපමණ බව හැඟෙන විට ඇති වන බලවත් සංවේගය සත්පුරුෂ ලෝකයාට පොදු කරුණකි.

රත්රන්, ලෝකයේ වටිනා ලෝහ වර්ගයක් බව අපි කවුරුත් හොඳින් දනිමු. යකඩ, තඹ, පිත්තල ආදී අනෙක් කිසිදු ලෝහ වර්ගයකින් එයට අභියෝගයක් නැත. ඒවා රත්රන් නොවන බැවිනි. එහෙත් රත්රන් නොවන, රත්රන් වැනි ලෝහයක් බිහිවීම ගැටලුවකි. වෙනත් විධියකින් කිවහොත් ඉමිටේෂන් රත්රන් යැයි සිතා රැවටීමට ලක් වෙති. සද්ධර්මයේ පැවැත්ම සම්බන්ධයෙන් කතාව ද මෙබඳු ය. වෙනත් ආගම් හෝ දර්ශනවාද නිසා බුදුදහමට හෝ සද්ධර්මයට කිසිදු හානියක් සිදු නොවේ. එහෙත් වර්තමාන ලෝකයේ බුදුදහම යැයි පවසමින් අසද්ධර්මය පෙන්වා දෙන පුද්ගලයන් නිසා තථාගත දේශිත ශ්‍රී සද්ධර්මයට සිදු වන්නේ බලවත් හානියකි. මෙම කරුණ පිළිබඳ ව සද්ධම්ම පතිරූපක සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ සාකච්ඡාවට බඳුන් කොට ඇත.

සද්ධම්ම පතිරූපක සූත්‍රයේ නිදාන කතාව කෙටියෙන් මෙසේ ය. බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුතුමා විසින් කරවන ලද දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන දිනෙක ආයුෂ්මත් කස්සප තෙරණුවෝ එතැනට එළඹියහ. බුදුරදුන් නැමඳ එකත් පසෙක වැඩසිටි උන්වහන්සේ තම සිත තුළ පැන නැඟුණු ගැටලුවක් බුදුරදුන්ට මෙසේ ඉදිරිපත් කළහ. භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, පෙර ශික්ෂාපද ඉතා අඩු ප්‍රමාණයක් පණවා තිබුණු සමයෙහි බොහෝ දෙනා රහත් වූහ. දැන් ඉතා වැඩි ප්‍රමාණයක් ශික්ෂාපද ඇතත් රහත් වන්නේ ඉතා අඩු ප්‍රමාණයකි. මෙයට හේතුව කුමක්ද යන්න උන්වහන්සේගේ ප්‍රශ්නයයි.

බුදුරජාණන් වහන්සේ කිසිදු පැකිළීමකින් තොරව එයට ලබාදුන් ඍජු පිළිතුර මෙසේ ය.

කාශ්‍යපය, සත්ත්වයන් පිරිහෙන කල්හි, සද්ධර්මය අතුරුදන් වන කාලයෙහි ලෝකයේ නීති රීති, ශික්ෂාපද බෙහෝ ඇතිවේ. එවිට ඉතා ස්වල්පයක් භික්ෂූහු රහත් වෙති. යම්තාක් ලෝකයේ සද්ධර්ම ප්‍රතිරූපකයන් හෙවත් පෙනුමෙන් සද්ධර්මය වැන්නක් නූපදී ද ඒතාක් සද්ධර්මය විනාශ නොවේ. නිදසුනක් කිවහොත් පෙනුමෙන් රත්රන් වැනි දෙයක් ලෝකයේ නූපදීද, ඒතාක් ලෝකයේ රත්රන් අතුරුදන් නොවේ. එසේම පෙනුමෙන් රත්රන් වැනි දේ ලෝකයේ පහළ වේ ද, එකලට රත්රන් අතුරුදන් වේ. සද්ධර්මයට සිදුවන්නේ ද ඊට සමාන දෙයකි. එනම් සද්ධර්මය නොවන දේ සද්ධර්මය මෙන් ප්‍රකට කරන්නන් නිසා සද්ධර්මය වැනසීමට පටන් ගනී.



කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය

**මකුරුප්පේ ධම්මානන්ද හිමි**

මෙම කරුණ පැහැදිලි කළ බුදුන් වහන්සේ එය තවදුරටත් පැහැදිලි කරමින් වදාළේ ලෝකයේ මහා පර්වත ගස්, ගල් ආදී ඝන වස්තූන්ට සද්ධර්මයට හානියක් කළ නො හැකි බව ය. මහා ගංවතුර, දියසුළි ආදියට නැතහොත් ආපෝ ධාතුවට එබඳු වැනසීමක් කළ නො හැකි ය. ගින්නක් හෝ නියඟයක් වැනි තේජෝ ධාතුව ආශ්‍රිත කිසිවක් සද්ධර්මය නො වනසයි. වායෝ ධාතුව ආශ්‍රිත සුළි සුළං ආදී කිසිවකට ද එබඳු හානියක් කළ නො හැකි ය. එහෙත් මේ ශාසනයෙහි ම සද්ධර්මය අන්තර්ධාන කරන්නා වූ මෝඩ හිස් පුරුෂයෝ උපදිති. මෙම සූත්‍රයේ දක්වන පරිදි සද්ධර්මයට සිදුවන විශාලම අපරාධය වන්නේ මිනිස් ප්‍රජාවගෙන් ය.

සද්ධර්මයේ පැවැත්ම පිළිබඳ ව සාකච්ඡා කරන ඇතමුන් බණ භාවනා කිරීම ම ශාසන සුරක්ෂිතතාවට පිළියම යැයි පවසන අවස්ථා ඇත. හැදෑරීම්, වනපොත් කිරීම ආදී අනෙකුත් දේ සම්බන්ධයෙන් විමති පවසති. එහෙත් මෙම සූත්‍රය දක්වන පරිදි පර්යාප්ති (ඉගෙනීම) හා ප්‍රතිපත්ති බහුලවීම නිසා සද්ධර්මයට හානියක් නොවේ. නැවක බඩු භාණ්ඩ වැඩි වීමෙන් ජලයේ ගිලී යාමක් සිදු නොවේ. එමෙන් පර්යාප්ති ප්‍රතිපත්ති බහුල වීමෙන් සද්ධර්මය නො වැනසේ. මේ නිසා තථාගත දේශිත ශ්‍රී සද්ධර්මය ලෝක සත්ත්වයාගේ අනන්ත අප්‍රමාණ වූ යහපත සඳහා රැකිය යුතු හෙයින් ආත්මීය වශයෙන් අප විසින් කළ යුත්තේ කුමක් දැයි සිතීම අපගේ වගකීමක් බව තේරුම් ගත යුතු ය.

ඉහත කී කරුණු අනුව තමා සද්ධර්ම ප්‍රතිරූපකයෙක් දැයි ඔබට තීරණය කළ හැකි ද?. ගිහි වුවත් පැවිදි වුවත්, අප සැම කෙනෙකු ම ඍජුව හෝ වක්‍රව මෙම පාප කර්මයට සම්බන්ධ වීමේ හැකියාවක් පවතී. ඔබ තුළ අව්‍යාජත්වය නොමැති නම් ඒ වෙනුවට ඇත්තේ ව්‍යාජ බව නම් ඔබ සද්ධර්මය වනසන සද්ධර්ම ප්‍රතිරූපකයෙකි. ඔබට ඔබ ගැන ම නිගමනයකට පැමිණීම සඳහා සද්ධර්ම ප්‍රතිරූපකයෙකුගේ ලක්ෂණ සූත්‍රය දක්වන පරිදිම හකුළා දැක්විය හැකි ය. ඒ අනුව කෙනෙකුට ක්‍රම පහකින් තථාගත ශ්‍රී සද්ධර්මය වැනසිය හැකි ය. සද්ධර්මය වැනසීමට උත්සාහ කරන පුද්ගලයන් ගැන පසෙකලා එය සුරැකීමට උපස්තම්භක වන ක්‍රම පිළිබඳ ව පමණක් මෙහි ලා දක්වනු ලැබේ.

ඉන් පළමුවැන්න භික්ෂු – භික්ෂුණී, උපාසක – උපාසිකා වශයෙන් අප ශාස්තෘන් වහන්සේ කෙරෙහි ඉමහත් ගෞරව සම්මාන සහිතව, යටහත් පහත් පැවතුම් ඇතිව වාසය කිරීමයි. යමෙක් එසේ නො කරන්නේ නම් ඔහු සද්ධර්ම ප්‍රතිරූපකයෙකි. දෙවැන්න ධර්මය කෙරෙහි ගරු බුහුමන් හා යටහත් පහත් පවතුම් ඇතිව එය පිළිපැදීමයි. යමෙක් එසේ නො කරන්නේ නම් ඔහු ද සද්ධර්ම ප්‍රතිරූපකයෙකි.

තෙවැන්න සංඝරත්නය කෙරෙහි ගරු බුහුමන් හා යටහත් පහත් පැවතුම් දක්වමින් ජීවත් වීමයි. ඊට ප්‍රතිපක්ෂ ව යමෙක් ක්‍රියා කරයි නම් ඔහු ද සද්ධර්මය වනසන අයෙකි. සිවුවැන්න වන්නේ ශික්ෂාපද කෙරෙහි ගරු බුහුමන් දක්වමින් ඒවා අනුව පැවතීමයි. ඒවාට දෙස් නගමින් හා කඩ කරමින් යමෙක් ජීවත්වීමට උත්සාහ කෙරේ නම් ඔහු ද සද්ධර්මය වනසන්නා වූ පුද්ගලයෙක් වේ. පස්වැනි කරුණ වන්නේ සමාධිය කෙරෙහි ගෞරව සහිත ව, යටහත් පහත් පැවතුම් ඇති ව ආධ්‍යාත්මය දියුණු කිරීමයි. එබඳු සමාධියක් කෙරෙහි ගරු බුහුමන් රහිත වික්ෂිප්ත මනසින් සසුන තුළ යමෙක් හැසිරේ නම් ඔහු ද තථාගත ශ්‍රී සද්ධර්මයට හානි කරන්නා වූ සද්ධර්ම ප්‍රතිරූපකයෙක් ම වේ.

සසරදිගු ගමනක නිරත ව අප්‍රතිහත ධෛර්යකින් පාරමී ධර්මයන් පුරා අවබෝධ කොට ගත් දහමේ පැවැත්ම ගැන තථාගත බුදුපියාණන් වහන්සේ ගැඹුරින් සිතන්නට ඇත. එසේම එහි පැවැත්ම හා පැවැත්මට හානිකර දේ පිළිබඳවත් විනිවිද දකින්නට ඇත. සද්ධර්මයට හානියක් ගස් ගල්, පර්වත, ගිනි කඳු, සාගර, ගංගා, වා සුළි ආදි ස්වභාව ධර්මයේ කිසිදු වස්තුවක් ස්ථිරව ම සිදු නොකරන බව වදාළ බුදුන් වහන්සේ එය සිදු වන්නේ මිනිසුන් අතින් ම බව පැවසීම අතිශය බැරෑරුම් ප්‍රකාශයකි. එක් පසෙකින් එය නිරාගත වීමට තරම් බලවත් පාප කර්මයක් වන අතර, අනෙක් පසින් මනුෂ්‍ය ස්වභාවයේ පහත් බව හා පිළිකුල් සහගත බව පිළිබඳ අනාවරණයකි.

එබැවින් භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් වශයෙන් අප ආධ්‍යාත්මයෙන් විවෘත විය යුතු ය. සීලය වෙනුවට බොරු සීලයත්, සමාධිය වෙනුවට ව්‍යාජ සමාධියත්, සම්‍යක් ප්‍රඥව වෙනුවට භෞතිකත්වය වැළඳගත් මිථ්‍යා ප්‍රඥවත් ප්‍රකට කරමින් ශාසනයට හානි නො කළ යුතු ය. සද්ධම්ම පතිරූපක සූත්‍රයේ දැක්වූ ඉහත කරුණු තේරුම් ගැනීමෙන් ඔබටත් සද්ධර්මයේ සැබෑ හිමි කරුවෙකු වීමේ භාග්‍යය උදාකර ගත හැකි ය.

# බෝසත්වරු බණ කතා කියද්දී වන දෙවඟනො මල්වල ලියතී



'මොනවද අම්මේ අකුරු ජාතියක් මල් පෙතිවල කවුදෝ ලියලා
කවුරුද අම්මේ මේවා ලියන්නේ පාට පාට ඉරි හැඩ ගහලා

පුතා දන්නෙ නෑ හඳ ඇති කාලෙට වනන්තරේ හරි වැඩ කෙරෙතී
බෝසත්වරු බණ කතා කියද්දී වන දෙවඟනො මල්වල ලියතී

මේ වගෙ ලස්සන පාට අපට නෑ කොතැනින් මේවා ගෙන එන්නේ
කොහොමද අම්මේ මේව කෙරෙන්නේ මට නෑ මොකවත්
තේරෙන්නේ

ඉර පායන කොට ඉර බැස යන කොට පාට වලාකුළු ඇත අහසේ
ඒවායින් මේ මල් පැහැ ගන්වයි ඒව කෙරෙන්නේ හොර රහසේ

අම්මෙ අම්මෙ අර පුංචි කුරුල්ලෝ කිචි බිචි ගා මොනවද කියතී
උන් දන්නව ඇති මේ මල්වල ඇති පුංචි අකුරු නිතරම බලතී

ඔව් මගෙ සුකිරි පුංචි පුතේ ඔව් කුරුලු ගීතවල රස මතුවේ
එක එක තාලෙට කියන කියන ගී මල් කොළවල තව තව ලියවේ

බිම බැලුවත් මල් උඩ බැලුවත් මල් පුංචි කුරුල්ලන් ඉගිලෙනවා
සැමදාම ඇයි මෙහෙම ම නැත්තේ මල් ද කුරුල්ලන් කොහි යනවා

බුදු හාමුදුරුවො ඉපදුණු කාලෙට කවදත් ඔහොමයි පුතුනි මගේ
මිනිසුන් වාගෙම සත්තුන් වාගෙම ගහ කොළවලටත් සතුට දැනේ

අම්මේ අර අපි සාදු කියන කොට බුදු හාමුදුරුවො මල් දැකලා
දුටුවද ටික ටික හිනැහෙන ලස්සන ඉස්සර කිව් බණ මතක් වෙලා'

පද රචනය -
**ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ**

ගායනය -
**කිංස්ලි ජයසේකර**
**ප්‍රිසිලා ඕපාත**

**ගහක් යට සෙවණෙහි සිටින ඔබට, ඒ ගස විසින් නිහඬව කුමක් හෝ දෙයක් පවසනු ලබයි. 'මා ඔබට සෙවණ සදමි' වරෙක ගිනිකූටක අව්වෙන් ද වරෙක මොර සූරන වැස්සෙන් ද දැඩි පීඩාවට පත්වෙමි.**

එසේ වුව ද ඔබ කෙරෙහි මගේ තුන්හිතකවත් අමනාපයක් නැත. නැවතත් මම ඔබට සෙවණ සදමි. මා ඵල දරන විට මිනිසුන් ගල්, පොලු ගසා, අතු කඩා බිඳ දමා ඒ ඵලයන් කඩා ගැනීමට යුහුසුළු වේ. එසේ වුව ද ඔබ කෙරෙහි අහිතක් අමනාපයක් මා තුළ නැත. ඊළඟ වතාවටත් මෙලෙස ම මම ඔබට ඵල ලබා දීමට උත්සහ ගනිමි. එයට හේතුව වන්නේ මා උපන්නේ අනුන්ට සේවය කිරීම සඳහා ය." "පරෝපකාරාය පලන්ති වෘක්ෂාඃ" යන ආප්ත වදනෙහි අර්ථය ද එයයි. එසේ සේවය කිරීමට යන මාවත රෝසමල් අතුරන ලද සුව පහසු සුන්දර එකක් නොවේ. එය අතිශයින් ම කර්කෂ රළු ගොරෝසු තින්දා අපහාසවලින් පිරුණ අමිහිරි මාවතකි. ඒ සියල්ල දරාගෙන මැදහත් සිතින් ලෝකයට සේවය කරන ලෙස මේ ගස අපට නිහඬව පාඩමක් කියා දෙයි.

කොළඹ යුගයේ කවීහු පරිසරය යනු ළමා ලෝකයේ සහෘදයින් බව ධ්වනිත කිරීමට ස්වකීය නිර්මාණ උපයෝගී කොට ගත්හ. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ වෙසක් මිහිර පද්‍ය පන්තිය, මව සහ දරුවෙකු අතර ඇති වුණ සංවාදයක ස්වරූපයෙන් ඉදිරිපත් කොට ඇත. බටහිර දාර්ශනිකයෙක් වරෙක මෙසේ සඳහන් කරයි. "මිනිසුන් දහසක් එකතු වී ගොඩනැගිල්ලක් සෑදුව ද එය නිවහනක් කළ හැක්කේ එක් ගැහැනියකට පමණය." එම ගැහැනිය වෙන කවුරුන්වත් නොව ඒ නිවහන තුළ ජීවත්වන මෑණියන් ය.

චන්ද්‍රරත්න මානවසිංහ එම පද්‍ය පන්තියෙන් ගෙයක් නිවහනක් කරන මවකගේ මාතෘත්වයේ අසිරිමත් බව ඉදිරිපත් කරයි. එයින් ප්‍රධානම ලක්ෂණයක් වන්නේ, සිය දරුවන්ට පරිසරය පිළිබඳ ආදරණීය හැඟීම් ජනිත කරවීමයි.

මෙහිදී දරුවා සිය මවගෙන් විමසා සිටින්නේ මල් පෙතිවල කවුදෝ ලියා ඇති අකුරු ජාතිය මොනවා ද? යන්නයි. එහි දී සිය මව පවසන්නේ බෝසත්වරු බණ කතා පවසන විට වනයේ ජීවත් වන දෙව්ලියන් එම බණ කතා මල් පෙතිවල ලියා ඇති බවයි. එහි දී කවියා සිය මවගේ මුවින් දරුවාට තුරුලතාවල පිපී ඇති සුවඳවත් පුෂ්පයන් බණ කතා ලියවුණ බණ පොත් බව සඳහන් කරයි. මල් පෙතිවල බණ කතා ලියා නැති බව අපි දනිමු. එසේ වුව ද එයින් දරුවාට පරිසරය පිළිබඳ අසීමිත ගෞරවයක් ඇති කරවයි. එවිට දරුවා කිසි දවසක ගහකොළ විනාශ කිරීම වෙනුවට, ඒවා දිවිහිමියෙන් ආරක්ෂා කිරීමට පෙලඹෙයි. ඒවාට අසීමිත ආදරය දක්වයි. දරුවා අසන ලද ප්‍රශ්නවලට තම මව ජීවිතය



පෑලියගොඩ විද්‍යාලංකාර පිරුවෙන්හි ආචාර්ය
කැලණිය විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ අංශාධිපති
**ආචාර්ය මල්වානේ චන්දරතන හිමි**

නම් සරසවියෙන් ලබා ගත් අව්‍යාජ දැනුම මුල්කොට ගෙන දෙන ලද පිළිතුරු දරුවාට සමාජ යථාර්තය මැනවින් තේරුම් ගැනීමට ඉඩ හරියි.

"අම්මෙ අම්මෙ අර පුංචි කුරුල්ලෝ කිචි බිචි ගා මොනවද කියතී

උන් දන්නව ඇති මේ මල්වල ඇතිපුංචි අකුරු නිතරම බලතී

ඔව් මගෙ සුකිරි පුංචි පුතේ ඔව් කුරුලු ගීතවල රස මතුවේ

එක එක තාලෙට කියන කියන ගී මල් කොළවල තව තව ලියවේ"

මෙහි දී කවියා පවසන්නේ වන සතුන්ට, කුරුල්ලන්ට, තුරුලතාදියට එහි පිපුණු මල්වලට උනුන්ගේ වටිනාකම් තේරුම් ගැනීමට හැකියාවක් තිබේ නම් දියුණු මනසක් ඇති මිනිසුන්ට ඒ පිළිබඳ ව සිතීමට නොහැකි වන්නේ මන් ද? යන්නයි. එයින් මව සිය දරුවාට නිවහනේදී ඒ අසිරිමත් පරිසරය පිළිබඳ සදාදරණීය හැඟීම් ජනිත කරවයි.

'බිම බැලුවත් මල් උඩ බැලුවත් මල් පුංචි කුරුල්ලන් ඉගිලෙනවා

සැමදාම ඇයි මෙහෙමම නැත්තේ මල් ද කුරුල්ලන් කොහි යනවා'

වෙසක් මාසයේදී අවට පරිසරය දෙසත් බැලූ බැලූ සැම දිසාවකම ලස්සන මල් පිපී එහි අසිරිය විඳිමින් පුංචි කුරුල්ලන් ඉගිලෙන හැටි සැමදාම දක්නට නැත්තේ ඇයි දැයි දරුවා මවගෙන් විමසයි. එවිට මව දරුවාට අසිරිමත් සෞන්දර්ය අප වටා පරිසරය තුළ නිර්මාණය වීමට හේතුව සඳහන් කරයි. බුදු හාමුදුරුවෝ ලොව පහළ වන කාලයට මුළු මහත් විශ්වය ම සොම්නසට පත්වේ. බුදු හාමුදුරුවෝ යනු සත්‍යයේත්, ධර්මයේත් ප්‍රතිමූර්තියයි. සත්‍යගරුක බවට ත් ධාර්මිකත්වයට ත් මුළු මහත් ලෝකයම අවනත වන බව මවගේ මුවින් පිටවන වදන්වලින් දරුවා මැනවින් තේරුම් ගනියි. මව දරුවාට අවබෝධ කරවන්නේ යහපත් ධාර්මික දිවි පෙවෙතක් ගත කරන්නේ නම් ඔහු නමට මල් පිපී සුවඳ හමන බවත්, කුරුල්ලන් ගී ගයමින් අපමණ මිහිරියාවෙන් පියාසර කරන බවත්, මල් සුවඳ රැගෙන සිසිල් සුළං ලොව පුරා ම හමා යන බවත් ය.

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ වෙසක් මිහිර පද්‍ය පන්තියෙන් ළමා ලෝකයේ මනස සුවපත් කිරීමට අවශ්‍ය සදුපදේශය සම්පාදනය කිරීමට ගත් උත්සාහය අතිශයෙන් ම ප්‍රශස්ත ය. සුවබර ජීවිතයකට මිල මුදල් මෙන්ම භෞතික සම්පත්වල සම්බන්ධයක් තිබෙන නමුත් කවියා විසින් ධ්වනිත කරනු ලබන සමුදයාර්ථය ඊට වෙනස් ය. මිල මුදල් හා භෞතික සම්පත් පමණක් තිබීම ප්‍රමාණවත් නොවේ. එකිනෙකාට ආදරය කිරීම; ගෞරව දැක්වීම; මානව හිතවාදී ව ජීවත්වීම; සුවබර ජීවිතයක සැඟවුණ අර්ථයන් ය. කුඩා අතු පැලක් වුව එය මහා මන්දිරයක් කර ගත හැකි වන්නේ එවිට ය. තමා අවට පරිසරයටත් අවට සතා සිවුපාවටත් තුරුලතාදියටත් හිතවත් ව ළෙන්ගතුව කටයුතු කරන්නේ නම් ඔවුන්ගේ නිවහන මහා මන්දිරයකි. එයින් මිනිසා කරුණා මෛත්‍රිය පෙරදැරි ව ජීවත්වීමට හුරුපුරුදු වෙයි.



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද
පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ
මෛත්‍රීමූර්ති මහා නා හිමි**

# පරිසරයට මිතුරු වීම

**පරිසරයේ ඇති සුන්දරත්වය චිත්තාකර්ෂණීය ව අගයමින් ඒ තුළින් නිරාමිෂ සුන්දරත්වයක් වින්දනය කළ උතුම් ම ශාස්තෘවරයාණන් වහන්සේ බුදුරජාණන් වහන්සේ බව ත්‍රිපිටක ධර්මය තුළින් පැහැදිලි ව පෙන්වා දී ඇත.**

> ගෝසිංහ සාලවන උද්‍යානය සඳ රැසින් නැහැ වෙයි. ඒ නිසා අතිශයින් දැකුම්කළු ය. සාල වෘක්ෂයේ සෑම අතු කිනිත්තක් ම මුල සිට අග දක්වා මලින් සැරසී ඇත. සුපිපි පුෂ්පයන්ගේ සුවඳ දිව්‍ය සුවඳ පරදවයි. සිසිල් සඳ රැස් දස අතින් ම ගලා බසී.

ගසක් යට ඉපිද, ගසක් යට බුදුව, ගසක් යට පිරිනිවන් පෑ බුදුරජාණන් වහන්සේගේ චරිතය විග්‍රහ කර බැලීමේ දී පෙනී යන්නේ බුදු දහම තරම් පරිසරයත්, සොබා දහමත් එහි සෞන්දර්යයත් සමග සම්බන්ධ වූ අන් කිසිදු දර්ශනයක් මෙතෙක් ලොව පහළ වී නැති බවයි. අප කතා කරන පරිසරය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දක්වන්නට පුළුවන. ජීව පරිසරය හා අජීව පරිසරය යනුවෙනි.

මිනිසා, සත්වයා හා වෘක්ෂලතාවන් ඇතුළත් වන්නේ ජීව පරිසරයටයි. වායුව, ජලය, හිරුඑළිය, හා පොළව යන මේවා අජීව පරිසරය ට ඇතුළත් වේ. ජීව හා අජීව යන මේ පරිසර දෙක අන්‍යොන්‍ය බලපෑමකින් යුක්ත ය. ජීවී පරිසරය, අජීවී පරිසරයේ උපකාරයෙන් පවතී. අජීව පරිසරය ජීව පරිසරයේ බලපෑමෙන් හා උපකාරයෙන් පවතී.

ඇසතු බෝරුක මුල ගෞතම බුදුරදුහු බුද්ධත්වයට පත්වූහ. සමහර විද්වතුන් පෙන්වා දෙන ආකාරයට බෝගස පාරිසරික වශයෙන් මෙන් ම, වෛද්‍ය විද්‍යාත්මකව ද වටිනා වෘක්ෂයක් බව පෙන්වා දී ඇත. උද්භිද විද්‍යාවට අනුව 'පීකස් රිලිජියෝසා' යන නාමයෙන් බෝගස හඳුන්වති.බෝගසකට බෙදුනු අතු විශාල ප්‍රමාණයක් ඇත. ඒ අනුව විශාල පත්‍ර සංඛ්‍යාවක් ද ඇත. නටුව දිගය, පත්‍ර පහළට එල්ලෙයි. මෙයින් වායුගෝලයට ජල වාෂ්ප අති විශාල ප්‍රමාණයක් මුදා හරියි. සුළඟට පත්‍ර දෙපසට වැනෙයි. මේ නිසාම බෝගස යටත්, අවටත් සිසිල් ය. මේ නිසා ම බෝගස අවට පරිසරයේ වාතය පිරිසුදු ය. බෝගස මුල භාවනා කරන අයට වෙහෙසක් නොදැනේ. පත්‍රවලින් ලැබෙන සිලි සිලි නාදය ගතට මෙන්ම සිතට ද සුවයකි. බෝගසේ මුල ඉදිරියට නෙරා ඇත. කඳ පළල් ය. මේ නිසා ම සුවපහසු අසුනක් සාදගත හැකි ය. පරිසරයට ආදරය කරන අය අතරින් ප්‍රමුඛත්වය හිමිවන්නේ බුදුරජාණන් වහන්සේට ය. ජීවී අජීවී සෑම දෙනාට ම වැදගත්වන පරිසරය ආරක්ෂා කර ගැනීම මිනිසා සතු වගකීමකි. අප පරිසරයට ආදරය කළ යුතු ය.

බුද්ධත්වය සඳහා තෝරා ගන්නා ලද නේරංජනා නදී තීරය ගැන අරියපරියේසන සූත්‍රයේ දී බුදුරදුහු මෙසේ සඳහන් කරති. "මහණෙනි, මම කුසලය කුමක්දැයි සොයන සුළු වූයෙමි. මගධ දනව්වෙහි පිළිවෙලින් චාරිකාවේ යෙදුණේ උරුවේලයෙහි, සේනානි ගම වෙත පැමිණියෙමි. එහි වූ සිත්කලු භූමි භාගය ද, සිත පහදවන ලැහැබ ද, සුදුවැලිතලා මැදින් නිවී සැනසිල්ලේ ගලා බස්නා මහා තොටුපලින් යුත් මනරම් නේරංජනා නදිය ද, එසේ ම හාත්පස වූ ගොදුරු ගම ද දුටුයෙමි. ඒ දුටු මට මේ අදහස පහළ විය.

මේ භූමි භාගය ඉතා රමණීයයි. වන ලැහැබ ඉතාම ප්‍රසාද ජනකයි. මනා කොට ඇති සුදු වැලිතලා මැදින් ගලන නදිය ද සිත් සනසවන සුළු වෙයි. හාත්පස සොඳුරු ගම ද වෙයි. පධන් වීර්ය වඩන කුල පුත්‍රයෙකු හට ඒ සඳහා මෙයට වඩා සුදුසු තවත් තැනක් නැතැයි මට සිත් විය. ලොවට වැඩදයී දැක්මක් සොයා යන්නාට යහපත් පරිසරයක අවශ්‍යතාවය මෙයින් පෙන්නුම් කරනු ඇත.

දිනක් සඳ රැසින් බබළන රාත්‍රියක බුදුරදුහු මහා සංඝරත්නය පිරිවරා සල් වනයෙහි සිටින අතරතුර සැරියුත් මහරහතන් වහන්සේ පරිසරයේ ඇති සුන්දරත්වය මෙසේ වර්ණනා කර ඇත. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වසන මේ ගෝසිංහ සාලවන උද්‍යානය සඳ රැසින් නැහැ වෙයි. ඒ නිසා අතිශයින් දැකුම්කළු ය. සාල වෘක්ෂයේ සෑම අතු කිනිත්තක් ම මුල සිට අග දක්වා මලින් සැරසී ඇත. සුපිපි පුෂ්පයන්ගේ සුවඳ දිව්‍ය සුවඳ පරදවයි. සිසිල් සඳ රැස් දස අතින් ම ගලා බසී. මේ නිසා මුළු සාල වනය ම රමණීයත්වයට පත්ව ඇත. සැරියුත් හිමියන්ගේ මේ සුන්දර පරිසර වර්ණාව බුදුරදුහු ද අගය කළ හ.

දිනක් මගධ දේශයේ චාරිකාවක යෙදෙන අවස්ථාවක වෙල් යායක ඇළවේලි සකස්කර ඇති ආකාරය දුටු බුදුරදුහු ආනන්ද හිමියන් අමතා කුඹුරේ නියර සකස් කර ඇති ආකාරයට කඩකපා සිවුර සකස් කර ගත යුතු බව පෙන්වා දී ඇත.

පරිසරය ගැන කතා කිරීමේ දී තුරුලතාවල, ජලයෙහි පිරිසුදු වාතයෙහි ආරක්ෂාව තහවුරු වන ලෙස කරුණු පෙන්නුම් කිරීම පමණක් නොව උස්හඬින් කතා කරන, අන්‍යයන්ට කරදරයක් වන අයුරින් ප්‍රලාප දොඩවන, අයට විරුද්ධ ව ක්‍රියාත්මක වූ අවස්ථා ද බුද්ධ චරිතය තුළින් දැක ගත හැකි ය. මෙයින් පෙන්නුම් කරන්නේ ශබ්ද දූෂණය පවා වළක්වා ගැනීමට කටයුතු කර ඇති ආකාරයයි. එක් අවස්ථාවක අජාසත් රජතුමා බුදුරදුන් මුණගැසීමට ජීවක අඹ උයනට පැමිණ ඇත. බුදුරදුන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේ එක්දහස් දෙසිය පමණක් වැඩ සිටින මෙබඳු ස්ථානයක ඇති නිහඬතාවය එය යටත් පිරිසෙයින් කිවිසුම් හඬක් වත් නොමැති නිසා රජු බියට පත්විය. පසුව උයන තුළට ගිය රජුට බුදුරදුන් ප්‍රමුඛ එක්දහස් දෙසිය පණහක් භික්ෂූන්ගේ පැවැත්මත් නිහඬතාවයත් දුටු පමණින් ඇති වූයේ පුදුම සතුටකි. ඝෝෂාකාරී ලෝකයාට බුදුරදුන් ලබා දුන් මෙම නිහඬ පණිවිඩය මොනතරම් වැදගත් ද? ළමුන් පිරිසකගේ හිරිහැරයට ලක්ව සිටි ගැරඬියකු මුදවා ගැනීමට කටයුතු කිරීමත්, භද්‍රවතිනා ඇතින්නට කලින් පුරුදු ආකාරයට ම අවශ්‍ය උපස්ථාන ලබාදීමට කටයුතු සැලැස්වීම තුළින් වන සතුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අප වෙත ලබා දුන් ආදර්ශය මොන තරම් වැදගත් ද?

සරාගී පුද්ගලයෝ බොහෝවිට පරිසරයෙහි ඇති සුන්දරත්වය නොදනිති. එම පරිසරයෙහි වටිනාකම නොදන්නා ඔවුහු එම ප්‍රසාදජනක පරිසරය විනාශ කර දමති. එක් අවස්ථාවක හුදෙකලාව වනයෙහි වැඩ සිටින බුදුරදුන් වෙත පැමිණි දෙවියෙක් මහ වනයෙහි පක්ෂීන්ගෙන් නැගෙන මහා හඬ තමන්ට බිය උපදවන බව බුදුරදුන්ට ප්‍රකාශ කරයි. නමුත් බුදුරදුහු ඔහුට ප්‍රකාශ කළේ මෙම පරිසරය තමන් වහන්සේට ඉතා සිත්කළු සුන්දර පරිසරයක් බවයි. බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වන ආකාරයට යම් ගසක සෙවණෙහි හිඳ ගත්තේ ද, නිදගත්තේ ද ඒ ගසෙහි අත්තක් වත් කැඩුවොත් ඔහු මිත්‍ර ද්‍රෝහියෙකි. පව්කාරයෙකි.

ගස් කොළන් මිනිසාගේ පැවැත්මට අත්‍යවශ්‍යය. ඒවා නැති වූ භූමිය නිසරු කාන්තාරයකි. ඒ අනුව අවශ්‍ය වැසි ජලය නොමැතිවීමෙන් දිය උල්පත් සිඳී ගොස් මිනිසාට අවශ්‍ය භෝග වර්ග නොවැඩෙන පරිසරයක් ගොඩනැගෙනු ඇත.

මේ සියල්ල මැනවින් තේරුම් ගත් බුදුරදුහු තුරුලිය, වනාන්තර හා ඇළ දොළ, ගංගා ආදියෙහි සුන්දරත්වය ආරක්ෂා කිරීමට උපදෙස් දෙමින් කටයුතු කළා පමණක් නොව පාරිසරික වටිනාකමින් යුත් ස්ථානවල නිරාමිෂ සුන්දරත්වයක් විඳිමින් වැඩ සිටිය බව මුළු බුද්ධ චරිතය ම අපට පෙන්නුම් කර ඇත. පරිසරය රැක ගනිමු. ඒ සුන්දර පරිසරය අප හැමට සැනසිල්ල උදාකරනු ඒකාන්ත ය.



# මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ

**මහා කාශ්‍යප මහා රහතන් වහනසේ වනාහී අප මහා ශාන්තිනායක ශාක්‍යමුණි ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ධූතාංගධාරී භික්ෂූන් අතුරින් අගතැන්පත් මහ තෙරුන් වහන්සේ යි.**

බුදුරදුන්ගේ තෘතිය මහා ශ්‍රාවකයන් වහන්සේ වූ මුන් වහන්සේට ගෞතම බුදු සසුනේ ධර්මාධිකාරි තනතුරද හිමි වී තිබුණි. “අනුබුද්ධ” යන ගෞරව නාමයෙන් ද මුන් වහන්සේ හඳුන්වනු ලැබේ.

බුදුරජාණන් වහන්සේ විසින් පරිභෝග කරන ලද, දිරා ගිය ඒ මහා පාංශුකූල චීවරය පෙරවීමට තරම් මහා භාග්‍යයක් ලැබුවේ මහා කාශ්‍යප මහ තෙරුන් වහන්සේ යි. එ පමණක් නොව බුදුසිරිපා හිසමත තබා ගැනීමේ දුර්ලභ අවස්ථාව ද මහා කාශ්‍යප මහ තෙරුන් වහන්සේට හිමි විය.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරයේ දක්නට ඇති දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් මහා පුරුෂ ලක්ෂණ සතක් මුන් වහන්සේගේ සිරුරේ ද විය. මේ නිසා මහා කාශ්‍යප හිමියන්ගේ රූපය යම් තරමකට බුදුරදුන්ගේ රූපයට සමාන විය. උන්වහන්සේ බුදුරදුන්ට වඩා අඟල් සතරක් උසින් අඩු බව ධර්ම ග්‍රන්ථයන්හි සඳහන් වේ.

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ථෙරවාදී බෞද්ධ ලෝකයා අතර පමණක් නොව, මහායාන බෞද්ධ ලෝකයා අතරද අතිශයින් ම ප්‍රකට මහ තෙරුන් වහන්සේ නමකි. මහායාන බෞද්ධයෝ මුන් වහන්සේට මහත් සේ ගරු සත්කාර දක්වති. ඇතැම් මහායාන විහාරවල මහා කාශ්‍යප මහ තෙරුන්ගේ සිතුවම් මෙන් ම ප්‍රතිමා ද දක්නට ඇත. මධ්‍යාසියාවෙන් මහා කාශ්‍යප මහ තෙරුන්ගේ පැරැණි සිතුවම් කිහිපයක් ම හමු වී ඇත. මෙසේ ගෞතම බුදුසසුන තුළ සුවිශේෂී වූ ස්ථානයක වැඩ සිටින අනුබුදු මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ පූර්වාපර චරිත කථාව මෙතැන් සිට ඉතා සැකෙවින් දක්වනු ලැබේ.

## පිප්ඵලී කුමරු ගිහිගෙය කළකිරීම

මෙයින් කල්ප ලක්ෂයකට පෙර සියලු ධර්මයන්හි පාරප්‍රාප්ත නරශ්‍රේෂ්ඨ පදුමුත්තර සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. ඒ සමයෙහි මහා කාශ්‍යප මහ තෙරුන් හංසවතී නුවර එක් ධනවත් කුලයක ඉපිද ‘විදේහ’ යන නම ලැබ සුව සේ හැදී වැඩේන් වැඩිවියට පැමිණියේ ය. හෙතෙම එක් දිනක් බුදුබණ අසනු රිසියෙන් විහාරයට ගියේ ය. එදින පදුමුත්තර බුදුරදුන් සිව්වනක් පිරිස මැද වැඩ සිටිමින් නිසභ තෙරුන්ට ධූතාංගධාරී භික්ෂූන් අතුරින් අග්‍රස්ථානය ලබා දුන් සේක.

මෙය දුටු විදේහ කුලපුතු එහි පැහැදී, බුදුබණ අසා අවසානයේ දී බුදුරදුන් වෙත එළැඹ පසුද දනට බුදුපාමොක් මහ සඟ රුවනට ඇරයුම් කොට නිවසට ගොස් දනයට අවශ්‍ය සියලු දේ මැනවින් පිළියෙළ කළේ ය. පදුමුත්තර බුදුරදුන් පසුද පෙරවරුවෙහි හැඳ පෙරව පාසිවුරු ගෙන භික්ෂු සංඝයාද සමගින් විදේහ කුලපුතුගේ නිවසට වැඩම කර පණවා තිබූ අසුනෙහි වැඩ සිටියහ.

එකල්හි තථාගත තෘතීය ශ්‍රාවක, ධූතාංගධාරී භික්ෂූන් අතරින් අගතැන්පත් නිසභ තෙරණුවෝ පාත්‍රය ගෙන නුවර ගෙයක්, ගෙයක් පාසා පිඬු සිඟා වැඩම කරමින් සිටියහ. මහ තෙරුන් දුටු විදේහ කුලපුත්‍ර සතුටු වී උන්වහන්සේ වෙත දිවගොස්” ස්වාමීනි, පාත්‍රය මා අතට දුන මැනවි. මම දනය පුදන්නෙමි”යි කීය.

තෙරහු ඔහුගේ සැදැහැ සිත දැක ඔහු අතට පාත්‍රය දුන්හ. එවිට කුලපුත්‍ර

“ස්වාමීනි, බුදුරදුන් ප්‍රධාන භික්ෂු සංඝයා මගේ නිවසේ දනට වැඩම කර සිටිති. ස්වාමීනි, ඔබ වහන්සේත් වඩිනු මැනවි. ඇතුළු ගෙට ම වැඩම කර බුදුපාමොක් මහ සඟ රුවන ද සමගින් වැඩ හිඳ දන් වළඳනු මැනවැ”යි කීය.

“පින්වත, එයින් ඵලක් නැත. එය මට නො වටී. මෙසේ හොඳයි”යි තෙරහු කීහ. එවිට කුලපුතු

” ස්වාමීනි, එසේනම් මඳක් වැඩ සිටිනු මැනවැ”යි කියා වහා ගෙට ගොස් රසවත් ආහාරවලින් පාත්‍රය පුරවා තෙරුන් වෙත පැමිණ දන පාත්‍රය පුද පසඟ පිහිටුවා ම වන්දනා කළේ ය. තෙරහු පින් දී වැඩම කළහ.

එකල්හි විදේහ කුලපුතු ගෙට ගොස් බුදුරදුන් වෙත එළැඹ වැඳ

“ස්වාමීනි, නිසභ මහ තෙරුන් ඔබ වහන්සේ අප නිවසේ දනට භික්ෂු සංඝයාද සමඟින් වැඩම කර සිටින බව දැන දැනත් නිවසට වැඩ ම නොකර එළිමහනේ ම හිඳිමින් දන් පිළිගෙන වැඩම කළහ. ස්වාමීනි, උන්වහන්සේ එසේ කළේ කුමක් නිසා ද? ස්වාමීනි, උන්වහන්සේ එසේ කළේ ඔබ වහන්සේටත් වඩා වැඩි කිසියම් ගුණ ජාතියක් තිබෙන නිසාදැ” යි ඇසීය.

බුදුවරු යමෙකුගේ ගුණයක් තිබේ නම් එය අඩු නො කොට පවසති. එබැවින් ම බුදුරදුන් යහමඟ තෙරුන්ගේ ගුණ නොයෙක් අයුරින් ප්‍රකට කළ සේක. ඒ ගුණ ඇසූ විදේහ කුලපුත්‍ර එහි පැහැදී සාදුකාරදී

“මට මේ දෙව් මිනිස් සැප සම්පත් ප්‍රාර්ථනා කිරීමෙන් ඵලක් නැත. මටත් අනාගතයේ ලොව පහළ වන බුදුවරයන් වහන්සේ නමකගේ ශාසනයක දී ධූතාංගධාරී භික්ෂූන් අතුරින් අග්‍රස්ථානය ලැබෙන්නේ නම් එය කෙ තරම් හොඳදැ” යි

සිතා එම තනතුර පතා එතැන් පටන් පුරා සත් දිනක් බුදුපාමොක් මහ සඟරුවනට මහ දන් පුද දනය අවසානයේ දී බුදු පාමුල වැඳ වැටී එම තනතුර ප්‍රාර්ථනා කළේ ය. බුදුහු ඔහුගේ පැතුම සමෘද්ධ වන්නේදැ’යි කියා බුදු ඇසින් බලන සේක් මෙයින් කල්ප ලක්ෂයක් ඇවෑමෙන් ලොව පහළ වන ගෞතම බුදුරදුන් සමයෙහි සමෘද්ධ වන බව දැක ඔහුට නියත විවරණ ලබා දුන් සේක.

එතැන් පටන් දනාදී පින්කම්හි වඩ වඩාත් නිරත වූ හෙතෙම බොහෝ පින් කොට මරණින් මතු සුගතිගාමී විය. මෙසේ දෙව් මිනිස් දෙගතියෙහි උපත ලබමින් බොහෝ කාලයක් භවයෙහි සැරිසැරී හෙතෙම ගෞතම බුදුරදුන් ලොව පහළ වන සමයෙහි බඹ ලොවින් චුතව මගධ රට මහාතීර්ථ බමුණු ගමේ කෝසියගොත්ත මහා බමුණාට දාව සුමන දේවී මහා බැමිණියගේ කුස පිළිසිඳ ගෙන නිසි කල්හි මව්කුසින් බිහි විය. මව්පියෝ ඔහුට පිප්ඵලී යන නම තැබූහ.

රාජපූජිත බ්‍රාහ්මණ මහාසාර කුලයක උපන් බැවින් පිප්ඵලී කුමරු සුවසේ හැදී වැඩෙමින් වැඩිවියට පැමිණ වේදය උගෙන එහි පාරප්‍රාප්ත විය. පසුව ඔහු දෙමව්පියන්ගේ බලවත් ඉල්ලීම නිසා මදුරට සාගල නුවර කපිල බමුණාගේ හා සුචිමතී බැමිණියගේ දියණිය වූ භද්දකාපිලානී නමැති සුරූපී කුමරිය හා විවාහ ගිවිස ගත්තේ ය. මේ දෙදෙනා විවාහ වුවත් ගිහි ජීවිතයෙහි නො ඇලී වාසය කළහ. කලක් ගත වූ පසුව ඔවුන්ගේ මව්පියෝ ආයු ගෙවී කලුරිය කළහ. එකල්හි ගිහිගෙයි කළ කිරී සිටි පිප්ඵලී කුමරු “මෙලොව යම් රහතන් වහන්සේ නමක් වැඩ සිටී නම් මගේ මේ පැවිද්ද උන්වහන්සේ උදෙසා ම වේවා” යි කියා ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි විය. මෙය දුටු භද්‍රා කුමරිය ද පැවිදි වූවාය. පසුව මේ යහ ගුණැති දෙදෙනා නිවසින් නික් ම ඉදිරියට ම ගොස් අතරමඟ දෙමං සන්ධියකදී වෙන් වී තනි තනිව ගමන් ගත්හ.

**මෙම ලිපියේ ඉතිරි කොටස ඇසළ අවඅටවක පෝද (ජූලි 12) පත්‍රයේ පළවේ.**

ගයාන් චානුක විදනපතිරණ

බුදු සරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

ඇසළ පුර පසළොස්වක 2020.07.04

## අවබෝධයෙන් තෙරුවන් සරණ යමු

බෝසතාණන් වහන්සේ කෙලෙස් මරුන් පරදා උතුම් සම්බෝධියට පැමිණ,පස්වග තවුසන් උදෙසා පළමු දම් දෙසුම පැවැත්වූ පින්බර ඇසළ පුර පසළොස්වක පොහෝ දිනය අදයි. ඒ අසිරිමත් සිරි සදහම් දෙසුම් අකාලික ය. අදත් ලෝ වැසි සුවහසක් බොදුනුවෝ ඒ සදහම් ගඟුලේ ගිලී නිවී පහන් වෙති. අනාගතයේත් එලෙස ම ය.

ඒ අතරම තවත් පිරිසක් සදහම් ආලෝකය දකිමින් ඊට පිටුපා අඳුරේ ම ගිලෙති. ලෝබ, ද්වේෂ, මෝහා දී අකුසල සිතිවිලි වලින් මඩනා ලදුව පාපයෙහි ම ගැලෙති. මෙලොව ද පිරිහී පරලොව ද පිරිහෙති. අපාගත වෙති.

මිනිසා සියලු සත්ත්වයන් අතර උසස් ය. ඒ සිතන්නට හැකියාවක් ඇති නිසා ය. ධර්මය ශ්‍රවණය කළ පමණට, පොත පතෙන් කියවා දැනුම දියුණු කරගත් පමණට අපගේ සිත් අපිරිසුදු කරන කෙලෙස් මළ බැහැර කළ නොහැකි ය. එසේ කළ හැකි වන්නේ ධර්මය ප්‍රායෝගික ජීවිතයට පුරුදු පුහුණු කිරීම තුළ ය.

අප ජීවත්වන්නේ ඉතා කෙටි කාලයකි. ඇසිපිල්ලමක් ගසා ඊළඟ ඇසිපිල්ලම ගසන මොහොතේ වුව අපගේ මරණය සිදුවිය හැකි ය. බොහෝ දෙනෙක් එය තේරුම් ගන්නා බවක් පෙනෙන්නට නැත. මරණය යහපත් වන්නේ අප සත්පුරුෂයන් වූ තරමට ය. එසේ ජීවත්වීමට ජීවිතාවබෝධය ඇවැසි ය.

ජීවිතාවබෝධය නම්, අප අසන, දකින, දැනෙන, හැඟෙන සෑම දෙයක් පිළිබඳව ම ඇති යථාර්ථය දැකීම ය. අපගේ හැසිරීම්, තමන්ටත්, අනුන්ටත් අනර්ථකාරී නො වන්නේ ඒ අවබෝධය ඇති තැන ය. අවබෝධය ඇති පුද්ගලයා අනුන්ට ඊර්ෂ්‍යා නො කරන්නේ ය. තමන් උසස් කොට අන්‍යයන් හෙළා නො දකින්නේ ය. කෝපය, මසුරුබව, වංකබව, ඔහු තුළ නැත. ඔහු පවට ලජ්ජාශීලි ය. බිය ය.

තමන්ට තමන් අවංක වීම තුළ මෙතෙක් ආ ගමන් මග විමර්ශනය කළේ නම්, ධර්මානුකූලව ජීවත් වූයේ ද, නැද්ද යන බව තමන්ට ම තේරුම් ගත හැකි ය.

අඩුම තරමේ පංචසීල ප්‍රතිපදාව හෝ ආරක්ෂා කර ගත නොහැකි නම්, ඒ පුද්ගලයා තෙරුවන් සරණ ගිය බෞද්ධයකු වන්නේ නැත. තෙරුවන් සරණ යනවා යනු බුදු ගුණ, දහම් ගුණ , සඟ ගුණ අපගේ ජීවිතයට ද ප්‍රායෝගිකව එක් කර ගැනීම ය. වචනයෙන් සරණ ගිය පමණින් බෞද්ධයකු වන්නේ නැත. බෞද්ධ සමාජය තුළ ඇතැම් විටෙක නො කටයුතු දෑ සිදුවන්නේ බෞද්ධකම වචනයට පමණක් සීමා කිරීම නිසා ය.

බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක භික්ෂූන් වහන්සේ අමතා මෙසේ දේශනා කළහ.

මහණෙනි, වැසි වර්ග හතරකි. එක් අවස්ථාවක අහස මහ හඬින් ගිගුරුම් දෙයි. එහෙත් වැසි නො වැටේ. තවත් අවස්ථාවක මද වැසි වැටේ. අහස ගුගුරන්නේ නැත, තවත් අවස්ථාවක ගිගිරුම ද, වැස්ස ද දෙකම නැත, විටෙක මහ හඬින් ගුගුරමින් මහා වැසි වසී. වැස්ස ගැන මෙසේ දේශනා කරන බුදුරජාණන් වහන්සේ වැහි වැනි ම පුද්ගලයන් සිව් වර්ගයක් සිටින බව පෙන්වා දෙයි. සමහර කෙනෙක් මෙම බොහෝ සිල්වත්වෙමි. දන් පින් කරමියි පවසයි. අන්‍යයන්ය ද එසේවන ලෙස අවවාද කරයි. වචනයට පමණක් සීමාවන එවැන්නෝ අහස ගිගිරුව ද නො වෙසිනා වැස්ස වැනි ය.

ඇතැම් කෙනෙක් නිහඬ ය. එහෙත් සිල්වත් ය. දන් පින් කරති. එවැන්නෝ අහස ගුගුරන්නේ නැතිව වැටෙන වැස්සක් වැනි ය. ඇතැම්හු දන් පින් කිරීම් නැත. බොරු කියවිලි ද නැත. හරියට ගිගිරුම ද, වැහි පොද ද නැති වැස්සක් සේ ය. එහෙත් ඇතැම් පුද්ගලයෝ ඉහළින් කතා කරති. එලෙසම සිල්වත් වෙති. දන් පින් ද කරති. ඔවුහු ගුගුරමින් වසිනා මහා ධාරානිපාත වර්ෂාවක් බඳු ය. සිල්වත් වීම හා දුසිල්වත් වීම තුළ තමන් කරගන්නා දැයෙහි ඵලය බාර ගන්නට වන්නේ තමන්ට ම ය. ඒ දැන ධර්ම මාර්ගයට පැමිණීමේ හා නොපැමිණීමේ වගකීම ද තම තමන් ම වටහා ගත යුතු ය.

### සම්බුදු සසුනේ අග්‍ර දායක

# සුදත්ත සිටුතුමා

**සුදත්ත සිටුතුමා බුදු සසුනේ අග්‍ර දායකයා ය. සැවැත් නුවර විසූ මහා ධනවතෙකු වූ එතුමා අනාථ වූ අසරණයන්ට ආහාරපානාදිය සපයා බොහෝ උදව් උපකාර කළේ ය. එම නිසා එතුමා අනාථ පිණ්ඩික යන අන්වර්ථ නාමයෙන් ජනතාව අතර වඩාත් ප්‍රකට විය.**

එතුමාට මහා සුභද්‍රා, චූල්ල සුභද්‍රා හා සුමනා නමින් දියණිවරු තිදෙනෙක් හා කාල නමින් එක් පුතණු කෙනෙක් වූ හ. සුදත්ත සිටුතුමා බෞද්ධයෙකු බවට පත්වීම අසිරිමත් කතා පුවතකි.

දිනක් සුදත්ත සිටුවරයා කිසියම් කාර්යයක් සඳහා රජගහ නුවරට පැමිණියේ ය. රජගහනුවර සිටු මාලිගය බලා ගිය ඔහුට එදින එහි කිසියම් කලබලකාරී ස්වභාවයක් පෙන්නුම් කෙරිණි. ඊට හේතුව කවරේදැයි හේ රජගහ නුවර සිටාණන්ගෙන් විමසී ය. එහි දී දැන ගැන්මට ලැබුණේ හෙට දිනයෙහි සිටු මැදුරේ බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ සංඝ රත්නය විෂයෙහි දානයක් පිරිනැමීමට කටයුතු සූදානම් වන බවයි. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී වැඩ සිටින බවටත්, සුදත්ත සිටුතුමා ඒ වනතුරුම නො දැන සිටියේ ය. එහෙත් “බුද්ධ” යන වචනය ඇසීමෙන් ම විශ්මයට පත් වූයේ ය.

බුද්ධ යන වචනය ඇසීමත් දුර්ලභ බව පැවසූ හේ එම බුද්ධෝත්තමයාණන් වහන්සේ දක්නට දැන්ම ම යා හැකි දැයි විමසී ය. එවිට රජගහ නුවර සිටුවරයා ප්‍රකාශ කළේ දැන් රාත්‍රිය බැවින් හෙට දින උදෑසනින් ම බුදුරදුන් හමුවන ලෙස යි. එබැවින් හිමිදිරි පාන්දරම බුදු රදුන් දැකීමට යන්නෙමි යි, සිතා සිටුතුමා නින්දට ගියේ ය. රාත්‍රිය පහන් වී ඇතැයි සිතා තෙවරක් ම නින්දෙන් අවදි වූ සුදත්ත සිටුතුමා තෙවැනි වර බුදුරදුන් දැකීම පිණිස පිටත්ව ගියේ ය.

ඉතා අලුයම සිටුවරයා සීත වනයට පිවිසියේ ය. සක්මනෙහි යෙදී සිටි බුදුරජාණන් වහන්සේ සිටුවරයා සීත වනයට පිවිසෙනු දුරදීම දුටු සේක. දැක “සුදත්ත මෙහි එන්නැ” යි, ඇමතූ සේක. බුදුරදුන් මාගේ නමින්ම අඬ ගසති යි, සිටුවරයා වඩාත් සතුටට පත් විය. ඉක්බිතිව බුදුරදුන්ගේ සිරිපා පියුම මත හිස තබා වැඳ “ඔබ වහන්සේ පෙරදින සුවසේ සැතපුණු සේක් දැ” යි, විමසී ය.

එහි දී බුදුරදුන් දුන් පිළිතුර වූයේ “කෙලෙස් නැසූ සිතේ ගිනි නොමැති, සියලු දුක් දුරු කළ උතුමෝ සුවසේ සැතපෙති” යන්නයි. එම වචනය ඇසීමෙන් ම පෙර කළ පින් ඇති සිටුතුමා සෝවාන් විය. එසේ ම තමා දිවි ඇතිතාක් තෙරුවන් සරණගිය උපාසකයෙකු ලෙස පිළිගන්නා ලෙස ද ඉල්ලී ය.

ඉමහත් චිත්ත සන්තෝෂයට පැමිණි සිටුතුමා සැවැත්නුවර වස් වසන ලෙස ද බුදු රජාණන් වහන්සේට ආරාධනා කළේ ය.

ඉක්බිති සිටුවරයා පෙරළා සැවැත් නුවරට පැමිණියේ ය. එහි

අනේපිඬු සිටුතුමා දිනකට දෙවතාවක් බුදුරදුන් හමුවට ගොස් බුද්ධෝපස්ථානය සිදු කොට ඇත. එහෙත් ඒ කිසිදු අවස්ථාවක එතුමා බුදුරදුන්ගෙන් ප්‍රශ්න විමසීමට උනන්දු නොවූ බව කිය වේ.

විසූ ජේත නම් කුමරු ගේ උයන කහවණු දහ අට කෝටියක් ගෙවා මිල දී ගත්තේ ය. තවත් දහඅට කෝටියක් වියදම් කොට විහාර, සෙනසුන්, උවටැන්හල්, වැසිකිළි කැසිකිළි, සක්මන් මළු යනාදිය ද ඉදි කරවීය. එය ජේතවනාරාමය ලෙස නම් කළ අතර, එම මහා විහාරය මහල් සතකින් යුක්ත වූ බව ද සඳහන් වේ. තවත් කහවණු දහඅට කෝටියක් වියදම් කොට විහාරය සඟසතු කොට පූජා කිරීමේ උත්සවය පැවැත් වී ය. මෙම ජේතවනාරාම පූජාව වෙනුවෙන් සිටුතුමා පනස් හතර කෝටියක් වියදම් කළේ ය. බුදුරජාණන් වහන්සේ සම්බුද්ධ පරිනිර්වාණය දක්වා ගත කළ වස් සතළිස් පහෙන් වස් දහ අටක් ම වැඩ වාසය කළේ අනේපිඬු සිටුතුමා කළ මෙම ජේතවනාරාමයේ ය. මේ නිසාම සැවැත් නුවර නිධාන කොට (සාවත්ථි නිධානං) ත්‍රිපිටකයේ එන සූත්‍ර දේශනා බොහොමයක් දේශනා කොට තිබේ.

අනේපිඬු සිටුතුමා දිනකට දෙවතාවක් බුදුරදුන් හමුවට ගොස් බුද්ධෝපස්ථානය සිදු කොට ඇත. එහෙත් ඒ කිසිදු අවස්ථාවක එතුමා බුදුරදුන්ගෙන් ප්‍රශ්න විමසීමට උනන්දු නොවූ බව කිය වේ. සිටුතුමා එසේ කළේ උන්වහන්සේ වෙහෙස ගැන්වීමට ඇති නො කැමැත්ත නිසා ය. දන්දීම වෙනුවෙන් ම සේදූ අත් ඇතිව සිටි එතුමා දිනපතා දන්දීමට ස්වකීය නිවසෙහි ආසන පන්සියයක් සූදානම් කොට තැබූ බව කිය වේ. සැදැහැති බෞද්ධයෙකු වූ එතුමා ධනෝපායනය නො කරමින් ධන විසර්ජනය ම සිදු කළේ ය. එම නිසාම එතුමා පසුව දිළිඳු බවට පත් වී ය. එහෙත් ස්වකීය ශක්ති ප්‍රමාණයෙන් බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට දන්දීම නො කඩවා සිදු කළේ ය. දන්දීම වැළැක්වීමට යම් ඉෂ්ටකාමී දේවතාවෙකු උත්සාහ කළ බවත්, එම දේවතාවා පසුව සිය මාලිගයෙන් ඉවත් කිරීමට සිටුවරයා ක්‍රියා කළ බවත්, බෞද්ධ සාහිත්‍යයේ සඳහන් ය. එය සිටුතුමා තුළ පැවති දානය සඳහා වූ නැඹුරුතාව තහවුරු වන සාධකයකි.

ස්වකීය දරුවන් සිව්දෙනා අතුරෙන් කාල නම් වූ පුත්‍රයා පමණක් බුදුරදුන් ගේ ඇසුරට යොමු කරවීමට සිටුතුමා අසමත් විය. එයට සම්‍යක් උපායක් යෙදූ සිටුතුමා විහාරයට ගොස් එක් බණ පදයක් ඉගෙනගෙන පැමිණිය හොත් කහවණු සියයක් ඔහුට ලබා දෙන බවට පොරොන්දුවක් ලබා දුනි. ඒ අනුව කාල එක් බණ පදයක් අසා එය මතකයේ රැඳුණු විගස විහාරයෙන් වහා පිටත් වීමේ අරමුණින් පිරිස් කෙළවර සිට බණ ඇසී ය. දේශනාව අවසන් වනතුරු එක් බණ පදයක්වත් ඔහුගේ මතකයේ නොරැඳෙන අධිෂ්ඨානයෙන් බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළහ.

එබැවින් දේශනාව අවසන් වනතෙක් එක බණ පදයක්වත් මතකයට ගැනීමට කාල සිටු පුතුට නොහැකි විය. ඉතා උනන්දුවෙන් බණ ඇසූ නිසා ඔහු දේශනාව අවසානයත් සමඟ සෝවාන් ඵලයෙහි පිහිටියේ ය.

මේ අනුව මුලු සිටු පවුලම බුදු දහමෙන් ලද ආලෝකය ඔස්සේ තෙරුවන් සරණ ගිය සැදැහැතියන් වීමටත්, අධිගමයන්ට පත්වීමටත්, ප්‍රධාන හේතුව නම් අනේපිඬු සිටුතුමා තුළ පැවැති අචල සද්ධා ගුණය යි. ප්‍රථම බෝධිරෝපණ පින්කම ද මෙතුමා ගේ මූලිකත්වයෙන් ජේතවනාරාම භූමිය තුළ සිදු කෙරිණි. සිටුතුමා ස්වකීය ජීවිතාවසානයෙහි මියගොස් ඉපදුණේ අනාථ පිණ්ඩික නම් දිව්‍ය පුත්‍රයෙකු ලෙසයි. දෙව්ලොව සිට සෝවාන් වූ දෙවියෙකු ලෙස පැමිණ නිරන්තරව ජේතවනාරාමය ප්‍රදක්ෂිණා කළේ ය.

**සම්භාව්‍ය සිංහල සාහිත්‍ය ඉතිහාසය පිරික්සීමේ දී කාව්‍ය නිර්මාණයෙහිලා නෛසර්ගික කාර්යශූර භාවයකින් හෙබි විශිෂ්ඨතම යතිවරයන් වහනන්සේ නමක් ලෙස ෂට් භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමි හඳුන්වාදිය හැකි ය.**



# සියලු වියතුනට සිළුමිණක් වූ
# තොටගමුවේ ශ්‍රී රාහුල හිමියෝ

වර්ෂ 1408 මැයි 08 වනදින ජන්ම ලාභය ලැබූ ශ්‍රී රාහුල හිමියන් ගේ දෙමව්පියන් වූයේ ස්වර්ණවතී නොහොත් සීලවතී දේවිය හා එකල දකුණුලක භාරව සිටි වීරබාහු නම් කුමරු ය. ජයබාහු කුමරු ලෙස ගිහි කල නම් ලැබූ ශ්‍රී රාහුල හිමි ඉතා කලාතුරකින් එළඹෙන ග්‍රහ යෝගයක් සමග ජන්ම ලාභය ලබා ඇත. එය කෙතරම් ප්‍රබල වූවක් ද යත් එවක නක්ෂත්‍ර ආචාරීන්ගේ අනාවැකිය වූයේ මෙම කුමරු ගිහිගෙයි විසුවොත් රජ වන බවත්, පැවිදිදිවියට පිවිසුණහොත් ඒ හා සමාන උසස් තත්ත්වයකට පත්වන බවත් ය. සිය පියා වූ වීරබාහු කුමරුගේ අකල් වියෝවෙන් පසු මෙම කුමරු හදා වඩා ගත්තේ කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජු ය.

එදා සත් හැවිරිදි දරුවෙකු ව සිටිය දී ජයබාහු කුමරු මව සමග හයවන පරාක්‍රමබාහු රජු මුණ ගැසීමට ගිය විට රජු දුක් සැප විමසුවේ ය. එවිට කුඩා කුමරු මෙවන් කවියක් ප්‍රකාශ කොට ඇත.

**මා වැනි බිළින්ඳ**
**වර වර ළඟට කැන්දා**
**දුක් සැප කුමන්දා**
**අසන තිරිඳෝ වෙන කොයින්දා**

සත් හැවිරිදි දරුවෙකු ගෙන් රජු මෙවන් හපන්කමක් කිසිසේත් ම බලාපොරොත්තු නොවී ය. මවිතයට පත් රජු මෙම දරුවා ස්වකීය පුත්‍ර ස්නේහයෙන් හදා වඩා ගැනීමට දෙන මෙන් ස්වර්ණවතී මැණියන් ගෙන් ඉල්ලා සිටියේ ය. පිය සෙනෙහස අහිමි ව සිටි දරුවාට ද මෙවන් පිය සෙනෙහසක් හා රැකවරණයක් අවශ්‍ය ව පැවති හෙයින් මව ඊට කැමති වූවා ය. රජුට ද පිරිමි දරුවන් නොසිටි අතර සිටියේ දියණියන් දෙදෙනෙකි. එදා සිට රජු ජයබාහු කුමරු හදාවඩා ගත්තේ අප්‍රමාණ පුත්‍ර ස්නේහයකිනි.

ජයබාහු කුමරු ස්වකීය මව ගේ ද කැමැත්ත ඇතිව ක්‍රි.ව.1425 දී උතුම් වූ ප්‍රව්‍රජ්‍යා භාවයට පත්වූයේ කැරගල වනරතන සංඝරාජ හිමියන් ගේ ආචාර්යත්වයෙනි. ඒ වන විට වයස අවුරුදු 17 කි. එහි දී පැවිදි නාමය වූයේ දෙමටාටගම වාචිස්සර යන්නයි. උපසම්පදාව ලබා ගත්තේ වර්ෂ 1438 දී ය. වාචිස්සර හිමියන් ගේ මුල් පන්සල වූයේ ද ස්වකීය මුත්තණුවන් වූ උත්තරමූල රාහුල හිමියන්ගේ මුල් පන්සල වූ ප්‍රතිරාජ පිරිවෙණ බද ගණේගොඩැල්ල විහාරස්ථානය යි. මෙම විහාරස්ථානය ඉදිකොට ප්‍රදේශය ද දියුණු කොට ඇත්තේ දේවපතිරාජ ඇමතිවරයා ය. පසුව එම විහාරස්ථානය අනෝමදස්සි හා වෛදේහ යන මහතෙරුන් වහන්සේලා වෙත පුද කළේ ය. වාචිස්සර හිමි ද මෙම විහාරස්ථානයට පැමිණ තත් ප්‍රතිරාජ පිරිවෙණින් අධ්‍යාපනය ලැබී ය. සයවන පරාක්‍රමබාහු රජු වාචිස්සර හිමියන්ට ආධාර වන පිණිස මෙම ප්‍රදේශයේ තිබූ සශ්‍රීක කුඹුරක් වූ මහවෙල හා ගොඩපිටිය යන ගම ද උත්තරමූල රාහුල හිමියන්ට පූජා කළේ ය.



**ඌරුගමුවේ අස්සජී හිමි**

උත්තරමූල හිමියන් ගේ ඇවැමෙන් තොටගමු පිරිවෙණ හා විහාරයේ අධිපතීන් වහන්සේ ලෙස රජතුමා පත් කළේ එවකට ගණේගොඩැල්ල පන්සලේ වැඩසිටි වාචිස්සර හිමියන් ය. මෙය රටේ කීර්තිමත් අධ්‍යාපන ආයතනයක් වන්නේ එයින් පසුව යි. තෙල්වත්තේ රත්පත් වෙහෙර නමින් ද එකල විජයබාහු පිරිවෙණ හැඳින්විණ.

උත්තරමූල රාහුල හිමියන් ගේ අපවත්වීමෙන් පසු වාචිස්සර හිමි ස්වකීය මුත්තණුවන් වූ ශ්‍රී රාහුල හිමියන් ගේ නාමය ස්වකීය නමට එක්කොට ගත්තේ ය. තොටගමුවේ පිරිවෙණෙහි වැඩසිටි නිසා උන්වහන්සේ "තොටගමුවේ ශ්‍රී රාහුල හිමි" නම් විය. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සතු ස්මරණ ශක්තිය විශ්මයජනක එකක් ම විය. ඒ පිළිබඳ සඳහන් වන ජනප්‍රවාදයක් පවතියි. දිනක් වීදාගම හිමි ධර්ම දේශනයකට වැඩමවීමට පෙර බලගතු සරස්වතී තෙල් බඳුනකට අශ්ව කෙන්දක් දමා සත් වරක් ගසා දමා එය දිවේ ගා ගන්නා අයුරු කුඩා රාහුල හිමි බලා සිටියේ ය. ගුරු හිමියන් පන්සලෙන් පිටත් වූ විගස කුඩා රාහුල හිමියන් කළේ එම තෙල් බඳුන ගෙන පානය කිරීම යි. එය බලවත් ඖෂධයක් වූ නිසා රහල් හිමි සිහිමූර්ජා වී ඇද වැටුණි. වහාම මේ බව ගුරුහිමියන්ට දන්වන ලදුව උන්වහන්සේ සැණෙකින් ආපසු පැමිණ බෙහෙත් ඔරුවක දමා කුඩා රාහුල හිමි සුවපත් කළ හ. මෙම ඖෂධයේ බලගතුකම නිසා රාහුල හිමි මතක ශක්තියෙන් අගතැන්පත් වූ බව මෙම ජනප්‍රවාදයෙන් කිය වේ.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ගෞරව සම්මානයට පාත්‍ර වූයේ "ෂට්භාෂා පරමේශ්වර" යන නාමයෙනි. එයට හේතුව සංස්කෘත, ප්‍රාකෘත, පෛශාචි, සෞරසේනි අප්‍රභංශ යන භාෂා සය පිළිබඳ පෘථුල දැනුමක් උන් වහන්සේ සතු වීම යි. එසේම ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය (තෙවලා වදනිසුරු) යන ගෞරව නාමය ද උන්වහන්සේට හිමි විය. ශ්‍රී රාහුල හිමි ස්වකීය පාණ්ඩිත්‍යය කාව්‍යශේඛරයේ දී දක්වන්නේ මහත් අභිමානයෙන් යුක්තව යි.

**සව්සත කෙළ පැමිණි**
**ගුරුවත් දෙරණ සපැමිණි**
**පිරිසිදු සිල් ගිහිණි**
**සියල්ලෝ වියතුන්ට සිළුමිණි**

තමා සියලු ශිල්ප ශාස්ත්‍රයන් හි පාරප්‍රාප්ත කෙනෙකි. ඒ නිසා පොළොවට බැසගත් බ්‍රහස්පතී හා සමාන ය. එසේම පිරිසිදු සීලයෙන් යුක්ත ය. සියලු පඬිවරුන්ට සිළුමිණක් හා සමාන වටිනාකමින් යුක්ත ය.

කෙනෙකුට මෙය ආත්ම වර්ණනාවක් සේ පෙණුන ද රාහුල හිමි තමා ගැන කරන මෙම අභිමානාත්මක වර්ණනාව ව්‍යාජයක් නොවේ. සත්‍යයකි. එ නිසා මෙය බහුශ්‍රැත පඬිවරයෙකු තම පාණ්ඩිත්‍යය අභිමානයෙන් පළ කළ අවස්ථාවකි. ශ්‍රී රාහුල හිමි විජයබා පිරිවෙණහි වැඩවසමින් සිදු කළ ශාස්ත්‍රීය සේවාව මෙරට පමණක් නොව නොයෙක් ශාස්ත්‍රයන් හි දැනුමැති විදේශිකයන් අතර පවා බෙහෙවින් ප්‍රචලිත විය.



උන්වහන්සේ ගේ දැනීම් සම්භාරයට සම කළ හැකි කිසිවෙකු එකල මෙරට නොවූ බව ගිරා සංදේශයෙහි මෙම කව තුළින් පැහැදිලි වෙයි.

**ගැඹුරු විජම් පෙළ කිරි සයුර ඇමවිට**
**සොඳුරු නුවන් වෙර පහරින් සකොබ කොට**
**මියුරු පද අරුත් අම ගෙනදෙන ලොවට**
**කවුරු සිදිසි වෙති මෙලකට එ යතිඳුහට**

ශ්‍රී රාහුල හිමියන්ගේ භාෂා සාහිත්‍ය සේවාව සලකා බැලීමේ දී උන් වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ සමූහය ඉතා වැදගත් වෙයි.

පරෙවි සංදේශය, කාව්‍ය ශේඛරය, සැළලිහිණි සංදේශය, පංචිකාප්‍රදීපය, බුද්ධිප්පසාදනිය, වුත්තමාලාව, යෝගරත්නාකරය භාෂා සාහිත්‍යය පමණක් නොව ජ්‍යෝතිෂය සම්බන්ධයෙන් එකල මූලස්ථානය වූයේ තොටගමුව හා වීදාගම යි. ශ්‍රී රාහුල හිමියන් ගේ ශිෂ්‍ය වෑත්තෑවේ හිමි ලියූ ගුත්තිල කාව්‍යයට සිංහල කාව්‍ය ග්‍රන්ථාවලියේ වැදගත් තැනක් හිමි වෙයි. මෙම කාලය තුළ ගිරා සංදේශය ලියා ඇත්තේ ද වෑත්තෑවේ හිමියන් බව කිය වේ. ශ්‍රී රාහුල හිමියන් ගෙන් සේ ම තත් ශිෂ්‍ය වෑත්තෑවේ හිමියන් ගෙන් ද සිංහල සාහිත්‍යයට සිදු වී ඇති සේවය ඉතා විශිෂ්ඨ මට්ටමක පවත්නා බව ඒ අනුව පැහැදිලි ය.

ශ්‍රී රාහුල හිමියන්ගේ අවසාන කාලය අම්බන ඉඳුරුගල ලෙන් විහාරය ආශ්‍රිත ව වැඩ සිටියේ ය.

අපවත් වීමෙන් පසු ශ්‍රී දේහය ලෙනෙහි තබා ප්‍රදේශයේ ජනතාව නිති වැඳුම් පිදුම් කිරීමට සලස්වා ඇත. ජීවත්ව සිටිය දී "සිද්ධායුලෝක රසායනය" නමැති තෙලක් භාවිතා කළ හෙයින් ශ්‍රී දේහය වසර 2712 ක් නරක් නොවී තිබිය යුතු බවට විශ්වාසයක් ඇත. ශ්‍රී රාහුල හිමි දේහය ගෝවට රැගෙන ගිය පසු අම්බන ප්‍රදේශයම පාළු වී ජනශූන්‍ය වූ බව කියැ වේ.

# අඩුම වයසින් අග්ගමහා පණ්ඩිත ගෞරව උපාධියෙන් පිදුම් ලද
# කොටපිටියේ රාහුල අනු නා හිමියෝ





**වාද්දුව තල්පිටිය බෝධිරාජ මහා විහාරාධිපති කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී අග්ගමහා පණ්ඩිත මහාචාර්ය කොටපිටියේ රාහුල අනු නාහිමි**

**අග්ගමහා පණ්ඩිත උපාධිය, සම්බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් කැපවන භික්ෂූන් වහන්සේ ඉහළින්ම අගය කිරීම සඳහා දෙනු ලබන ඉතා විරල ගෞරව උපාධියකි.**

මියන්මාර රජය මගින් පිරිනමනු ලබන එම උපාධියට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. ලෝකයේ කීර්තිමත් මහා යතිවරයාණන් වහන්සේ වෙනුවෙන් ප්‍රදානය කරන අග්ගමහා පණ්ඩිත ගෞරව උපාධියට හිමිකම් කියමින්, පොල්වත්තේ බුද්ධදත්ත නායක හිමි, බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහනායක හිමි, මහාචාර්ය වල්පොළ රාහුල හිමි, රේරුකානේ චන්දවිමල නාහිමි, කොටුගොඩ ධම්මාවාස මහා නාහිමි, නාපාන පේමසිරි මහා නා හිමි ඇතුළු යතිවරයාණන් වහන්සේ අපේ රටට ද ගෞරවණීය කීර්ති නාමයක් ගෙන දුන්හ. උන්වහන්සේ ඒ ගෞරව උපාධියෙන් පිදුම් ලැබුවේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් කළ මහා සේවයට ගෞරවයක්, උපහාරයක් ලෙසිනි.

අග්ග මහා පණ්ඩිත උපාධිය පිරිනැමීමේ දී සලකා බැලෙන ප්‍රධානතම නිර්නායකය වන්නේ උපාධිලාභී ස්වාමීන් වහන්සේ වයස අවුරුදු 60 සම්පූර්ණ කර තිබීම ය. බුරුම රටේ අගමැතිතුමා විසින් උපාධිය ප්‍රදානය කිරීමෙන් පසු ඊට අදාළ සහතික පත්‍රයක් ,ධජයක්, නාම පුවරුවක් සහ තිල මුද්‍රාවක් ද ලබාදේ. එම තිල මුද්‍රාව භාවිත කර යම් ලියමනක් ඉදිරිපත් කළේ නම් බුරුම රජය එය ඉතා ඉහළින් පිළිගනී.

මෙම වසරේ බුරුම රජය මගින් පිරිනමන අග්ගමහා පණ්ඩිත උපාධියෙන් පිදුම් ලැබුවේ මෙරට බෞද්ධ අධ්‍යාපනයේ නියැළෙන දෙස් විදෙස් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ වෙනුවෙන් වෙසෙස් මෙහෙවරක් සිදු කළ මහාචාර්ය කොටපිටියේ රාහුල අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. උපාධිය පිරිනැමීමේ ප්‍රධානතම නිර්නායකයක් වන වයස අවුරුදු හැටක් වීමටත් පෙර උන්වහන්සේට මෙම ගෞරව උපාධිය හිමි කර ගැනීමට හැකි වීම සැබැවින් ම සුවිශේෂී ය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති වහන්සේ ලෙස සේවය කළ, දැනට ද එම විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ස්වාමින් වහන්සේ ලෙස සේවය කරන කොටපිටියේ රාහුල හිමි කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ හිමියන් ලෙස සිය රාජකාරි කටයුතු ආරම්භ කරන්නේ 2013 වසරේ දී ය. ඒ වන විට දේශීය විදේශීය ශිෂ්‍යයින් ඉතා අඩු පිරිසක් එහි අධ්‍යාපනය ලැබූ අතර. අවශ්‍ය පහසුකම් හා අධ්‍යාපන ක්‍රමවේදය සංවර්ධනය කිරීම තුළ ඉතා කෙටි කලකදී මෙම ආයතනයෙන් දෙස් විදෙස් ශිෂ්‍යයන් විශාල පිරිසකට පශ්චාත් උපාධිය හිමිකර ගැනීමට අවස්ථාව ලැබුණි. විශේෂයෙන් විදේශීය ශිෂ්‍යයන් විශාල වශයෙන් මෙම අධ්‍යාපන ආයතනය සමඟ එකතු විය. ඒ තුළින් ලංකාවට විශාල විදේශ විනිමයක් ලැබුණි. පාලි හා බෞද්ධ අධ්‍යයන විෂයයට ආර්ථිකමය වශයෙන් වටිනාකමක් නැතැයි බොහෝ දෙනා අදහස් කරමින් සිටි අවස්ථාවක විදේශීය ශිෂ්‍යයින්ට අධ්‍යාපනය ලබා දී වසර ගණනාවක් ම, අඛණ්ඩ ව, වැඩිම ආදායම ලබාගත් අධ්‍යාපන ආයතනය බවට පත් කිරීමට හැකිවූ බව රාහුල හිමියෝ පවසති.

"මෙම පශ්චාත් උපාධි අධ්‍යාපන ආයතනය තුළ ඉගෙන ගන්නා ලද ශිෂ්‍යයින් අතරින් බොහෝ දෙනෙක් බුරුම, චීන, වියට්නාම්, හොංකොං හා සිංගප්පූරුව යන රටවලින් පැමිණි අය. යුරෝපීය ජාතික ශිෂ්‍යයින් ද සුළු පිරිසක් සිටියා. මා දන්නා තරමින් වැඩිම බුරුම ශිෂ්‍ය පිරිසකට ආචාර්ය උපාධිය ලබා ගැනීමේ දී ප්‍රධාන උපාධි පරීක්ෂක ලෙස කටයුතු කළා. එම කාලය තුළ ඒ රටවල මගේ නම ප්‍රසිද්ධ වන්නට ඇති. විශේෂයෙන්, බුරුම රටේ එක් අවස්ථාවක බෞද්ධ විශ්ව විද්‍යාලයක පැවති සම්මන්ත්‍රණයක දී බුරුමයේ සඟරජ හාමුදුරුවෝ උසස් අධ්‍යාපනය ගැන කතා කරන අවස්ථාවේ මගේ නම සඳහන් කර තිබෙනවා.

"ලංකාව ආදර්ශයට ගන්න. මහාචාර්ය රාහුල හාමුදුරුවෝ බෞද්ධ අධ්‍යාපනයට හොඳ සේවයක් කරනවා. උන්වහන්සේ ආදර්ශයට ගෙන අපේ විශ්ව විද්‍යාලත්, අධ්‍යාපන ආයතනත් සකස් කරන්න" යනුවෙන් එක් අවස්ථාවක නොව කිහිප අවස්ථාවක ම සඳහන් කර තිබෙනවා.



නිල මුද්‍රාව

උන්වහන්සේ මා හඳුනන්නේ නෑ. දැකලාත් නෑ.

ඒ වගේම බුරුමයේ සිතගු ඤාණිස්සර කියන මහා නායක හාමුදුරුවෝ අපේ රටේ පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය පිළිබඳ විශාල ඇගයීමක් කර තිබෙනවා. උන්වහන්සේගේ ශිෂ්‍යයින් පනහක් හැටක් පමණ ලංකාවේ ඉගෙන ගන්නවා. ඒ නිසා උන්වහන්සේ තුළ මා ගැන ලොකු උනන්දුවක් තිබෙන බව දැන ගන්නට ලැබුණා.

පසුගිය වසරේ මැද භාගයේ දී පමණ මා ආරාධනා නොකර ම සිතගු ඤාණිස්සර හාමුදුරුවෝ ලංකාවට වැඩම කළා. මා මුණ ගැසී බොහෝ කතාබහ කොට උන්වහන්සේ මගේ ජීව දත්ත සටහනක් ගෙන ගියා. කුමක් නිසාදැයි මට කීවේ නෑ.

ඉතින් දිනක් හිමිදිරි උදෑසන මට විශේෂ දුරකතන ඇමතුමක් ලැබුණා. ඒ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මා යටතේ ආචාර්ය උපාධිය ඉගෙන ගත් බුරුම භික්ෂුණියකගෙන්. ඒ භික්ෂුණිය මට සුබ පැතුවා.

"ඔබ වහන්සේට අපේ රටෙන් අග්ග මහා පණ්ඩිත උපාධිය ප්‍රදානය කර තිබෙනවා. ඒ ගැන අපට හරි සතුටුයි." යනුවෙන් පැවසුවා.

එය මට අදහාගත නොහැකි වුණා. මා කිසි දිනෙක එම උපාධිය සඳහා අයදුම් පත් යොමු කර තිබුණේ නෑ. ඊට ටික වේලාවකට පසු බුරුම තානාපතිතුමා කතා කරලා මට සුබ පතමින් මෙම ගෞරව උපාධිය පිරිනමා ඇති බව පැවසුවා. දින දෙක තුනකට පමණ පසු එතුමා පැමිණ එම උත්සවය සඳහා මට ආරාධනා කළා. ඒ අවස්ථාවේ එතුමා සඳහන් කළේ,

"ඔබ වහන්සේ හරිම වාසනාවන්තයි." බුරුම රජය මගින් පිරිනමන මේ උපාධිය ලංකාවේ අඩුම වයසින් ප්‍රදානය කර තිබෙන්නේ ඔබ වහන්සේටයි. "බුරුම රටේ වුව ද එය ලබා දෙන්නේ අවුරුදු හැටට වැඩි අයටයි. ඒ නිසා ඔබ වහන්සේ සුවිශේෂී කෙනෙක් ලෙස සලකනවා"

යනුවෙන්. අයදුම්පතක් හෝ ඉදිරිපත් නොකර මේ උපාධිය පිරිනැමුවේ කෙසේද යන්න මට ගැටලුවක් වුණා. එවිට සඳහන් කළේ සිතගු ඤාණිස්සර ස්වාමීන් වහන්සේ ඇතුළු විශාල පිරිසක් මේ උපාධිය මට ලබාදෙන ලෙස යෝජනා කර ඇති බවයි.

මේ වසරේ මාර්තු 08දා ඒ උත්සවයට සහභාගි වීම සඳහා ආරාධනා ලැබුණා. මා ඇතුළු ගිහි පැවිදි පිරිසක් ඊට සහභාගි වුණා. රටේ අගමැති තුමාගේ සහභාගීත්වයෙන් උත්සවය බොහොම ඉහළින් සිදුකළා.

මා විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයේ අවුරුදු 36 ක් සේවය කළා.

ඉගෙන ගත් කාලයත් සමඟ වසර 40 ක්. මේ ආ ගමන තුළ මා කිසිදු දේශපාලන හිතවත්කමක් ලබා ගත්තේ නෑ. ඒ වගේම මගේ සංඝ සභාවට උපරිම සේවයක් කරනවා. මා තුළ කිසිදු නිකාය භේදයක් නෑ. සියලු නිකායවලට පාර්ශ්ව වලට ගරු කරනවා. ඉදිරියටත් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් කැපවෙනවා.

ඒ කොටපිටියේ රාහුල අනු නා හිමියන් වහන්සේගේ දැක්මයි.

**රමණී සුබසිංහ**

## පිරිවෙනටත් බුදුසරණ

අප රටේ පුරාතන සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය වූ පිරිවෙන මුල්කරගෙන එහි සුවිශේෂී අනන්‍යතාව මේ යැයි විදහා දක්වමින් දිගහැරෙන "පිරිවෙන" පිටුව අද පටන් සතිපතා බුදුසරණ පුවත්පත තුළ ඉදිරිපත් කෙරෙයි. ඒ අනුව ලංකාවේ 829 ක්වූ පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පුවත් හා පිරිවෙන් අධ්‍යාපනය හා අදාළ සුවිශේෂී ලිපි සඳහා මෙම පිටුව වෙන් කෙරෙන අතර සියලු ලිපි, තොරතුරු හා ඡායාරූප සඳහා මෙම පිටුව වෙන් වෙයි.




## පිරිවෙන් අධ්‍යාපනයේ නව සංවර්ධනයක්



අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලක්දිව බුදු සසුන පිහිටුවීමෙන් පසු ප්‍රධාන අධ්‍යාපන ආයතනය වූයේ පිරිවෙනයි. එමගින් ගිහි පැවිදි දෙපිරිසට ම බෞද්ධ අධ්‍යාපනය සේ ම භාෂා ශාස්ත්‍ර ඥානයත්, වෛද්‍ය ජ්‍යොතිෂ, තර්කන්‍යාය, ඡන්දස් අලංකාර සහ විවිධ කර්මාන්ත පිළිබඳ ප්‍රාමාණික අධ්‍යාපනයක් එදා මෙදා තුර මැනවින් ලබා දුන්නේ ය. එබැවින් භික්ෂු සමාජයේ චිර පැවැත්ම සහ සම්බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය උදාකිරීම් වස් පිරිවෙන් අධ්‍යාපනයේ නව සංවර්ධනයක් ද ඇති කරමින් ඉදිරියට යාම කාලෝචිත වශයෙන් බෙහෙවින් ම හිතකර වූවකි.

ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රමවේදය තුළ පුළුල් ලෙස පැතිර පවත්නා පිරිවෙන් අධ්‍යාපනය සාම්ප්‍රදායික සහ නූතන අධ්‍යාපන රටාවන් ඔස්සේ සංවර්ධනය කළ යුතුව ඇත. එය වෙසෙසින් ම අපගේ සාම්ප්‍රදායික ක්‍රමවේදයත්, සම්භාව්‍ය සාහිත්‍යයත් ඓතිහාසික උරුමයත් ආරක්ෂාවන ලෙස ක්‍රියාත්මක වීම සිදුවිය යුතු ම ය.

ධර්ම භාණ්ඩාගාරයක් ලෙස සතිපතා සැදැහැවත් ඔබ අතට පත්වන බුදුසරණ පුවත්පත් තුළ "පිරිවෙන" නමින් පිටුවක් සෑම සතියකම පළකිරීමට ඉඩකඩ සලසා දීම මෙකී සාම්ප්‍රදායික සමාජය තුළට වටහාදීම සඳහා ගත් උදාර පියවරක් ලෙස අගය කරමි.

**ජාතික පිරිවෙන් උපදේශක**
**දොඩම්පහළ ශ්‍රී රාහුල හිමි**

## ඇගැයිය යුතු උතුම් කාර්යයක්



බෞද්ධ සමාජය භික්ෂු භික්ෂුණී, උපාසක,උපාසිකා යන සිව්වණක් පිරිසකගෙන් සමන්විත ය. මෙය නැවත ද ගිහි පැවිදි වශයෙන් කොටස් දෙකකට බෙදෙයි. මෙම ගිහි පැවිදි දෙපිරිසගෙන් ම සමාජය තුළ වඩාත් ගෞරවයට මෙන් ම පූජනීයත්වයට පත්ව ඇත්තේ පැවිදි සමාජය යි. යහපත් වූ අන්තර් පුද්ගල සබඳතාවන් යටතේ සාරධර්ම අතින් ජන සමාජය පෝෂණය කරවීම ගිහි සමාජය භික්ෂූන් වහන්සේලා වෙතින් බලාපොරොත්තු වන එක් පරමාර්ථයකි.

එබැවින් නිවන් මග අරමුණු කරගෙන ස්වකීය ආධ්‍යාත්මික සංවර්ධනය ඇතිකර ගන්නා උන්වහන්සේලා ගිහි සමාජයට අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනාවන්ද සිදු කරති. ජාතියේ මුරදේවතාවුන් වහන්සේලා යැයි නම් ලද භික්ෂූන් වහන්සේලා දුරාතීතයේ පටන් ම ස්වකීය භික්ෂු අධ්‍යාපනය සකස් කර ගත්තේ පිරිවෙන මුල්කරගෙන යි. ලංකාවේ ආදිතම අධ්‍යාපනික කේන්ද්‍රස්ථානය වූ පිරිවෙන හා සබැඳිව ලංකාවේ ප්‍රථම බෞද්ධ පුවත්පත වන බුදුසරණ පත්‍රය සිදුකරන කාර්යභාරය කාලීන වශයෙන් බෙහෙවින්ම ඇගයිය යුතු උතුම් කාර්යයකි.

**පිරිවෙන් අධ්‍යක්ෂ**
**වටිනාපහ සෝමානන්ද හිමි**

## පිරිවෙන රැක ගැනීම ගිහි පැවිදි දෙපිරිසගේ ම යුතුකමක්



අප රටේ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය ගොඩනගා ඇත්තේ ගරුතර ස්වාමීන් වහන්සේලාගේ ආශිර්වාදයත් කැපවීමත් මත ය. එය ලංකාවේ සමාරම්භක සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය යි. පුරාතන යුගයේ මෙන් ම වර්තමානයේ ද පිරිවෙන යනු මෙරට සමාජයට සුවිශේෂී ගුණාත්මක බලපෑමක් ඉදිරිපත් කරන ආයතනයකි.

පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය තුළින් අප රජයේ සුවිශේෂී ආගමික, අධ්‍යාපනික හා සංස්කෘතික අනන්‍යතාවක් ගොඩනැගුණු අතර එය දේශදේශාන්තරවල ද ව්‍යාප්ත වුණි. එබැවින් අප රටේ ජාතික තලයේ සුවිශේෂී අනන්‍යතාවක් පිළිබිඹු කරන පිරිවෙන රැකගැනීම ගිහි පැවිදි අප සැමගේ යුතුකමක් සේ ම වගකීමක්ද වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයත්, බුදුසරණ පුවත්පතත් එකතුව පිරිවෙන නමින් විශේෂ පිටුවක් පළ කිරීම තුළින් රට පුරා පිහිටි 825ක් පමණ වූ පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන සම්බන්ධ ලිපි සහ වාර්තා ඉදිරිපත් කිරීමට කදිම අවස්ථාවක් සළස්වා තිබේ. ඒ ගැන විෂයභාර අමාත්‍යවරයා ලෙස පිරිවෙන් ඒකකයටත්, බුදුසරණ පුවත්පතටත් කෘතවේදී ස්තුතිය පුදකරමි.

**අධ්‍යාපන යෞවන හා ක්‍රීඩා අමාත්‍ය**
**ඩලස් අලහප්පෙරුම**

# පිරිවෙන් අධ්‍යාපනයේ ආරම්භය හා විකාශය

**ලොවුතුරා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය මූලික කරගත් විෂය ධාරාවක් ඇසුරු කර ගනිමින් අධ්‍යාපනය ලබාදෙන ආයතනය පිරිවෙනයි. භික්ෂූන් වහන්සේ මෙන් ම ගිහි දරුවෝ ද මෙම පිරිවෙන් අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබති.**

අද වන විට පිරිවෙන් හා සමගාමී ව පිහිටුවා ඇති සීලමාතා ආයතන මගින් සීලමාතාවන්ට මෙන් ම දියණිවරුන්ටත් අධ්‍යාපනය ලැබීමේ වරම උදාවී ඇත. මෙම පිරිවෙන් අධ්‍යපනයේ ආරම්භය හා විකාශය පිළිබඳ සාකච්ඡා කිරීම මෙම ලිපි මාලාවෙන් බලාපොරොත්තු වේ.

බුද්ධත්වයෙන් පසුව බුදුරජාණන් වහන්සේ බරණැස් නුවර ඉසිපතනාරාමයේ දී ප්‍රථම වරට පස්වග භික්ෂූන් වහන්සේට දහම් දෙසීමෙන් ආරම්භ වුණු බෞද්ධ අධ්‍යාපන ක්‍රමය ශතවර්ෂ ගණනාවක් තිස්සේ ගමින් ගමට, නගරයෙන් නගරයට, ජනපදයෙන් ජනපදයට, රටින් රටට ව්‍යාප්ත විය. මෙම බෞද්ධ අධ්‍යාපන ක්‍රමය ව්‍යාප්ත කිරීමේ දී මුල් කාලයේ දී භික්ෂූන් වහන්සේ මූලිකත්වය ගෙන ක්‍රියා කළහ. පසුකාලය වනවිට උගත් ගිහි පිරිසගේ සහයෝගය ද හිමිවිය. මුල් කාලයේ දී නිර්වාණාවබෝධය මූලික කරගනිමින් මෙම අධ්‍යාපන ක්‍රමය සිදු වූ නමුත් පසුකාලයේ දී ලෞකික අපේක්ෂා පාදක කරගත් විෂය නිර්දේශයක් ඇතුළත් විය.

බුදුරදුන් ධරමාන කාලයේ දී පිරිවෙන යන නම භාවිත නොවූව ද අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමවේදය පැවැතී ඇත. එදා ධර්මධර, විනයධර භික්ෂූන්ට නවක පැවිදි වූ පිරිස් වෙත අධ්‍යාපනය ලබාදීම භාර කොට ඇති අයුරු ත්‍රිපිටකය තුළ අපට දැකගත හැකි ය. සමහර මහරහතන් වහන්සේ නමකට භික්ෂූන් වහන්සේ පන්සිය නමක්, සමහර රහතන් වහන්සේ නමකට හාරසීය නමක්, තවත් රහතන් වහන්සේ නමකට සියනමක්, තවත් රහතන් වහන්සේ වහන්සේ නමකට පනස් නමක් යනාදී වශයෙන් එක් එක් රහතන් වහන්සේලාට මෙන් ම හැකියාවන් ඇති භික්ෂූන් වහන්සේලාට අධ්‍යාපනය ලබාදීම සඳහා භික්ෂු පිරිස් බෙදා දී ඇත. දේවදත්ත තෙරුන් වහන්සේ තමන් වහන්සේටත් පිරිසක් බලාගැනීමට හැකියාව ඇතැයි කියා බුදුරජාණන් වහන්සේගෙන් පිරිසක් ඉල්ලාසිටියේ ද මෙවැනි අවස්ථාවක දී ය. එදා බුදුරජාණන් වහන්සේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ දේවදත්ත තෙරුන්ට ඒ සඳහා හැකියාවක් නොමැති බව සඳහන් කරමිනි.

මෙම ලිපියේ ඉතිරි කොටස ඇසළ අව අටවක පෝද (12 වැනිදා) පත්‍රයේ පළවේ.

**කොටනෙලුවේ පුඤ්ඤනන්ද හිමි**
**ඌරුගමුවේ අස්සජී හිමි**

**පිරිවෙන්වලට අදාළ පුවත්, ඡායාරූප සහ ලිපි අප වෙත යොමු කරන්න.**
budusarana@lakehouse.lk
**බුදුසරණ කර්තෘ මණ්ඩලය , ලේක්හවුස්, කොළඹ**

## සෞඛ්‍ය පිළිවෙත් සුරකිමු පිරිවෙන යළි අරඹමු

කොවිඩ් 19 වයිරසය ලංකාව තුළ ඉතා සාර්ථකව පාලනය කර ඇති හෙයින් පාසල් හා පිරිවෙන් ජූලි මස 06 වැනිදා යළි ආරම්භ කිරීමට රජයේ අනුමැතිය ලැබී තිබේ. මෙහි දී සෞඛ්‍ය අංශ ලබා දී ඇති සෑම සෞඛ්‍ය උපදෙසක් ම මැනවින් පිළිපදිමින් ක්‍රියා කිරීමට පරිවේණාධිපති හා කෘත්‍යාධිකාරි හිමිවරුන් වගබලාගත යුතු යැයි වයිරසය සම්පූර්ණයෙන් ම පහව ගොස් නොමැති නිසා ඒ පිළිබඳ ගුරු සිසු දෙපිරිස ම මනා සැලකිල්ලෙන් ක්‍රියා කරන ලෙස ද පිරිවෙන් අධ්‍යක්ෂ හිමිපාණන් වහන්සේ දන්වා සිටිති.

# නොකළ යුතු දෙතිස් කථා හා කළ යුතු දස කථා



**කථා කළ සෑම වචනයකින් ම ඉමහත් කරුණා ශාන්ත මෙහෙවරක් සිදුකළ බුදුරජාණන් වහන්සේ, රසයන් අතර උසස් ම රසය වන සත්‍ය රසයෙන් ලෝ සතුන්ගේ මනෝ මන්දිර පුරවාලූහ. ජීවිතාවබෝධය ඇති කරවන එකම බණ පදයකින් පවා සසර ගිමන් නිවා ගත් අපමණ සත් වගක් සම්බුදු අනුහසින් සුවපත් ව මොහඳුරින් මිදී ගියේ ය.**



බෙලිහුල්ඔය සීලසමාහිත යෝගාශ්‍රමවාසී
ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද
අභිධර්මය පිළිබඳ කථිකාචාර්ය
ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත

**බලංගොඩ රාධ හිමි**

හෘදයංගම වූ, කනට සුව එළවන, ප්‍රේමණීය වූ බුදුවදන් ධර්ම රසයෙන් පිරී ඇති නිසා එවන් මධුර වදන් පිටවන මුඛය ‘ශ්‍රීව මුඛ පද්මය’ නමින් හඳුන්වනු ලැබේ. ස්වභාවිකව ම මහනෙල් මල් සුවඳ වහනය වන නිසා සම්බුදු සිරි මුව මඩල අභියස වැඳ වැතිරෙන දෙව් මිනිසුන් පෙර කිසි දිනෙක නොවිඳි අස්වැසිල්ලක් ලබන ලද්දේ මල් මකරන්දයෙන් සුහිත බමර සමූහයක් ලෙසිනි.

බුදු මුවින් පිට වූ වචන ශ්‍රී සද්ධර්මය ලෙසින් යුගයෙන් යුගයට හදවත් සනසාලන්නේ ඒ සෑම ප්‍රකාශයක්ම අර්ථවත් හා සත්‍යවත් බවින් යුතු වන හෙයිනි. එවන් සත්‍ය ධර්මයක් අවබෝධ කර ගැනීම සඳහා පිළිපන් ශ්‍රාවකයා ද අවශ්‍යයෙන් ම සත්‍යවාදී විය යුතු ය. හිස් කථා ඇත්තෙකු නොවිය යුතු ය. වරදවා භාවිතයට ගත් වචනය සතර අපා දුකට පමුණුවන බව බුදුරදුන් විසින් නොයෙක් වර වදාරා ඇත.

සත්‍ය වචන කථා කිරීමෙන් මුසාවාදය දුරු කළ යුතු අතර දස කථාවෙහි යෙදීමෙන් තිරච්ඡාන කථා දුරු කළ යුතු ය. සුගතියට හා නිවනට බාධා පමුණුවන කථාවන් තිරච්ඡාන කථා නමින් හැඳින්වේ. විනෝදාස්වාදය වෙනුවෙන් හෝ එවන් කථා කිරීම හා ඇසීම සත්‍යාවබෝධයට ඍජුවම බාධා පමුණුවන බව වදාරා ඇත.

දෙතිස් කථා නමින් දක්වා ඇති එකී කථා සල්ලාපයන් නැතුවම බැරි තත්වයට වත්මන් ජන සමාජය පත්ව ඇත. නොකළ යුතු කථා ලෙස බුදුන් වදාළ දෙතිස් කථා හා කළ යුතු යැයි වදාළ දස කථා පිළිබඳ කෙටි සටහනක් මෙම ලිපිය මගින් ඉදිරිපත් කෙරේ.

තිරච්ඡානකථා සූත්‍රයේ දක්වා ඇති පරිදි ලෝභ ද්වේෂාදී කෙලෙස් හට ගැනීමට හේතුවන පරිදි රජවරු ගැන කථා කිරීම නොකළ යුතු ය. රාජ්‍ය නායකයින්ගේ ගුණ දෙස් විවේචනයට යාම තුළින් ඇලීම හෝ ගැටීම ඇතිවන බව ප්‍රකට කරුණකි.

චොරකථා යනු සොරුන් සහ මංකොල්ල කණ්ඩායම් ගැන කථා කිරීම යි. ඔවුන්ගේ වීරකම් ගැන කථා කිරීම මගින් අකුසල් සිත් පහළ වේ. ආරක්ෂා වීම සඳහා කථා කරයි නම් වරදක් නොවේ.

මහාමත්ත කථා යනු මැති ඇමතිවරු ගැන කථා කිරීම යි. එමගින් ද වාචසික අසංවරය ඇති වේ නම්, ධර්ම මාර්ගයට බාධාවකි. භික්ෂුවකගේ පැත්තෙන් ගත් විට සේනාසන ආරාම ගැන කථා කරමින් විනෝද වීම වැරැද්දකි.

භයකථා යනුවෙන් දක්වා ඇත්තේ හොල්මන්, අවතාර වැනි දේ ගැන සාකච්ඡා කිරීම යි.

යුද්ධකථා යනුවෙන් දක්වා ඇත්තේ රජවරුන් අතර හෝ යුධ භටයන් අතර ඇතිවන සටන් ගැන කථා කිරීම යි. ආස්වාදය බලාපොරොත්තුවෙන් එබඳු කථාවල යෙදීම තුළින් සමාධිය බිඳ වැටේ. බාහිර විතර්කයන් සමාධියට පරිපන්ථ ධර්මයන් ය.

අන්නකථා යනු කෑම වර්ග ගැන කථා කිරීම යි. වත්මන් සමාජය තුළ මෙබඳු කථා දවස පුරාවට අසන්නට ලැබේ. ලෝභය හා රස රාගය වැඩි වීමට හේතුවන එබඳු කථා ධර්ම මාර්ගයට ආවරණයකි. පානකථා යනු පාන වර්ග, බීම වර්ග ගැන කථා කිරීම යි. ඇඳුම් පැළඳුම් ගැන කථා කිරීම වත්ථකථා නමින් දක්වා ඇත. මෙය ගිහි පාර්ශවයට තදින්ම බලපාන කරුණකි. ඇඳුම නිසා ඇලීම ඇති වේ නම් එය නීවරණ ධර්මකයකි. සිත කෙලෙසී යන එබඳු කල්පනා දුරු කළ යුතු ය. සයන කථා යනු ඇඳ, පුටු, මේස, ගෘහභාණ්ඩ ගැන කථා කිරීම යි. එමගින් ලෝභය ඇතිවන බව අමුතුවෙන් කිවයුතු නොවේ. මාලාකථා යනුවෙන් අදහස් කරන්නේ මල්මාලා සැරසිලි ගැන කෙරෙන සල්ලාපයන් ය. සුවඳ විලවුන් ගැන කථා කිරීම ගන්ධකථා නම් වේ. ධර්මය පුරුදු කරන බුද්ධ ශ්‍රද්ධාවන්තයෙකුට එවැනි මන්ත්‍රණයන් මුලුමනින් ම අයෝග්‍ය වේ. නොකර සිටීමට වගබලා ගත යුතු ය.

ඤාතිකථා ලෙස පෙන්වා ඇත්තේ ‘අපගේ ඥාතීහු වීරයෝ ය. විසිතුරු යාන–වාහන ආදියෙන් ගමන් කළෝ ය’ ආදී වශයෙන් තම නෑ පරපුර ගැන උදම් ඇනීම යි. සිවිකා, දෝලා, ගැල් කණ්ඩායම් ගැන කථා කිරීම ද ලෝභාදී කෙලෙස් ඇතිවීමට හේතුවේ නම් සුදුසු නොවේ.

ගම්, නියම් ගම්, නගර හා ජනපද ගැන කතාවන් ද භාවනා මාර්ගයට අන්තරායකර වන්නේ එමගින් මනස අවුල් වන නිසා ය. විවිධ විසම අදහස් ජනිත වීමට තුඩු දෙන පරිදි රාජ්‍යයන් ගැන කථා මීටම ඇතුළත් වේ. පොළොව, ඉර, හඳ, ග්‍රහ, තාරකා, සාගර, මුහුදු, පර්වත වැනි වස්තූන් ගැන හෝ කථා කරන විට සතිය ගිලිහී ගොස් සිත භාවනා අරමුණෙන් පිට පනී නම් නොකළ යුතු ය. අනිත්‍යයේ ලක්ෂණය හඳුනා ගැනීම ආදී කරුණක් සඳහා එවැනි කථා කිරීම වරදක් නොවේ.

ගැහැනු, පිරිමින්, නළු–නිළියන්, ගායක–ගායිකාවන්, නර්තන, ගායන, වාදනයන් ගැන කථා කිරීම තථාගත ධර්මය පුරුදු කරන්නෙකු විසින් නොකළ යුතු ය. නූපන් ලෝභය දෝෂය ඇති වී උපාදානයන් බවට පත් වී බෞද්ධයෙකුගේ මූලික අරමුණ වන නිවන සාක්ෂාත් කිරීම සඳහා බාධකයන් වන එකී කථා සාමාන්‍ය ජීවිතයට පවා කරදරකාරී වේ.

ක්‍රීඩකයන්, යෝධයන් ගැන කෙරෙන කථාවන් නිසා ද සිතක් සංවර වන්නේ නොවේ. මං මාවත්, පදික වේදිකා, කඩපිල්, සාප්පු සංකීර්ණ හා තොටුපොළ ගැන කථා කරන විට ද මුලාව, ප්‍රමාදය ඇතිවේ. එවැනි ස්ථාන සිහිකොට මතකයට ගැනීම හේතුවෙන් අකුසල විතර්කයන් ඇතිවිය හැකි ය.

> බුදු මුවින් පිට වූ වචන ශ්‍රී සද්ධර්මය ලෙසින් යුගයෙන් යුගයට හදවත් සනසාලන්නේ ඒ සෑම ප්‍රකාශයක් ම අර්ථවත් හා සත්‍යවත් බවින් යුතු වන හෙයිනි. එවන් සත්‍ය ධර්මයක් අවබෝධ කර ගැනීම සඳහා පිළිපන් ශ්‍රාවකයා ද අවශ්‍යයෙන් ම සත්‍යවාදී විය යුතු ය

පුබ්බපෙතකථා යනුවෙන් දක්වා ඇත්තේ ද අතීත ඥාතීන් ගැන කෙරෙන කථා සල්ලාපයන් ය.

ආදීනවය, සංවේගය, විරාගය, ඇතිවීමට හේතුවේ නම් ඉහත “ඕනෑම කථාවක් කිරීම වරදක් නොවේ. එහෙත් පුහුදුන් පුද්ගලයෙකුගේ සිතක් බොහෝ සෙයින් කෙලෙස් ඉපදීමට භූමිය වන නිසා ඉහත දක්වා ඇති කථාවන් නොකර සිටීමට වෑයම් කළ යුතු ය.

“මේ ලෝකය කවරෙකු විසින් මවන ලද්දේ ද? අසවලා විසින් මවන ලද්දකි” ආදී වශයෙන් ඉස්සර නිම්මාණ කථාවන් ද ධර්ම මාර්ගයට බාධා කරයි.

විනෝද චාරිකා, මුහුදු ගමන්, ආකාස ගමන් වැනි දෑ පිළිබඳව කෙරෙන කථාවන් මගින්ද අනවශ්‍ය විතර්කයන් ඇතිවන බව පැහැදිලි වේ. ධර්මාවබෝධයට හේතු නොවන පරිදි කෙරෙන මොනයම් හෝ කථාවක් වේ නම් උච්ඡේද වාද, සස්සත වාද ආදියද ඇතුළත්ව ඉහත සඳහන් කළ සියලුම කථාපථයන් නොකළ යුතු බව බුදුරදුන් විසින් වදාරා ඇත.

වර්තමාන ලෝකයේ දක්නට ලැබෙන විවිධ තාක්ෂණික මෙවලම් උපකරණ හා ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍ය යනාදිය පිළිබඳ ව කථාවට යාම නිසා දහම් මග වඩන්නෙකුට යහපතක් වේ යැයි කිව හැකි නොවේ. එවැනි කථාවලින් වෙන් විය හැකි නම් යහපත් වේ. ශ්‍රද්ධා විරිය ආදී යහගුණ දියුණු වීමට ඍජුව හෝ වක්‍රාකාරයෙන් හේතුවන පරිදි ඉහත කී කථාවන් සිදු වේ නම් එමගින් අනර්ථයක් නොවේ. උදාහරණයක් ලෙස අතීතයේ විසූ ඥාතීන් ගැන කථා කරන විට ඔවුන්ගේ අභාවය මුල්කරගෙන අනිත්‍ය සංඥාව මරණ සංඥාව වැඩේ නම් එය යහපත් කථාවකි.

**ඉතිරි කොටස ඇසළ අව අටවක පෝද (ජූලි 12) පත්‍රයේ පළවේ**

## අලුත් ආරම්භයක්

වර්තමානයේ පවත්වාගෙන නොයන වැඩිහිටි නිවාසයක් ඉදිරියේදී පවත්වාගෙන යාම සඳහා ලබාදීමට කැමති ඔබට ආරාධනාව.
ලියකියවිලි කිසිවක් උවමනා නොවේ.

**071-1483145**

## සේනාසනයක්

නිකවැරටිය නගරයට ආසන්න නිසංසල පරිසරයක ආරණ්‍ය සෙනසුනක් සියල්ල අංගසම්පූර්ණයි. බාහිර කටයුතුවලින් තොරයි. සිව්පසය නොඅඩුව ලැබේ.

**භාරගැනීමට කැමති භික්ෂූන් වහන්සේලා අමතන්න.**
071-7448190

## ගාලු දිසාවේ සියලු පහසුකම් ඇති විහාරස්ථානයක

**වස් විසීමට සියම් නිකායේ දැන උගත් වැඩිහිටි ස්වාමීන් වහන්සේ නමකට ආරාධනා.**

**077-9964100 – 0718601907**

## O+ වකුගඩුවක් අවශ්‍යයි.

**නාට්‍ය අධ්‍යක්ෂවරයෙකු වන ප්‍රියන්ත රංජන් මහතාගේ වකුගඩු අක්‍රියව ඇති බැවින් හැකි ඉක්මනින් O+ වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතුව ඇත.**

**මොහුගේ ජීවිතය බේරා ගැනීමට වකුගඩුවක් පරිත්‍යාග කරන මෙන් පින්වත් ගරුතර ස්වාමීන් වහන්සේ නමකගෙන් හෝ පින්වත් මහත්ම මහත්මීන්ගෙන් කරුණාවෙන් ඉල්ලමි.**

**අමතන්න. 077-8656522 -**
**පූජ්‍ය දොඩම්පහළ සිරි සුගුණ නාහිමි**


## භාවනා අසපුවකට නිවසක් සහිත ඉඩමක් අවශ්‍යයි

සමථ – විපස්සනා භාවනා පිළිබඳ හසළ දැනුමක් හා වසර 18 ක පුහුණුව ඇති යෝගී හිමි නමක් භාවනා පුහුණු ආයතනයක් පවත්වාගෙන යාමට සුදුසු නිවහනක් සහිත ප්‍රමාණවත් නිස්කලංක ඉඩමක් පූජාවක් වශයෙන් හෝ සහනදායී මිලකට ලබා ගැනීමට සොයයි. බස්නාහිර පළාතෙන් කළුතර දිස්ත්‍රික්කය තුළ විශේෂයි.

**මෙය සසර පුරාවට බලපාන මහඟු පිංකමකි.**
**අමතන්න. 071-8098911**

## ලුම්බිණි

**රෙ:නො: W5510**



වෙනත් ශාඛා නොමැත.

**විශ්වාසවත්, පිරිසිදුවත්, විනයානුකූලවත්, අටපිරිකරක් ලබා ගැනීමට ලුම්බිණි වෙළඳසැල වෙතම යන්න.**

අටපිරිකර සහ පූජා භාණ්ඩ ප්‍රමුඛයෝ

**ලුම්බිණි ස්ටෝර්ස්**
65, ඕල්කට් මාවත, පිටකොටුව
දුරකථනය: 2324814

## නිදන් වස්තු සඳහා තඹපත් ඉරුවේ මහා පිරිත් පොත ලිවීම

බුද්ධ ප්‍රතිමා හා චෛත්‍යයන් තුළ තැන්පත් කිරීම සඳහා මහා පිරුවානා පොත් වහන්සේ, පන්සිය – පනස් ජාතක පොත – මහා පරිනිබ්බාන සූත්‍රය – මහා සතිපට්ඨාන සූත්‍රය – ධම්ම පදය හා ධර්ම ග්‍රන්ථ ඉතා අලංකාරව තඹ තහඩුවේ අතින් ලියවා ගැනීම සඳහා පහත දුරකථන අංකයෙන් අමතා විමසන්න.

බුද්ධ ප්‍රතිමා හා චෛත්‍යයන් තුළ තැම්පත් කළ යුත්තේ ධාතුන් වහන්සේලා හැරුණු කොට බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මයයි.

091-5729636, 0777-295190, 0723-747523

## ඉහත ආත්මවලදී මා විසින් කරන ලද සියලු අකුසල් දුරුවේවා.... ප්‍රහීන කරමි.

මේ ආත්මයේදී මා විසින් කරන ලද සියලු පුණ්‍ය බලයෙන් සියලු අකුසල් දුරු කරමි. මෙම භාවනාව සෑම විටම සජ්ඣායනා කර ගන්න ඔබට සියලු යහපත උදාවනු ඇත.

**දේශමාන්‍ය ආචාර්ය පී ගුණසිරි මහතා විසිනි.**
**අංක 75, මේධංකර මාවත, අරම්ණාගොල්ල, හොරණ.**

## ආරාධනාවයි

ඓතිහාසික දඹදෙණිය පුරවරයෙහි පිහිටි ආරණ්‍ය සේනාසනයක භාවනා කටයුතුවල නියැලී නිදහස්ව වාසය කරමින් පසුව මහණවීමට කැමති පවුල් බැරිත් තොර පින්වතුන්ට කෙරෙන ආරාධනාවයි.

**සේනාසනාධිපති හිමි**
**දු.ක. 0372266693**
**0723471212**

## සිදුකළ සැත්කමක් සඳහා පුණ්‍යාධාර අවශ්‍යයි

බදුල්ල කෝට්ටගොඩ පල්ලේගම, ගවරලවත්ත පදිංචි ඩබ්ලිව්. එම්. කුමාරවතී වන මම කොළඹ, නාරාහේන්පිට ලංකා (ඇපලෝ) රෝහලේදී ලක්ෂ 13 1/2 ක හෘද ශල්‍යකර්මයක් කිරීම නිසා හිතවත් අයෙකුගෙන් ණයට ගත් එම මුදල ගෙවා ගත නොහැකිව අසරණ වී සිටිමි.

මා කෙරෙහි අනුකම්පා කර හැකි පමණින් මුදල් ආධාර බදුල්ල ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ 100220251399 ගිණුම් අංකයට ලබා දී ඒ බව මා වෙත දැනුම් දෙන ලෙස ද ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

## සිත නිවන බණ කතා

**දෙවන මුද්‍රණය පිටඋනා !**

ප්‍රවීන චිත්‍ර ශිල්පී සාමවිනිසුරු කලා භූෂණ රාජ්‍ය සම්මාන හිමි
**වස්කඩුවේ මහින්ද සාගරගේ**
ප්‍රකාශනයකි
(NSB හිටපු චිත්‍ර ශිල්පී)

**බෞද්ධ දෙමාපියණි ! තම දුවා දරුවන්ට තිළිණ කළ යුතු අගනා කෘතියකි ! වැඩිහිටි සැමට විශේෂයි !**
**බුදුන් වහන්සේ දේශනා කළ ජාතක කතා චරිත කතා 26 ක් පිටු 58 ක් පුරා සිතුවම් කතා මගින් ... දර්ශනීය මුද්‍රණය !**

**පිටපත් ඉතා සීමිත ප්‍රමාණයකි. ඔබේ පිටපත දැන්ම ඇණවුම් කරන්න.**

පිටපතක මිල රු. 200/=
පාර්සල් තැපැල් ගාස්තු රු. 100/=

රු. 300/= මුදල් ඇනවුමක් සමග ගෙවන කාර්යාලය – වස්කඩුව ලෙස සඳහන් කර පහත ලිපිනයට යොමු කරන්න.

චිත්‍ර ශිල්පී – වස්කඩුවේ මහින්ද සාගර
කුඩා වස්කඩුව – වස්කඩුව

**විමසීම් : 034-2227331 / 0786343770**

## විශ්‍රාමික මාපියන් ආබාධිත රෝගී අය රැකබලා ගන්නෙමු

කඩිනම් ප්‍රතිකාර,
යාබද නාන කාමර,
ජීවිතාන්තය දක්වා රැකවරණය.
**වසර 10 ක පුහුණුවලත් හෙදියක් විසින් පවත්වන රජයේ ලියාපදිංචි ආයතනයකි.**

**කිං නර්සිං වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථානය,**
229/2B, උදය මාවත,
සපුගස්කන්ද, මාකොළ,
කිරිබත්ගොඩ.
**075-2914429,**
**076-4363271**

■ පින් - පව් කරන්නේ කය හා වචනයෙනි.
■ කය හා වචනයට කුසල් - අකුසල් කරන්න නොහැකි ඇයි?
■ සිතින් කරන්නේ කුසල් - අකුසල්
■ සිතින් පින් - පව් කිරීමට නොහැකි ඇයි?
■ පින් පව් කියන්නේ මොනවාද? ■ කුසල් අකුසල් කියන්නේ මොනවාද?

**බුදුරජාණන් වහන්සේ දේශනා කළ "ඒහි පස්සිකෝ" එන්න බලන්න, පරීක්ෂා කරන්න. මේ දහම ඔබ අත්දකිනවා නම් අත්විඳිනවා නම් පමණක් පිළිගන්න. භක්තිය විශ්වාසය නිසාවත්, මව්පියන් කියන නිසාවත්, ගුරුවරුන් කියන නිසාවත්, පරපුරෙන් පැමිණි නිසාවත් නොව, තමා තුළින් පරීක්ෂා කර බලන්න. ඔබට තද තරහක් ආ විට ඔබගේ සිතට ගතට වන දේ බලන්න. තරහ අකුසලයක් එහි විපාක ඔබ එවලේම අත්දකිනවා, අත්විඳිනවා. ඔබ කෙනෙකුට උදව්වක් යහපතක් කළ විට, එම කුසලයේ විපාක එවලේම ඔබ අත්දකිනවා, අත්විඳිනවා. එය භක්තිය නිසාවත්, විශ්වාසය නිසාවත් නොව එය අත්දකිනවා අත්විඳිනවා එම කරන දෙයක විපාක එවලේම අත්විඳින්න හා අත්දකින්න පුළුවන්. බුදු දහමේ තම කළ දෙයක විපාක අත්දැකීමට, අත්විඳීමට මැරෙන තෙක් සිටිය යුතු නැත. තමුන් කළ දෙයෙහි විපාක එකෙණෙහිම අත්දකින, අත්විඳින්නකි.**

මෙවා ඇතුළත් විස්තර කරන පිටු 8ක දහම් පත්‍රිකා පනහක් රු: 200/-, සියයක් රු: 400/- ක් ද, පිටු 4ක දහම් පත්‍රිකා පනහක් රු: 100/-, සියයක් රු: 200/- ලබා ගත හැක. සිරිසුමන ගොඩගේ ලියන ලද අලුත්ම පොත් "ලොව සැමට සිත නිවාගන්න" සහ "චිත්ත නියාම ධර්ම" පොතක් රු: 125/- වට්ටම

අලුත් පොත් අලුතින් ආරම්භ කරන පුස්තකාලවලට පරිත්‍යාග කිරීමටත් ඉතා සුදුසු නවකතා, කෙටිකතා, කාව්‍ය, විෂය ග්‍රන්ථ, බෞද්ධ ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් 30% වට්ටමකට ද, වෙනත් පොත් 40% - 90% දක්වා අඩු මිලට ද ජූලි 1 වනදා සිට අගෝස්තු අවසානය දක්වා ලබා ගත හැකිය.


සීමාසහිත එස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
පී. ද එස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකතන: (011) 2685369, 2686925

සෙන් කතා

# ඇතුළත සතුරෝ

**ඔහු ජපන් ජාතිකයෙකි. තරුණ ය. දක්ෂ දුනු ශිල්පියෙකි. දුණු ඊතල ශිල්පය පිළිබඳ තමන්ට තිබුණ විශිෂ්ට කුරුමානම පිළිබඳ ව ඉමහත් වූ ආඩම්බරයෙන් පසු විය. සාරවත් වූ බොහෝ සෙන් කථාන්තර කියවීමෙන් සතිපට්ඨාන අභ්‍යාසය පිළිබඳ මූලික අවබෝධයක් ද ඔහු ලබා ගත්තේ ය.**

නොබෝ කලකින් දුනු ශිල්පය පිළිබඳ හසල දැණුමක් තමන්ට ඇත්තේ යයි ඔහු තීරණය කළේ ය. ඈත කඳු ප්‍රදේශයක විහාරස්ථානයක වාසය කළ, එකල දුනු ශිල්පය පිළිබඳ උසස් කුසලතාවක් ඇතැයි ප්‍රසිද්ධියට පත්ව සිටි වෘද්ධ සෙන් ගුරුවරයෙකුට අභියෝග කිරීමට එහි යායුතු යයි ඔහු තීරණය කළේ ය.



මහාචාර්ය
**ඉත්තදෙමළියේ ඉන්දසර නා හිමි**

එක්දිනෙක ඔහු මෙම විහාරස්ථානයට පැමිණ වයෝ වෘද්ධ සෙන් ගුරුවරයා හමුවිය. "මම ඉතා දුර සිට පැමිණියේ, ඔබ ගැන මම අහල තියෙනව, දක්ෂ දුනු ශිල්පියෙක් කියල. මට ආශාවක් ඇති වුණා කවුද ඒ මට වඩා දක්ෂයා කියල දැන ගන්න."

"ඔව්, මම තමයි ඒ දුනු ශිල්පියා. නමුත් මම ඒව නතර කරල බොහෝ කාලයක් ගත වෙනව. මම දැන් දුනු ඊතල පාවිච්චි කරන්නේ නැහැ. මම දැන් මහලු සෙන් භික්ෂුවක්" යැයි සෙන් ගුරුවරයා පැවසී ය.

නමුත් තමාගේ දක්ෂාතාව පිළිබඳ ඉමහත් වූ ආඩම්බරයක් ඇති තරුණ දුනු ශිල්පියා, තමාට වඩා දක්ෂයෙකු නැතැයි විශ්වාස කරයි. මෙම තරුණ දුනු ශිල්පියා ද රටේ චිර ප්‍රසිද්ධ දුනු ශිල්පියා පරාජය කළහොත් තමාට එවැනි ම ප්‍රසිද්ධියක් සහ පිළිගැනීමක් ඇතිවනු ඇතැයි කල්පනා කරයි. එනිසා කෙසේ හෝ මෙම සෙන් ගුරුවරයා තරගයට පොළඹවා ගත යුතු යයි කල්පනා කළ ඔහු "මම හිතන්නෙ නැහැ දුනු ශිල්පය පිළිබඳ මා ඉගෙනගත් දේ තවත් කෙනෙකු දන්නව කියල, මම, ඔබට අභියෝග කරනව මට වඩා දන්න දෙයක් පෙන්වන්න කියල"

තමන්ගේ දැනුම ගැන උඩගුකම හිතේ ඇති තරුණ දුනු ශිල්පියා ඔහු සමග තරගයකට සෙන් ගුරුවරයා පොළඹවා ගනු ලැබී ය. අකැමැත්තෙන් තරගයට එකග වූ සෙන් ගුරුවරයා අවුරුදු ගණනක් පාවිච්චි නොකිරීමෙන් දූවිලි වැදී, මලකඩ කා තිබූ දුනු ඊතලවල සූනම්යීතාව පළමුව පරීක්ෂා කිරීමට අවශ්‍යම විය. හියොවුරෙහි මකුළුදැල් කඩා, ඊතල ද මැද පිරිසුදු කරගන්නට අවශ්‍ය විය. මේ සියල්ල කලබලයකින් තොරව, කල්පනාකාරීව, සංයමයෙන් පිළිවෙලකට සිදුකර ගති.

පසුව තරුණ දුනු ශිල්පියා පියවර අසූවක් ඈතින් ඉලක්කය ලෙස ලැල්ලේ හරි මැද පිදුරු ගසක් රැඳවී ය. තරුණයා තමන්ගේ මාරක පෙණුමැති දුන්නේ දුනුදිය ඇද ඊතලය මුදා හැරියේ ය. ඉලක්කයේ මැද ඇස පිදුරු ගස දෙපළු කරමින් ඊය ලැල්ලෙහි ඇමිණින.

ඉන්පසු දෙවන ඊතලයක් ගෙන මුදා හළේය. එම ඊය ලැල්ලෙහි ඇමිණී තිබූ ඊතලයෙහි වැදී මුල සිට අග දක්වා හරි මැදින් දෙපළු වී ගියේ ය. තමන්ගේ ශූරත්වය පිළිබඳ ඉමහත් ආඩම්බරයෙන් වයෝවෘද්ධ සෙන් ගුරුවරයා දෙස හැරී "දැන් ඔබට කළ හැක්කේ කුමක්දැයි මට පෙන්වන්න" යයි කීය.

වයෝවෘද්ධසෙන් ගුරුවරයා තමා පසු පස එන ලෙස තරුණයාට සංඥා කළේ ය. ඉතා බෑවුම් දුෂ්කර පටු මාර්ගයක් ඔස්සේ ඍජු බිත්ති ඇති පටු දෙරුවක් මුදුනට පැමිණියේ ය. එම කුහරය මුදුනේ ලිස්සන සුළු, එහාට මෙහාට වැනෙන දිග පයින් කඳෙන් හැදූ පාලමකි. එහි පහළට අඩි දෙසීයක් පමණ ලම්භාකාර ප්‍රපාතයයි. භයානක හඬක් නගමින් කන්දෙන් ඇද හැලෙන ගංගාවේ දිය දහර පිටට නෙරා ඇති තියුණු ගල් කුළුවල වැදෙමින් සුදු පෙණ පිඬු නගමින් හඬ නගමින් පහළට වැටෙන පෙදෙස ඉදිරියෙන් ඇත. වෘද්ධ සෙන් ගුරුවරයා සෙමෙන් අඩි තබමින් පටු පයින් කඳට නැග ඉක්මනින් එහි මැදට ගියේ ය. ඔහු සංසුන් ව දුන්න අතට ගත්තේ ය. උරහිසෙහි එල්ලා ඇති හියොවුරෙන් ඊතලයක් ගති. එය දුන්නෙහි යොදා දුනුදිය ඇද ඈත උස පයින් ගසකට විද්දේ ය.



පැද්දෙන පයින් කඳ උඩ සිට දුණුදිය ඇද ඊතලය පයින් ගස වෙත මුදා හරිනු දුටු තරුණ දුණු ශිල්පියාට තම හදවත හිරවුණාක් මෙන් දැනුණි. ඔහු තම ශරීරයෙහි ඇති වූ ගැස්ම සහ ක්ලාන්ත ගතිය බොහොම අමාරුවෙන් දරා ගැනීමට සමත් විය. ඇස් අඳුරුකරමින් හිස කැරකිල්ල ඇති විය. බියක් දැනිණි. වෘද්ධ සෙන් ගුරුවරයා පටු පයින් ඒ දඬු පාලමෙන් ආපසු පැමිණියේ ය.

"දැන් බලමු ද ඔබට කුමක් කළ හැකිද කියා, ඔබට පුළුවන් ද මේ පයින් පාලමේ සිට මා විද ඇති ඊතලය දෙකට පලන්න? නැත්නම් මම ඔබ වෙනුවෙන් එය කරන්න ද?"

යනුවෙන් සෙන් ගුරුතුමා ප්‍රශ්න කළේය.

මේ වන විට තරුණ දුනු ශිල්පියා තම ශරීරය සම්පූර්ණයෙන් ම පාලනය කර ගත නොහැකි තත්වයට පත්ව සිටියේ ය. තවමත් අනතුරුදායක ලෙස පැද්දෙමින් තිබුණ පයින් පාලම දෙසට එක අඩියක්වත් තැබීමට නොහැකි විය. වෙව්ලන දෑතින් මහලු සෙන් ගුරුවරයාගේ උරහිසින් අල්ලා ප්‍රපාතය අද්දරින් ආපසු ඇද්දේ ය. පසුව තරුණයා දුර්වල ව බිම ඇද වැටුණි. උඩගුකම සිඳී ගියේ ය. තරුණ දුනුශිල්පියා නැවත ශරීර පාලනය ලබා සන්සුන් වූ විට මහලු සෙන් ගුරුවරයා ඔහුට මෙසේ කී ය.

"ඔබට දුනු ඊතල පිළිබඳ හැබෑම හැකියාවක් ඇත. නමුත් නුඹට මනස පාලනය කර ගැනීමේ ඇත්තේ සුළු හැකියාවක් පමණි.

මම බොහෝ තරුණ දුනු ශිල්පීන් පුහුණු කරල තියෙනව. ඔවුන් උඩගුකම නිසා විඳි පීඩාව මා මුල් කොට ගෙන අවසන් කර ගත්ත. ඊතලය සලකුණු කරපු තැන හරියටම ඉලක්කයට වැදුණම ඒක ඔවුන් තමන්ගේ දක්ෂතාව කියල වර්ණනා කර ගන්නව. ඉලක්කය වැරදුණහම හැමවිටම ඊතලය කෙළින් නැතැයි දෙස් පවරනව"

"සමාවෙන්න, ගුරුතුමනි, උඩගුකම මා දෙ ඇස ඉදිරිපිට අඳුරු පටලක් විය, මනස ආවරණය කළ තිරයක් විය, එබැවින් බාහිර ලොව මට වඩා ශූරයින් ඇතැයි නොසිතීමි" යි කී ය.

තරුණයා ඔහුගේ ජීවිතයේ ඉතිරි කාලය විහාරස්ථානයෙහි ම ගත කළේ ය. තවදුරටත් තමා දක්ෂි දුනු ශිල්පියෙකු වශයෙන් හෝ ගුරුවරයෙකු වශයෙන් නොසිතී ය. ටික කලකින් මහලු සෙන් ගුරුවරයා මිය ගිය පසු තරුණ දුනු ශිල්පියා ඔහුගේ අනුප්‍රප්තිකයා බවට පත්විය. දූවිලි සහ මකුළුදැල් බැඳුණු ලණු ඉවත් කළ දුණු දෙක සහ හියොවුරු විහාරස්ථානයේ ගබඩා කාමරයේ පිටුපස බිත්තියට හේත්තු කර ඇත.

**කිසිවිටෙක කිසිවෙකු තම හැකියාවන්, ශක්තීන් පිළිබඳ අධි තක්සේරුවකින් උඩගු නොවිය යුතු ය.**



# පසඟ පිහිටුවා වැඳීම

දුවේ, පුතේ මොහොතකට හෝ සිත ගත සන්සුන් කරගෙන වන්දනා මාන කිරීම බොදු දරුවෙක් වන ඔබ ලබන ලොකුම සවියක්. වන්දනා මාන කිරීම අතුරෙන් පසඟ පිහිටුවා වැඳීම ශ්‍රද්ධාවන්ත බව ඉස්මතු වන ප්‍රධාන ගුණාංගයක්. ඔබේ දෙ දණ, දෙ වැළමිට සහ නළලත බිම තබාගෙන ම වන්දනා මාන කිරීම පසඟ පිහිටුවා වැඳීම යි.

ආදරණීය දුවේ, පුතේ පසඟ පිහිටුවා බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන්ටත්, ගෙදර බුදුන් වූ ඔබේ ආදරණීය මව් පියන්ට වගේ ම ගුරුවරු, වැඩිහිටියන්ටත් වැඳ නමස්කාර කරන්න. මේ මඟින් ඔබේ දිවියට ලැබෙන්නේ ඉමහත් ආශිර්වාදයක්.

බුදුන් වහන්සේගේ ගුණ මහා සාගරයේ ජලයටත් වඩා වැඩියි. උන්වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය, සංඝරත්නය තවමත් ජීවමාන යි. මව් පියන්ගේ ගුණ අනන්ත යි. මේ ගුණාංගයන් ගැන සිතා සැදැහැ සිතින් පසඟ පිහිටුවා වන්දනා මාන කරන ඔබ කිසි විටකත් පාපයකට නැඹුරු වන්නේ නැහැ.

පසඟ පිහිටුවීම 'පංචාංග පතිට්ඨාපිත නමස්කාරය' යනුවෙන් ද හඳුන්වනවා. ගුණවත් උත්තමයන්ගේ ගුණ දැනගෙන පිදිය යුත්තන් පිදීම උසස් මංගල කරුණක් බව මංගල සූත්‍රයේ ද දක්වෙනවා. පසඟ පිහිටුවා වැඳීම තුළින් ඔබේ ශ්‍රද්ධාව ඔපවත් වෙනවා වගේ ම ප්‍රායෝගිකව සෞඛ්‍යමය වශයෙන් ද වැදගත් වෙනවා, කෙලෙස් ධර්මයක් වන මාන්නය දුරු කිරීමට ද පසඟ පිහිටුවා වැඳීම මහඟු පිටිවහලක් වෙනවා.

මල් සුවඳට වඩා සිල් සුවඳ බලවත් බව අපේ බුදුරජාණන් වහන්සේ දේශනා කළා. මේ ගැන සිතමින්, පසඟ පිහිටුවා තෙරුවන් වඳිමින් ආදර්ශවත් ගුණාංගයන්ගෙන් සුවඳවත් වූ පින්වත් දුවට, පුතාට තුනුරුවන්ගේ සරණ, ආශිර්වාදය ලැබෙනවා.

**ප්‍රබෝධනී වැලිකල**

## විරිදු ගායනය

පූජ්‍ය ස්ථාන, සමිති සමාගම් මගින් පැවැත්වෙන තොරණ,සල්පිල්, ආදිය සඳහා විරිදු ගායනයෙන් සහාය දැක්විය හැක

**යක්කුරේ රත්නායක**

**071-85 12 896**

---

## කුරුණෑගල නගර බදව

වැදගත් විශ්‍රාමික මහතෙකු පමණක් සිටින නිවසේ උදව්වට 50 ට වැඩි ධාර්මික මහතෙකුට / මහත්මියකට කෙරෙන ආරාධනාවකි. පහසුකම් සපයමි.

**0714386972**

---

## කාරුණික පින්වතුනි

**සිල්මාතාවකට කොළඹ දිස්ත්‍රික්කය අවටින් ආරාමයක් පූජාකරගෙන අටමහා කුසලයට දායක වන්න.**

**077-8735600**

---

## රැකියා ඇබෑර්තු

සර්වෝදය කුලගන සංසදයේ නේවාසිකව සේවය කිරීමට වැන්දඹු හෝ අවිවාහක කාන්තාවන් සහ පිරිමි අවශ්‍ය වී ඇත.

**වයස 40 - 60 ත් අතර නිරෝගි අය විය යුතුයි.**

**පහත දුරකථන අංකයෙන් විමසන්න : 0777800105**

---

## හිමිනමක් පන්සලක් සොයයි.

**ශිෂ්‍යන් නොමැති. (ගුරුවරයකු යටතේ පැවදි වීමට උවද කම් නැත.**

075-9889398, 070-5626963

---

## වස් විසීම සඳහා

කළුතර දිස්ත්‍රික්කයේ විහාරස්ථානයක වස් විසීමට කැමති ගරුතර ස්වාමීන් වහන්සේ නමකට ආරාධනා.

**විමසන්න : 077-8656522**

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ

මහ පිරිවෙනක ත්‍රිපිටක ධර්මය විෂය ඉගැන්විය හැකි

**උපාධිධාරී ගිහි පැවිදි ගුරුවරයකු අවශ්‍යයි**

**077-0892512**
**077-6323753**

---

**සිල්වත් භික්ෂුන් වහන්සේ නමකට**

## භාවනා මධ්‍යස්ථානයකට

සුදුසු

**ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් සහිත ඉඩමක්**

සාංඝිකව පූජා කිරීමට කැමති අයෙකු සිටී නම් දන්වන්න.

**0775199913**

---

## පැවිදි වීමට හෝ කැපකරුවන්ට

**ගාල්ල බඹරවාන සුසීලාරාම විහාරස්ථානයට හා**

ඊට අනුබද්ධ විහාරස්ථාන දෙකකට දුසිරිතෙන් තොර වැඩිහිටි කැපකරුවන් අවශ්‍යයි.

*පැවිදිවීමට කැමති අයට හා රියදුරන්ට විශේෂයි.*

**076-6563807**

---

## කුරුණෑගල

**දිස්ත්‍රික්කයේ භික්ෂුන් වහන්සේලා 12 නමක් වැඩ සිටින විහාරස්ථානයකට වැසිකිළි පද්ධතියක් ඉදිකර දීමට සැදැහැති දායකයෙකුට දායිකාවකට ඇරයුම් කරමි.**

විමසීම් - විහාරාධිපති හිමි 077-8681700
ගිණුම - 028-2-004-3-0009042 (මහජන බැංකුව)

---

## රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය 74 හැවිරිදි බෞද්ධයෙක් වෙමි

**ආගමික කටයුතු නිදහස්ව ඉටුකිරීමට සුදුසු පිං බිමක් සොයයි.**

**සාමවිනිසුරු ප්‍රේමරත්න අතුකෝරල, ඉඹුල්පිටිය, ගොඩගම්පල.**

**076-4724887**

---

## ඔබට අවශ්‍ය මූර්ති හා චිත්‍ර

**ඔබට අවශ්‍ය මූර්ති හා චිත්‍ර (බුදු පිළිම, දේව පිළිම, උද්‍යාන අලංකරණ පිළිම, මියුරල්, විහාර සිතුවම්) සිද්ධස්ථාන හා අනෙකුත් සියලුම ස්ථානවලට පැමිණ ඉදිකරවා ගැනීමට හෝ ගෙන්වා ගැනීමට ඉතාමත් අලංකාරව හා පහසු මිලට.**

***එරන්ද ආට්ස්***

071-1712221, 076-7712231, 077-1453295

---

## පැවිදි කිරීම සඳහා කුල දරුවන්

ගම්පහ දිස්ත්‍රික්කයේ සියලු පහසුකම් සහිත විහාරස්ථානයක පැවිදි කිරීම සඳහා

**වයස අවුරුදු 08 සිට 12 දක්වාත්, වයස අවුරුදු 15 සිට 60 දක්වාත් තරුණ, වැඩිහිටි අය කැමැත්ත දක්වන්නේ නම්,**

පහත සඳහන් දුරකථන අංකයට දන්වන්න.

**විහාරාධිපති නාහිමි.**
**දුරකථන අංකය :**
011-2290242/ 011-2292313.

---

## මාහැඟි පිංකමක්

විවේක සුවය කැමති වැඩිහිටි භික්ෂූන්වහන්සේ නමක් ජල විදුලිය සහ ගමනාගමන පහසුකම් ඇති ස්වභාවික විපත්වලින් තොර පෙදෙසකින් කුටියක් ඉදිකර ගැනීම සඳහා බිම් කොටසක් සොයයි.

**(දානපතියෙකුට ඒ සඳහා ආරාධනා)**
**(කළුතර දිස්ත්‍රික්කය විශේෂයි)**

**දුර : 0768722864**

---

## අසරණ ගිලන් භික්ෂුවට ආධාර කරමු

ගම්බද පන්සලක වැඩවාසය කරන ගිලන් භික්ෂුවට බෙහෙත් සඳහා වැයවන මුදල් දරාගැනීමට නොහැකි බැවින් දනපති / ඔබතුමියගේ / ඔබතුමාගේ ආධාරය පතයි.

**ටෙලි: 0712187919**

---

## වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා

**කොළඹ ගම්පහ අවටින් කාමර 5ක් හෝ ඊට වැඩි නිවසක් උවමනාකර තිබේ.**

**0777 049379**

---

## ගිනිගත් ජීවිතයෙන් අත මිදිලා පරම සැනසීම සොයා යන පිංවතෙකුටයි මේ ආරාධනාව

ආහාරපාන, ඉඳුම් හිටුම් නොමිලේ.

**දම්මල පන්සල, බල්ලපාන සිට කි.මී. 2 ගලිගමුව තැපැල්.**

**මීට, ඒ. සද්ධානන්ද හිමි**

**දු.ක. 035-5612653**

---

## වයස අවුරුදු 42 ක් වයසැති පුතුට

අවු: 30 - 60 අතර පිංවත් අයෙකුගේ "O+" පොසිටිව් වර්ගයේ වකුගඩුවක් ඉක්මණින් අවශ්‍යයි.

**කරුණාකර අමතන්න.**

0776472741, 0775135637

---

## අලුතින් චෛත්‍ය ඉදිකිරීම, පරණ චෛත්‍යය නැවත පිළිසකර කිරීම.

**- මෝල්ඩින් වැඩ -**

**අටවිසි බුදු මැදුර, මල්, ආසන, වාහල්කඩ, ගණ්ඨාර කුළුණ, වළාකුළු බැම්ම, අතරමග නැවතුන වැඩ ඉතා අඩු මිලට කර ගැනීමට විමසන්න.**

***හිරුහංස ආට්ස් -***
*076-2457230*

---

## විහාරස්ථානයක් සොයයි

**උපසම්පදා තරුණ ස්වාමීන් වහන්සේ නමකට ස්ථිරවම වැඩසිටීම සඳහා විහාරස්ථානයක් හෝ පූජා කළ හැකි ඉඩමක්.**

**අමතන්න.** 070-3145197, 076-0834300

---

## විහාර චිත්‍ර

නව බුදු මැදුරක චිත්‍රරාමු සහ විසිතුරු සිවිලිම අගනා අන්දමින් සකස් කරදීම හා විහාර ප්‍රතිසංස්කරණ කටයුතුද, ජීවමාන ෆොටෝ ඇඳීම ආදී කලා කටයුතු සඳහා

**විමසන්න : චිත්‍ර ශිල්පී - එච්. තුෂාර ලියනගේ**
**0776017330**

---

## නොමිලේ

බුද්ධශාසනයට අනුපමේය සේවයක් කල අපවත්වී වදාළ **අතිපූජනීය නාඋයනේ අරියධම්ම මහා ස්වාමීන් වහන්සේ දේශනා කළ දැවෙන ලෝකයේ නොදැවී සිටීමේ එකම මාර්ගය සහ දවසට වරක්වත් බුදුගුණ සිහිකරමු කුඩා පොත් දෙක ලබා ගැනීමට** ඔබගේ ලිපිනය ඉතාමත් පැහැදිලිව පහත සඳහන් ලිපිනයට ලැබෙන්න සලස්වන්න.

**සුමනදාස සෙන්දනායක, 17/14, ගාමිණී මාවත, මතුගම.**

---

## නොමිලේ

මස් කැම පාප කර්මයකි. කොරෝනා වෛරසය හට ගත්තේ මස් කන්නන්ටය. නිර්මාංශක වී සදහම් මගට පිවිසීමේ DVD පටි හා දහම් පත් නොමිලේ.

**W. අමරවංශ හිමි**
**0717679254**

---

## පිණ්ඩපාතිකව යැපෙන පින්වත් වනවාසී භික්ෂූන් වහන්සේ නමක් සඳහා

බාහිර කරදරයෙන් තොරව ස්වාධීනව කටයුතු කළහැකි ස්ථානයක් සොයනු ලැබේ.

**076-0313236**

---

## උතුම් පැවිදි බව අපේක්ෂාවෙන් සිටින වයස අවුරුදු 18 හා 35 අතර පිංවත් ඔබට අවස්ථාව තිබේ.

*දෙමාපිය අවසරය සහිතව විමසන්න.*

**දු. අං. 077-5441726**

---

## භාවනායෝගී මෙහෙණින් වහන්සේ නමකට

බස්නාහිර පළාතෙන් පුංචි ඉඩමක් පරිත්‍යාගශීලී පුණ්‍යවන්ත කෙනෙකුගෙන් බලාපොරොත්තු වෙමි.

**අමතන්න : 071-9589487**

---

**2020 වර්ෂයේ**

## වස් කාලයෙහි වස් සමාදන්ව වැඩ සිටීම සඳහා

**නිස්කලංක ග්‍රාමීය විහාරස්ථානයක් සොයන ස්වාමීන්වහන්සේ නමකට ආරාධනා කරමි.**

**සියම් මහා නිකායට අදාළ වේ.**

**විමසන්න : දු.අං. 0775441726**

---

## වැඩිහිටියන්ට සුවපහසු නවාතැන්

**අම්මා තාත්තා නිවස මොරටුව කටුකුරුන්ද**

විශ්‍රාමිකව සැදැසමය ගෙවන ඔබට සියලු සැප පහසුකම් සහිත අලංකාර නිවසක කාරුණික වෛද්‍යවරියක් විසින් පෞද්ගලිකවම මෙහෙයවන අලුතින් ඇරඹූ වැඩිහිටි නිවාසයකට ඔබට ඇරයුම්. තවද ධාතු මන්දිරයකින් සමන්විත ආගමික පහසුකම්, අන්‍ය ආගමිකයන්ටද ආගමික පහසුකම් සැපසේ.

0770720272 - 071-4399540

---

රුවන්වැලි මහා සෑයට නුදුරු ආරාමයක මෙහෙණින් වහන්සේ කෙනෙක් සමග භාවනායෝගීව සිටීමට කැමති

**අවු. 40 ට නොවැඩි නිරෝගී මෙහෙණින් වහන්සේ කෙනෙකුට ආරාධනා.**

(අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් පිට)

0768535297

---

## ඔබගේ සැදෑ සමය සුව පහසුවෙන් ගත කිරීමට

**එන්න අපගේ සැදැල්ල වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථානයට ඔබට අවශ්‍ය පරිදි ආහාරපාන වෛද්‍ය පහසුකම් හා තනි කාමර පහසුකම් ඇත.**

**සැදැල්ල වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථානය, කැලණිය.**

Tel. 011-2082148, 075-3436890

---

## වැඩිහිටියන් හට නවාතැන්

**අලුතෙන් ආරම්භ කරන ලද නිදහස් නිස්කලංක පරිසරයක පිහිටා ඇති වැඩිහිටි නිවහන සඳහා සියලුම තත්ත්වයේ වැඩිහිටියන් බඳවාගනු ලැබේ.**

*යාබද නාන කාමර, ප්‍රනීත ආහාර පාන, කාරුණික සාත්තු සේවය,* වෛද්‍ය සායන ඇතුළුව ජීවිතාන්තය දක්වා ආගමානුකූලව සිටිය හැක.

**071-0903803.**

## පුණ්ණා ථේරී ගාථා

**ස්වාමි දරුවන්ගේ දඬුවමටත්, ආක්‍රෝශයටත් බියෙන්, සීතලෙන් පීඩා විඳිමින් (මම) දිය ගෙනෙමි. දියට බැස්සෙමි.**

බමුණාණෙනි, ඔබ කවරකුට බියෙන් හැමදා දියට බැස මෙසේ වෙවුලමින් කල් ගත කරන්නෙහි ද?

පින්වත් පුණ්ණාවෙනි, දියෙහි බැසීමෙන් කළ පව් දුරුවීමටත්, කුසල් ලැබීම පිණිසත් එසේ කරන බව දැනගෙන ම ඔබ විචාරන්නේ ය.

තරුණ හෝ මහලු හෝ යමෙක් බෙහෙවින් ම පව්කම් කෙරේ ද, හෙතෙම ජලස්නාන හේතුවෙන් පව්කමින් අතිශයින් මිදේ.

"කර්ම විපාක නො දන්නා ඔබට ජලස්නානයෙන්, පාප කර්මයෙන් මිදේය" යන කරුණ කවරෙක් පැවසී ද?

(එසේ වී නම්) හැම මැඩියෝ, කැසුබුවෝ, කිඹුල්ලු, සුංසුමාරයෝ ද, වෙනත් ජලචර සත්තු ද වෙත්නම්, ඒ සත්තු ඒකාන්තයෙන් ම ස්වර්ගයට යන්නාහ යි සිතමි.

එළුවන් මරන්නෝ ද, හූරුවැද්දෝ ද, මාලු මරන්නෝ ද, මුව වැද්දෝ ද, සොරු ද, අළුගෝසුවෝ ද, වෙනත් පව්කම් කරන්නෝ ද ඒ හැම ජලස්නානයෙන් පාපකර්මයෙන් මිදෙන්නා හ.

බමුණාණෙනි, ඔබ යම්කිසි පවකින් බිය වී ජලයට බසින්නාහු නම් ඒ පාපය නො කළ මනා ය. මෙබඳු වූ ශීතය තොපගේ සිරුරු සිවිය නො පෙළාවා.

පින්වතිය, නොමඟට පිළිපන් මා දියෙන් ගැලීමෙන් දුරු කොට ආර්ය මාර්ගයට පැමිණිවී ය. එහෙයින් මේ සළුව තුටුපඬුරු වශයෙන් ඔබට දෙමි.

සළුව ඔබට ම වේවා! මම සළුව නො කැමැත්තෙමි. ඉදින් ඔබ දුකට බිය නම්, දුක අප්‍රිය නම්,

එළිපිට හෝ රහසිගත ව හෝ පව්කම් නො කරව, යම් විදිහකින් මතු පව්කම් කරන්නෙහි හෝ දැන කරන්නෙහි නම් හෝ,

දැනගෙන පලායන්නා වූ ඔබට දුකින් මිදීමක් නො ලැබේ. ඔබ දුකට බිය නම් දුක අප්‍රිය නම්, තාදී ගුණ යුත් බුදුරජාණන් වහන්සේ ද, දහම් ද, සඟුන් ද සරණ කොට යන්න. සිල් සමාදන් වන්න. එය ඔබට වැඩදායක පිණිස පවතී.

මම තාදීගුණ ඇති බුදුරජාණන් වහන්සේ ද, ධර්මය ද, සංඝයා ද සරණ කොට යමි. සිල් සමාදන් වෙමි. එය මට වැඩ පිණිස වන්නේ ය.



මම පෙර බමුණුකුලයෙහි උපන් පමණින් බ්‍රහ්මබන්ධු නම් වීමි. දැන් (බාහිත පාප බැවින්) පරමාර්ථ වශයෙන් බ්‍රාහ්මණ වෙමි. ත්‍රිවිද්‍යා අධිගම කෙළෙමි. සුව ඇත්තේ ද, පව් සෝද හළෙමි ද වෙමි.

**සංක්ෂිප්ත ග්‍රන්ථ මාලා මණ්ඩලය සම්පාදනය කළ ථේරීගාථා ඇසුරිනි.**

# මිණිපේ පුරවරයට මිණි පහනක් වූ මිණිපුර මහා සෑය









> සුන්දර පෙදෙසක පිහිටි පූර්වාරාම පරිසරය වටා ඇත්තේ සරුසාර කෙත්වතු ය. ඉන් එහා ඇත්තේ සුන්දර කඳු වළල්ලකි. පූර්වාරාම පරිශ්‍රයට යනෙන සෑම අයෙකුටම ගතට මෙන්ම සිතට ද පුදුමාකාර සිසිලසක් දැනෙනුයේ එහි තිබෙන්නා වු නිස්කලංක පරිසරය නිසා ය.



**මිහිඳු මාහිමියන්ගේ ලංකා ගමනයත් සමඟ මෙරට විහාර, දාගැබ් ඉදිවීම ඇරඹුණු අතර දේවානම් පියතිස්ස රජුගෙන් පසු දුටුගැමුණු ,මහසෙන් ,වළගම්බා, ආදි ශ්‍රේෂ්ඨ නරපතියන් කළ බොහෝ වෙහෙර විහාර සම්බුදු සසුනේ චිර පැවැත්ම උදෙසා කරවූ මහා නිර්මාණයන් විය.වසර දහස් ගණනක ඈත අතීතයක සිට මෙරට රාජාවලියේ බොහෝ රජවරුන් කළ විශ්මිත වෙහෙර,විහාර දාගැබ් අදද ශේෂ ව ඇත්තේ බොදු ජනී ජනයාගේ සාධු නාදයට පාත්‍ර වෙමිනි.**

ඒ ලක්දිව සම්බුද්ධ සසුනේ චිරස්ථිතිය උදෙසා තවත් වසර දස දහස් ගණනින් අනාගතයට දිවෙන මෙන්ම හෙළ මහා සංස්කෘතිය ඔප් නැංවූ විශිෂ්ඨ නිර්මාණයන්ද වේ.එවනි සෑම නිර්මාණයක් තුළම ඇත්තේ අතීත රජවරුන්ගේ ප්‍රෞඪත්වය මෙන්ම බුදු සසුනට තිබුණා වූ අපරිමිත මහා ගෞරවය යි. අද ද ස්වර්ණමාලි සෑ රදුන් අභියසට ගියවිට මනසට දැනෙන සුවපත් බව මෙන් ම අතීත ප්‍රෞඪත්වය පිළිබඳ හැඟීම කිසි ලෙසකින් කිසිවෙකුට වචන වලට සීමා කළ නොහැක.

වර්තමානයේ බොහෝ විහාර, දාගැබ් ඉදිකරනුයේ මහ සඟරුවනේ අපරිමිත කැප කිරීම් මෙන්ම සැදැහැවත් දානපතීන්ගේ පරිත්‍යාගයන් මූලික කර ගනිමින් ය.එදා බුදුහිමි දවස සිටි අනේපිඬු ,මිගාර වැනි සිටුවරුන් සේ ම විශාකා. සුජාතා වැනි සැදැහැවතියන් ද මෙම පුණ්‍යවන්ත පිංකම් හි නිරත වූහ.

හසළක මීගොල්ල පූර්වාරාමය මිණිපේ දෙවන ව්‍යාපාරයේ ආරම්භක විහාරස්ථානය යි.මෙනිසා මිණිපේ දෙවන ව්‍යාපරය ආශ්‍රිත බොදු ජනයාට මෙම විහාරස්ථානය මහා පින්බිමක් විය.ඉතා සුන්දර පෙදෙසක පිහිටි පූර්වාරාම පරිසරය වටා ඇත්තේ සරුසාර කෙත්වතු ය. ඉන් එහා ඇත්තේ සුන්දර කඳු වළල්ලකි.පූර්වාරාම පරිශ්‍රයට යනෙන සෑම අයෙකුටම ගතට මෙන්ම සිතට ද පුදුමාකාර සිසිලසක් දැනෙනුයේ එහි තිබෙන්නා වූ නිස්කලංක පරිසරය නිසා ය.



බොදු ජනී ජනයාට කොතරම් වටිනා පුණ්‍ය භූමියක් වුව ද පූර්වාරාමයට තිබුණු ප්‍රධානතම අඩුපාඩුව එහි චෛත්‍ය රාජයාණන් වහන්සේ ය. උඩුදුම්බර මිණිපේ ප්‍රධාන සංඝ නායක අපවත්වී වදාළ පූර්වාරාම විහාරාධිපති උඩවත්තේ සෝමරතන හිමියන් මිණිපේ ව්‍යාපාරය තුළ මෙන් ම, දුම්බර ප්‍රදේශයට පහළ වූ මහා සංඝ පීතෘවරයාණන් වහන්සේ නමකි. උන්වහන්සේ කොතරම් ශාසනික මෙහෙවෙරක නිරත වුවද, ප්‍රදේශයට මහා සේවාවක් කළ ද නාහිමියනට තම විහාරස්ථානයේ චෛත්‍යක් ඉදිකර ගැනීමට නොහැකිවීම පිළිබඳව උන්වහන්සේ ගිලන් ව සිටින අවස්ථාවේ දැඩි කනගාටුවට පත්ව සිටියහ. එවනි අවස්ථාවක එම විහාරස්ථනය වෙත ගිය කෙහෙළිය රඹුක්වැල්ල හිටපු අමාත්‍යවරයා හා ඔහුගේ බිරිය කුසුම් රඹුක්වැල්ල මහත්මිය ඇතුළු දූ දරුවන්ට මෙමඉල්ලීම සෝමරතන හිමියන් විසින් සිදු කළහ. තම විහාරස්ථානයේ චෛත්‍යයක අඩුපාඩුව පිළිබඳ ව නාහිමියන් එසේ ප්‍රකාශ කිරීමත් සමග රඹුක්වැල්ල මහතාත්, එම මහත්මියගේ දැඩි උනන්දුවත් මත පූර්වාරාම චෛත්‍යරාජයාණන් වහන්සේගේ වැඩකටුයුතු ආරම්භ කෙරිණි.

2015 මෙම චෛත්‍යයේ වැඩකටයුතු ආරම්භ කෙරිණි.මෙය මිණිපේ පුරවරයටත් විශේෂයෙන් මීගොල්ල ප්‍රදේශයටත් සාධු ජනක අවස්ථාවක් විය. ගොවිතැන බොහෝ ජනයාගේ ජීවනෝපාය වූ කර්කෂ, එහෙත් සෞම්‍ය ප්‍රදේශයක ඉදිවන මෙම චෛත්‍ය මිණිපුර මහා සෑය ලෙස නම් තැබී ය.

දායක පිරිස ලද සෑම විටම උපරිම ශ්‍රම දායකත්වය ද ඒ වෙනුවෙන් දෙනු ලැබීය.ඔවුන්ගේ අතින් චෛත්‍ය මුදුනට වැලි,ගල්,ගඩොල් කැට සිමෙන්ති ආදිය බොහෝ ලෙස ඇදිණි.ඇතැම් විට නිවසින් ආහාර ගෙනවිත් ගමේ ජනතාව සමග එක්ව වැඩ කරමින් ඔවුන් සමග ආහාර ගනිමින් මිණිපුර සෑයට විශාල ලෙස මෙමපවුලේ අය ශ්‍රමදායකත්වය ද දුණි. දිනෙන්දින චෛත්‍යයේ වැඩ කෙරීගෙන යන විට ඒ සඳහා ගම්වාසීන් ඇතුළු ප්‍රදේශවාසීන් උපරිමයෙන් කැප වූහ. ඔවුහු ගඩොල් කැපූහ. වැලි ගොඩ ඇමූහ.හැකි සෑම විටම ඉහළම ශ්‍රම දායකත්වය ද ලබා දුන් අතර, මේ සඳහා වත්මන් මීගොල්ල පූර්වාරාමාධිපති මීගොල්ලේ රාහුල හිමියන්ගේ ලබා දුන් අනුශාසකත්වය ඉතාම සුවිශේෂී ය.

අඩි 69 ක් උසැති මිණිපුර මහා සෑය මිණිපේ දෙවන ව්‍යාපාරයේ විශාලතම චෛත්‍ය ලෙස මේ වන විට සැලකේ.පසුගියදා එම සෑයේ කොත් පැළඳවීම සුබ මොහොතින් සිදු කෙරුණු අතර ඒ සඳහා වන කොත් වහන්සේ මහනුවර පිහිටි අමාත්‍යවරයාගේ නිවසේ සිට හසළක මීගොල්ල පූර්වාරාමය දක්වා වැඩම කිරීම සිදුවිණි.කිලෝ මීටර් හැටකට වඩා දුරක් වැඩම වූ කොත් වහන්සේ සාධු නාද මැද චෛත්‍යයේ තැන්පත් කිරීම සිදුවූයේ මහා සංඝ රත්නයේ ආශිර්වාද මධ්‍යයේ හිටපු අමාත්‍යවරයාගේ සහභාගිත්වයෙනි.

රටෙහි පවතින තත්ත්වය මත සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් හා ක්‍රමවේද පිළිපදිමින් ඉතා චාම් ආගමික උත්සවයකින් කොත් වහන්සේ පැළඳවිම සිදුවුණු අතර ත්‍රෛයි නිකායික මහ සඟරුවනේ ආශිර්වාද මධ්‍යයේ සුබ මොහොතින් මිණිපුර සෑයේ කොත් පැළඳවීම සිදුවිණි.

ටිකිරි බණ්ඩා දිසානායක රඹුක්වැල්ල මව්පිය දෙපළටත් කුසුම් රඹුක්වැල්ල මහත්මියගේ දෙමාපියන් වන ඩී.එස්.ඊ. වැයිහේන මව්පිය දෙපළටත් පින් පිණිස මෙම චෛත්‍යරාජයාණන් වහන්සේ ඉදිකෙරිණි.

මීගොල්ල පූර්වාරාමාධිපති මීගොල්ලේ රාහුල හිමියෝ මෙහිදී අදහස් මෙසේ පැවසූහ. මිණිපුර මහා සෑයේ ඉදිකිරීම් ආරම්භ වන්නේ මෙයට වසර පහකට පමණ පෙර ය.අනුරාධපුර පොළොන්නරු ඉපැරැණි තාක්ෂණය ඔස්සේ මෙහි ඉදිකිරීම් ඇරඹූ අතර එවකට මීගොල්ල පූර්වාරාමය ඇතුළු විහාරස්ථාන රැසක අධිපතිත්වය දරමින් සිටියදී අපවත් වී වදාළ උඩවත්තේ ශ්‍රී සෝමරතන නාහිමියන්ගේ බලාපොරොත්තුවක් ,ඉල්ලීමක් අනුවය මෙය ඉදිවනු ලබන්නේ.මෙය මිණිපේ දෙවන ව්‍යාපාරයේ මූලාරම්භකම විහාරස්ථානය ලෙසයි සැලකෙන්නේ නමුත් අදවන විට චෛත්‍ය රාජයාණන් වහන්සේ ඉදිවීමත් සමගයි විහාරස්ථානය අංග සම්පූර්ණ වන්නේ.සෝමරතන නාහිමියන් දැඩි ලෙස ගිලන් ව සිටින අවස්ථාවේ දී රඹුක්වැල්ල මහතා ,එම මහත්මිය හා පවුලේ දූ දරුවන්ගෙන් කළ ඉල්ලීමකට අනුවයි මෙම සෑය ඉදිවනු ලබන්නේ.මෙය මිණිපේ විශාලතම චෛත්‍ය ලෙස සම්බුද්ධ සසුනට පූජාකර තිබේ.

ඈත අතීතය සිහි ගන්වමින් අතීත සම්ප්‍රදායන් ,තාක්ෂණික ක්‍රමවේදයන් භාවිත කරමින් සුවහසක් බොදු ජනයාට මහා සෑයක් ලෙසින් ඉදිවූ මිණිපුර මහා සෑය මිනිපේ පුරවරයට සේ ම සමස්ත බොදු ජනතාවගේ ම පින්කෙතකි.

**ඉන්දික පොල්කොටුව**

# දුක හඳුනාගෙන ජීවිතයට සතුටින් මුහුණ දෙමු

**දුක අවබෝධ කරගෙන ජීවිතයට මුහුණ දෙන්නේ කෙසේ ද? ජීවිතය සැප වගේ ම දුක් ඔස්සේ ගත වෙිගෙන යනවා. සැප ඉදිරියේ මනුෂ්‍යයෝ සතුටින් මුහුණ දෙනවා. එනමුත් දුක ඉදිරියේ හඬා වැළපෙනවා. මේ නිසා දුර්ලභ ව ලැබූ මනුෂ්‍ය ජීවිතය අවබෝධයෙන් යුතුව උපේක්ෂාවෙන් යුතුව මුහුණ දෙන්නේ කෙසේ දැයි අප විසින් විසඳ ගත යුතු වෙනවා.**

## ජීවිතය කෙටි කාලයයි


බෞද්ධ දර්ශනයට අනුව මනුෂ්‍ය ජීවිතයක් ලැබීම ඉතා ම දුර්ලභ අවස්ථාවක්. කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලනවාටත් වඩා අපහසුයි. ඉතාම අපහසුවෙන් ලද මනුෂ්‍ය ජීවිතය ද ආයු වශයෙන් ඇත්තේ ඉතා ම කෙටි කාලයකුයි. ඒ කෙටි කාලය තුළ මනුෂ්‍යයන්ට සම්මුතිය තුළ අවුරුදු සියයක් පමණ පවතින්නේ නම්, ඉගෙනීම, රැකියාව, විවාහය, දරුවෝ, යුතුකම් ආදී වශයෙන් ජීවිතය පවත්වාගත යුතු වෙනවා. මෙයිනුත් ඉගෙනීම වෙනුවෙන් ජීවිතයේ සැහෙන කාලයක් එනම් ජීවිතයෙන් තුනෙන් එකක් පමණ ගත කළ යුතු වෙනවා.

## ධර්මානුකූල සතුට

මීළඟට ජීවිතය පවත්වන්න නිසි ධනයක් උපයාගැනීම පිණිස තවත් සැහෙන කාලයක් ගත කළ යුතු වෙනවා.

එහි දී බොහෝ පිරිසක් දුක්ඛ, දෝමනස්සයන්ට පත්ව ජීවිත ගත කරන බව පැහැදිලියි. මේ නිසා ජීවිතයේ යථාර්ථය අවබෝධ කරගෙන ධර්මානුකූල සතුටකින් ජීවිතය පවත්වන්නේ කෙසේ දැයි අප විසින් තේරුම් ගත යුතු වෙනවා. බුදුරජාණන් වහන්සේ විසින් පළමුවෙනි දේශනාව වූ ධම්මචක්කප්පවත්තන දේශනාවේ දී ජීවිතයේ යථාර්ථය මතුකොට පෙන්නුම් කළා. එනම් ඉපදීම දුකකි. ලෙඩවීම දුකකි. දිරාගෙන යෑම දුකකි. මරණය දුකකි. අප්‍රියන් හා එකතුවීම දුකකි. ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකකි. යමක් කැමැති නම් ඒ ද නොලැබීම දුකකි. කෙටියෙන් පවසන්නේ නම් ස්කන්ධ පංචකයම දුකකි. ජීවිතයක් ආරම්භයේ දී ම ජීවිතයේ යථාර්ථය භාග්‍යවතුන් වහන්සේ දේශනා කළා.

මේ දුක්ඛ කියන වචනයෙන් අපි තේරුම් ගන්නේ, සාමාන්‍යයෙන් අදහස් කරන හඬා වැළපීම ආදිය පමණක් නොවේ. දුක්ඛ කියන වචනයෙන් අපි තේරුම් ගනු ලබන්නේ ජීවිතයක් පවත්වන විට හමුවීම් – වෙන්වීම්, ලැබීම් – නොලැබීම්, දුක්ඛ දෝමනස්ස, සැප – දුක, නින්දා – ප්‍රශංසා, කීර්ති හා අවමන් ආදී වශයෙන් මේ සියල්ලමයි. යම් කෙනෙක් ප්‍රශ්න කරනු ලබන්නේ සැපක්, සතුටක්, සොම්නසක් ධනයක් ලැබීමක් දුකක් වන්නේ කෙසේ දැයි යනුවෙනුයි. මෙය මැනවින් අවබෝධ කරගත යුතු අවස්ථාවකි. හේතූන් ප්‍රත්‍ය කරගෙන සකස් වෙන්නා වූ යම් ඵලයක්, විපාකයක් වේ ද ඒ හේතූන්ගේ විසිර යෑමෙන් එම ඵලය හා විපාකය ද නැතිව යන්නේ ය. ඒ අදහස ඔස්සේ අප කල්පනා කරන විට අප සැප සතුට, සොම්නස, ලැබීම, හමුවීම, කීර්තිය, ප්‍රශංසාව, නීරෝගීකම විවිධ වචන වලින් සතුට කියන වචනයට එකතු කර ගන්නා අවස්ථාවන් හේතූන්ගේ



බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ ධම්මික නා හිමි**

සංසිද්ධියකි. හේතූන්ගේ ඵලයකි. ඒ ඵලය අප සැප, සතුට හැටියට හඳුනා ගන්නෙමු. නමුත් ඒ ඵලය සකස් වූයේ හේතූන්ගේ නම් ඒ හේතූන්ගේ ම විසිර යෑම සිදු වන විට ඒ ඵලය ද නැතිව යන්නේ ය.

## සැපය තුළ සැඟවුණ දුක

මේ නිසා සැප, සතුට, සොම්නස, හමුවීම හෝ ඔබේ වචනවලින් ආදරය, ලෙන්ගතුකම, මේවා තුළ ද සකස්ව ඇත්තේ දුකම නොවේදැයි නුවණින් සිහිපත් කරන්න. අප සතුටක්, හමුවීමක්, සොම්නසක් හැටියට ඵලය ලංකරගත්තත්, ඒ හේතූන් විසිරී යන විට ඒ සතුටෙහි ඒ ඒ මොහොතෙහි නිමාවක් ඇතිවෙයි. ඒ අවස්ථාව අපි දුක හැටියට හඳුනා ගන්නෙමු.මෙන්න මේ නිසා දුක්ඛ කියන වචනයෙන් සාමාන්‍ය ලෝකයා හඳුන්වන සැපත්, සතුටත්, සොම්නසත්, ආදරයත්, ලෙන්ගතුකමත්, බැඳීමත්, හමුවීමත් ඒ සියල්ලත් දුක්ඛ කියන වචනය යටතේ ම අප විසින් තේරුම් ගතයුතු වෙනවා.

## වෙනස්වීම නුවණින් දැකීම

එහි දී සැප, සොම්නස, සතුට, හමුවීම, ආදරය, ලෙන්ගතුකම, මේ සියල්ලත් දුකක් හැටියට ම අප විසින් විඳිය යුතු දැයි කෙනෙක් ප්‍රශ්න කළ හැකි ය. නැත. අප විසින් ඒ සතුට, සොම්නස ලෙස පරිහරණය කරන හෝ අත්විඳින සියල්ල ම ස්ථිර නොවන බවත්, අපට ඕනෑ ආකාරයෙන් නොපවත්නා බවත්, තේරුම් ගෙන මොනයම් වෙලාවක හෝ එය වෙනස්විය හැකි බව නුවණින් දැක හැකිනාක් දුරට පස් පව් දස අකුසල්යන්ගෙන් බැහැරව සීල සමාධි ප්‍රඥ ගුණ වඩන ජීවිතයක් පවත්වා ගැනීමට ධර්මය තුළින් පුද්ගලයා උනන්දු කරවයි.

## තමන්ගේ කරගන්නා දුක

මෙහි දී සම්මතය තුළ හැබෑවට ම ඔබ විසින් ලබන හැඬීම්, වැළපීම් නොලැබීම්, වෙන්වීම් දුක්ඛ දෝමනස්ස තරහව වෛරය ඉදිරියේ දී පවා දුකේ කොටසක් හැටියට හඳුනාගන්නවා. හැබැයි ඒ දුක තමාගේ බවට පත් නොකොටගෙන හේතූන්ගේ ප්‍රතිඵලයක්, විපාකයක් ලෙස ඒවා දකිමින් හේතූන්ගේ වෙනස්වීමෙන් මේ සම්මුතියේ පවත්නා දුක ද වෙනස්වන බව දැක සිත මධ්‍යස්ථ ව උපේක්ෂාවෙන් සංසිඳුවා ගන්නට අවස්ථාවක් සැලසෙනවා.

මේ ගැඹුරු අදහසක්, කතාවක් ලෙස ඔබට දැනුනත් පරමාර්ථ ධර්ම අවබෝධය ඔස්සේ අපට ජීවිතයේ එවැනි උපේක්ෂා තත්ත්වයකට පත්කර ගැනීමට අවස්ථාව සලසා ගන්නට පුළුවනි. කෙටියෙන් සඳහන් කරන්නේ නම්, ඔබ සම්මුතියේ සතුටක් ලෙස පරිහරණය කරන හෝ ලබන දේ තණ්හා මද මාන දිට්ඨියෙන් තොරව පරිහරණය කරන්න.

**ඉතිරි කොටස ඇසළ අවඅටවක පෝද (ජූලි 12) පත්‍රයේ පළවේ.**

# ලංකාවේ බෞද්ධ ස්තූප



**බෞද්ධ විහාරස්ථානයක ඇති විහාරාංග අතර මුල් තැන හිමිවන්නේ ස්තූපයටයි. අනෙකුත් විහාරාංග වන බෝධීන් වහන්සේ හා බුදු මැදුරට ප්‍රථම වන්දනා කරනු ලබන්නේ ස්තූපය හෙවත් චෛත්‍යයටයි. සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කර ඇති බැවින් වන්දනා කරන්නන් විසින් එසේ පළමුව වන්දනා කරනු ලබයි. සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් නොකළ ද එසේ පළමුවෙන් චෛත්‍යයට වන්දනා කිරීම බෞද්ධ ජනයාගේ සිරිතකි.**

ද්‍රෝණ බමුණා විසින් බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු බෙදන ලද සර්වඥ ධාතූන් වහන්සේලා ලබාගත් රජවරුන් විසින් ඒ ඒ ප්‍රදේශවල සර්වඥධාතු තැන්පත්කොට චෛත්‍යයන් තනවන ලදී. චෛත්‍ය වන්දනාව ඉතාම ජනප්‍රිය ව පැවැති යුගයක් ලෙස ධර්මාශෝක රාජ්‍ය සමය සඳහන් වේ.

මිහිඳු මහරහතන් වහන්සේගේ අනුශාසනා පෙරදැරිව ඇරැඹි ශ්‍රී ලංකාවේ ස්තූප නිර්මාණය අප රටට ආවේණික ලෙස විවිධ වෙනස්කම් සහිත ව විකාශය වූ බව දැක්වේ. මිහිඳු මහරහතන් වහන්සේ බුදු දහම රැගෙන ඒමෙන් පසු තනවන ලද ශ්‍රී ලංකාවේ ඓතිහාසික වශයෙන් පැරැණිම චෛත්‍ය ථූපාරාමය යි. ථූපාරාමය තනවන ලද්දේ එකල ලක් දෙරණ රජ කළ දේවානම් පියතිස්ස රජතුමා විසිනි. ඓතිහාසික වැදගත්කම අනුව ථූපාරාමය පැරැණි වූව ද, මහියංගනය දාගැබ හා ගිරිහඬු සෑය ඊට බොහෝ කලකට පෙර තනවන්නට ඇතැයි විශ්වාසයක් ද පවතී. එහෙත් පුරා විද්‍යාත්මක ව ඒ බැව් සනාථ වී නොමැත.

ඉන් පසු උත්තිය රජතුමා විසින් මිහින්තලේ අම්බස්ථල චෛත්‍ය කරවන ලදී. දුටුගැමුණු රජතුමා තැන වූ රුවන්මැලි මහා සෑයෙන් මහා ථූප තැනීමේ ආරම්භය සිදු වූ බව සැලකේ. වැඩිම සර්වඥ ධාතූන් වහන්සේ, එනම් ද්‍රෝණයක් ධාතූන් වහන්සේ තැන්පත් කොට තැනවීම නිසා රුවන්මැලි සෑය මහා සෑය නමින් ද හඳුන්වයි.

පසු කාලයේ දී චෛත්‍යයන්ට අදාළ විවිධ අංග වඩාත් අලංකාර අයුරින් තනවන ලදී. එනම් වාහල්කඩ, පේසා වළලු, හතරැස් කොටුව, දේවතා කොටුව, කොත් කැරැල්ල, කොරවක්ගල සහ සඳකඩ පහණයි. ඒවා ද වරින් වර වෙනස්වීම්වලට ලක්විය. කනිට්ඨතිස්ස රජු අභයගිරිය චෛත්‍යයට වාහල්කඩ සතරක් ද, ගජබා රජු විසින් පසුකාලීන ව ඊටම වාහල්කඩ සතරක් ද ඉදිකළ බව සෙල් ලිපියක සඳහන් වේ.


චෛත්‍යයක ඇති ප්‍රධාන අංගයන්ට යම්කිසි වූ අර්ථයක් ගැබ්වී ඇත.

**පාදම –**
අසූහාර දහසක් වූ ශ්‍රී සද්ධර්මස්කන්ධය යි.
**පේසාවළලු –** ත්‍රිවිධරත්නය යි.
**ගර්භය –**
සත්තිස් බෝධි පාක්ෂික ධර්මය යි.
**හතරැස්කොටුව –**
චතුරාර්ය සත්‍යයයි.
**දේවතා කොටුව –** දිව්‍ය ලෝකයි.
**කොත් කැරැල්ල –**
නවාංග සත්ථු ශාසනය යි.

**කොත –** නිර්වාණයයි. මෙම චෛත්‍ය අංගයන්ට අමතරව තිබිය යුතු අංගයන් කිහිපයක් ද වේ. ඒ සලපතල මළුව, වැලි මළුව, වැලි මළුවේ ප්‍රාකාරය, වාහල්කඩ, පාද ද්‍රෝණි, තොරණ, කොරවක්ගල, හත්ථි ප්‍රාකාරය, ථූපඝර, කැටයම් ආදී වශයෙනි.

දීපා පෙරේරා

# සීලව මහරහතන් වහන්සේගේ උදානය





පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ සහ අනුශාසක

**කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි**

**බුද්දක නිකායට අයත් ථේර ගාථා නම් පොත් වහන්සේගේත් එහි අට්ඨ කතාව නම් වූ පරමත්ථදීප නම් පොත් වහන්සේගේත්, ඒ රහතන් වහන්සේලාගේ අසිරිමත් විස්තර සඳහන් වෙනවා.**

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ප්‍රමුඛ සංගීතිකාරක මහරහතන් වහන්සේලා ථේර ගාථා පොත් වහන්සේගේ තිදන ගාථාවල රහතන් වහන්සේලාගේ උදන ගාථා හඳුන්වා දී ඇත්තේ මෙලෙස යි. "ඒ රහතන් වහන්සේලා සිත දියුණු කර ගත්තේ මේ ධර්මයෙන් ම යි. උන්වහන්සේලා තම තමන් ගැන කියන මේ ගාථාවන් හොඳින් අසාගෙන ඉන්න. උන්වහන්සේ නොයෙකුත් සමාපත්ති වලින් යුක්තයි. සැම දුකකින් ම නිදහස් වුණ ඒ රහතන් වහන්සේ සැබැවට ම ප්‍රඥාවන්ත.යි. අලසකමකින් තොරයි. ඒ රහතන් වහන්සේ ධර්මය ගැන නුවණින් සලකාගෙනමයි මේ ගාථාවන් දේශනා කොට වදාළේ. අද අප ඉගෙන ගන්නේ සීලව නම් මහරහතන් වහන්සේ වදාහළ උතුම් උදානයක් ගැනයි.

උන්වහන්සේ අතීත බුද්ධ ශාසනවල දී ධර්මාවබෝධය පතා කුසල් දහම් රැස් කර ගත්තා. අපගේ ශාස්තෘන් වහන්සේගේ කාලයේ දී රජගහ නුවර බිම්බිසාර මහරජුගේ පුතු ලෙස ඉපිද සීලව කුමරු නමින් ප්‍රකට වුණා. තරුණ වියට පත් ඒ කුමරු මරා දැමීමට තම සහෝදරයා වූ අජාසත් රජු තීරණය කළා. රජතුමා සීලව කුමරු චණ්ඩ ඇතෙකු පිට නංවා මැරවීමට නොයෙකුත් උපක්‍රම යෙදුවත් ඒ සියලු ක්‍රම අසාර්ථක වුණා. පශ්චිම භවිකයා ( අවසන් භවයට පැමිණි පුද්ගලයා) රහත් නො වී කිසිසේත් ම මරණයට පත් නො වන බැවින් අජාසත් රජුගේ ඝාතන උපක්‍රම වැළකී ගියා.

සීලව කුමරුට සිදු කරන උපද්‍රව දිවැසින් දුටු භාග්‍යවතුන් වහන්සේ මුගලන් මහරහතන් වහන්සේ අමතා "සීලව කුමරු මෙහි රැගෙන එන්න" යැයි වදාළ සේක. තෙරණුවෝ සෘද්ධි බලයෙන් මහා හස්තියා සමගින් ම කුමරු භාග්‍යවතුන් වහන්සේ වෙත රැගෙන ආවා. ඔහුගේ ඉන්ද්‍රිය ධර්මයන්ට ගැළපෙන ලෙස භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කළ සේක.

ධර්ම ශ්‍රවණයෙන් ලැබූ ශ්‍රද්ධා ඇති සීලව කුමරු ගෞතම බුදු සසුනේ උතුම් පැවිදි භාවය ලබා ගත්තා. මනාකොට සසුන් පිළිවෙත් පුරා සමථ විදර්ශනා වඩා නොබෝ දිනකින් ම උතුම් අරහත්වය සාක්ශාත් කළා. සීලව තෙරුන් කොසොල් රට වාසය කරන බව ඇසූ අජාසත් රජතුමා උන්වහන්සේ ඝාතනය කරන්නැයි රාජ පුරුෂයන්ට නියෝග කළා. තෙරුන් වහන්සේ සමීපයට ගිය ඒ රාජ පුරුෂයින් සීලව තෙරුන් වහන්සේගෙන් දහම් අසා හටගත් සංවේග ඇතිව තෙරුවන් කෙරෙහි පැහැදී පැවිදි වුණා. උන්වහන්සේලාට අනුශාසනා කිරීම පිණිස සීලව මහරහතන් වහන්සේ සීලයෙහි අනුසස් ඉස්මතු කෙරෙන මෙම ගාථා වදාළ සේක.

- මේ බුදු සසුනේ පුහුණු කරන්නට ඕනෑ සීලයම යි. මේ ජීවිතයේ දී හොඳට සිල් රැක ගත්තොත් සියලු සම්පත් ලැබෙනවා.
- නුවණ තිබෙන පුද්ගලයා සිල් රකින්නට ඕනෑ සැප තුනක් බලාගෙනයි. ඒ ප්‍රශංසාව, ධන ලාභය, හා සුගතියේ ඉපදී සතුටුවීමයි.
- දුශ්ශීල පුද්ගලයා ලබන්නේ ගැරහීමත්, අපකීර්තියක් පමණයි. සිල්වත් පුද්ගලයා නිතර ම ගුණ කතාවත් ප්‍රශංසාවත් ලබනවා.
- මුලින්ම පිහිට වෙන්නේ සීලය යි. සීලය කියන්නේ යහපත් ගතිගුණවලට හරියට අම්මා කෙනෙක් වගේ. සියලු ගුණ ධර්මවල ප්‍රමුඛයා සීලය යි. එනිසා සීලය පිරිසුදුව තබා ගන්න ඕනෑ.
- සිත මහ මුහුද නම්, සීලය වෙරළ යි. සතුටත්, සංවරයත් ලබාදෙන සීලය සැම බුදුවරුන්ගේ ම පුණ්‍ය තීර්ථය යි. ඒ නිසා සීලය පිරිසුදුව තිබෙන්න ඕනෑ.
- සීලය කියන්නේ අසහාය බලයක්. උත්තම ආයුධයක්. ලස්සන ආභරණයක්. අද්භූත ඇඳුමක්.
- සීලය කියන්නේ මහේශාක්‍ය පාලමක්. අතිඋතුම් සුවඳක්. දස දිශාවට ම හමාගෙන යන ශ්‍රේෂ්ඨ සුවඳ විලවුන් කියන්නේ සීලයට යි.
- සීලය කියන්නේ ගමනක් යන කෙනෙකුගේ රසවත් බත් මුලක්. උතුම් ගමනකට හොඳ විසඳුමක්. දස දිශාවේ ගමන් කළ හැකි හොඳ වර්ගයේ වාහනයක්.
- ජීවිතය නපුරු කර ගත්තොත් මේ ජීවිතයේ දී ම නින්ද ලැබෙනවා. පරලොව දී අපායේ ඉපදිලා දුක් විඳින්නට සිදු වෙනවා. සීලයක් නැති එකඟ වූ සිතක් නැති අඥාන පුද්ගලයා හැම තැනක දී ම දුකට ගොදුරු වෙනවා.
- ජීවිතය යහපත් කර ගත්තොත් මේ ජීවිතයේ දී ම කීර්තිය ලැබෙනවා. පරලොව දී සුගතියේ ඉපදී සතුටු වෙනවා. සිල් රැකීමෙන් සිත එකඟ කරගෙන නුවණ ලබා ගත් පුද්ගලයා හැම තැනක දී ම සතුටු වෙනවා.
- මේ ශාසනයේ සීලය අග්‍ර දෙයක්. නමුත් උතුම් ම දෙය ප්‍රඥාව යි. මිනිසුන් අතරින්, දෙවියන් අතරින් සීලයත්, ප්‍රඥාවත් යන දෙකෙන් ජය ලබන්නට පුළුවන්.

ශ්‍රාවකයෙකු බුදු සසුනේ උතුම් පැවිදි බව ලැබූ පසුව ශාස්තෘන් වහන්සේගෙන් සීල සම්පත්තිය ඇතිකර ගැනීම පිණිස අනුශාසනා ලැබෙන්නේ මෙසේ යි.

**සිත, මහ මුහුද නම්, සීලය වෙරළ යි**

**සීලය කියන්නේ මහේශාක්‍ය පාලමක්. අතිඋතුම් සුවඳක්**

"පින්වත් භික්ෂුව එන්න දැන් ඔබ සිල්වත් වෙන්න. ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් සංවර වෙන්න. ඇවතුම් පැවතුම් යහපත් කර ගන්න. අනුමාත්‍ර වරදේ පවා බිය දකිමින් වාසය කරන්න. සමාදන් වූ ශික්ෂාපදවල හික්මෙන්න." මෙලෙසින් සමාදන් වූ සිල්පද ශ්‍රද්ධාවන්ත ශ්‍රාවකයන් ජීවිතය නැසුණත් කඩ නො කරන බව පහාරාද සූත්‍රයේ දී භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "පහාරාදය, මාගේ ශ්‍රාවකයන් ජීවිතය හේතුවෙන්වත් තථාගතයන් වහන්සේ විසින් පනවන ශික්ෂාපද නො ඉක්ම වන්නේ ය" කියායි. එසේනම් නිවන් මග පරිපූර්ණ කළ අප්‍රමාණ ශාස්තෘ ගෞරවයකින් සහ අප්‍රමාණ සීල ගෞරවයකින් යුතු නිකෙලෙස් මහ රහතන් වහන්සේ නමකගේ සීල පාරිශුද්ධිය කෙතරම් උත්තරීතර ද? සීලව මහ රහතන් වහන්සේ මෙසේ සීලයේ අනුසස් මෙතරම් පහද දෙන්නේ තමන් වහන්සේ ද ඒ පාරිශුද්ධ සීල සම්පත්තියේ පිහිටා සිටිමිනි.

පොදුවේ ගත් කල සීලවන්ත ශ්‍රාවකයෙකුට හිමිවන සීල සම්පත්ති පහක් ඇති බව භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කොට වදාළ සේක.

පින්වත් මහණෙනි, සිල්වතාගේ සීල සම්පත්ති පහකි.

සිල්වත් පුද්ගලයා ගේ අප්‍රමාදී දිවි පැවැත්ම නිසා මහත් වූ භෝගස්ඛන්ධයක් ලැබේ, සිල්වත් පුද්ගලයා ගැන කල්‍යාණ කීර්ති රාවයක් පැතිරී යයි, ඕනෑම පිරිසක් මැදට සිල්වත් පුද්ගලයා බිය රහිත ව විශාරද ව එළඹෙයි, සිල්වත් පුද්ගලයා සිහි මුළා නොවී කළුරිය කරයි, මරණින් මතු සුගති ලෝකයෙහි උත්පත්තිය ලබයි.

ශාස්තෘන් වහන්සේ වදාහළ මෙම ආනිශංස සීලව මහරහතන් වහන්සේ ගාථා දෙලොසකින් මනාකොට පහද දුන්නා. ඒ උතුම් ශ්‍රාවකයින් ධර්මය ම ඉස්මතු කරන අයුරු කෙ තරම් අසිරිමත් ද?" සංඝං සරණං ගච්ඡාමි" යනුවෙන් අපි සරණ යන ඒ ශ්‍රාවක සංඝ රත්නය කෙ තරම් ශ්‍රේෂ්ඨ ද?

"පින්වත් මහණෙනි යම්තාක් සත්ත්ව සන්නිවාස තිබේ ද, යම්තාක් භවාග්‍ර තිබේද ඒ සියල්ලට ම ඉහළින් අග්‍ර වන්නේ රහතන් වහන්සේලා ය. ශ්‍රේෂ්ඨ වන්නේ රහතන් වහන්සේලා ය." යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ වදාළේ ඒ උත්තරීත්වය යි.

රහතන් වහන්සේලාගේ ජීවිත පැවැත්ම එතරම් ම සැහැල්ලු ය. එතරම් ම නිදහස් ය. මේ ලෝකය තුළ ඉතාමත් ම නිදහසේ ඇවිද යන්නේ රහතන් වහන්සේ පමණි. ඒ රහතන් වහන්සේලා සතර සතිපට්ඨානය තුළයි ජීවත් වන්නේ. උන්වහන්සේලා තණ්හාවට ඇලෙන්නේ නැහැ. විල අතහැර යන හංසයන් වගේ කුඩා මහත් හැම දෙයක් ම අත්හැර දානවා." යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළේ ඒ නිකෙලෙස් සුන්දරත්වය ගැනයි.

නයනා නිල්මිණී



# ප්‍රමාදයේ බිය දකිමු

## අප්‍රමාදය අමා වදනකි

**ප්‍රමාදය පරිහානියටත්, අප්‍රමාදය දියුණුවටත් හේතු වේ. ප්‍රමාදය අකුසලයකි. පාපයකි. අප්‍රමාදය කුසලයකි. පිනකි. අප්‍රමාදය අමා වදනකි. ප්‍රමාදය මාර ශාපයකි.**

බෞද්ධයාගේ හස්තසාර දහම් අමාව වන ධම්මපදයේ පමණක් නොව ත්‍රිපිටක සාහිත්‍යයේ බොහෝ සූත්‍රවල අප්‍රමාදයේ අනගි ශක්තිය වර්ණනා කර ඇත. එපමණක් නොව ප්‍රමාදයේ ආදීනව ද ඒ සමඟ ජනතාවට ධර්මය කරුණු වශයෙන් ඉදිරිපත් කර ඇත. අපේ බෝධිසත්වයන් දස පාරමී ධර්ම පුරණ සමයේ වීර්යය පාරමිතාව පිරූ බව අපි දනිමු. ප්‍රමාදය දුරලා අප්‍රමාදී ව විමුක්ති සාධනයේදී වීර්යය පාරමිතාව බෝසතුන්ට මහත් අධිෂ්ඨාන ශක්තියක් විය. ප්‍රමාදය කුසීත පුද්ගලයාගේ ආභරණයකි. අප්‍රමාදය වීර්යයවන්ත සත්පුරුෂයාගේ දෙලොව ජීවිතය ජයගන්නා මුතුහරකි.

අප්‍රමාදය ලොකු - කුඩා සැමට අභියෝග ජයගත හැකි වටිනා මෙවලමකි. අධ්‍යාපනය හදාරණ දරුවාට, රැකියා නියුක්තිකයාට මෙලොව පරලොව ජීවිතය ජය ගැනීමට දහම් සරණ සොයන නැණවතාට අප්‍රමාදී ව වැඩකිරීම තරම් ශක්තියක් තවත් නොමැති තරම් ය. ඒ නිසාම බුදු දහම පුරාම මේ පිළිබඳ වූ සාරමය කරුණු අන්තර්ගත වන අතර අප්‍රමාදයට බුදු දහම තුළ වටිනාකමක් ද එකතු කර ඇත. බුදුන් වදාළ ධර්මය ද හීන වීර්යය ඇති කුසීතයාට නොව වීර්යය වන්ත අප්‍රමාදියාට බව දීඝ නිකායේ දසුත්තර සූත්‍රයේ සඳහන් වේ.

අප්‍රමාදය නිවනට කෙලෙස් නැසීමට මාර්ගය වේ. ප්‍රමාදය මරණයට අකුසලයට හේතු වේ. අප්‍රමාදී වූවෝ නොමියෙන බවත්, ප්‍රමාද වූවෝ ජීවත් වුව ද, මළවුන් මෙන් කටයුතු කරන බව බුදු දහමේ පිළිගැනීම වේ. මේ පිළිබඳව විශේෂයෙන් සලකා බලා බුද්ධිමත් ආර්යය පුද්ගලයා අප්‍රමාදය රුචි කරන බවත්, අප්‍රමාදයේ සතුටු වන බවත්, සම්මත පිළිගැනීමකි.

උත්සාහයෙන් අප්‍රමාදයෙන් යුක්ත පුද්ගලයාගේ පංච ඉන්ද්‍රිය සංවර වේ. හෙතෙම ප්‍රඥවන්තයෙකි කාම ඕඝ, භව ඕඝ, ආදී සංසාර සැඩ පහරට අදාළ ඕඝ හෙවත් මහ කෙලෙස් ප්‍රවාහය තරණය කර අහරන්ත ප්‍රතිපදාව ජයගැනීමට ද අප්‍රමාදය ඉවහල් වේ. නුවණැත්තා අප්‍රමාදය තුළින් සංසාර දුක ජය ගන්නා අතර, දුෂ්ප්‍රාඥ මෝඩයා ප්‍රමාදයේ ගැලී සංසාර දුකට තව තවත් නැඹුරු වේ. ඒ නිසා බුදුරදුන් වදාළේ ප්‍රමාදයේ නිරත නොවී අප්‍රමාදයේ නිරත වන ලෙස ය. ප්‍රඥවන්ත මිනිසා අප්‍රමාදයෙන් ප්‍රමාදය ඉවත දමයි. මහරහත් භූමිකාව තුළ අප්‍රමාදය වටිනා ආත්ම ශක්තියක් බව රසවාහිනී ,සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාවලිය වැනි අපේ පැරණි බණ කතා වලින් හෙළි වේ. ප්‍රමාදය දුර්වල දුබල අශ්වයකුට උපමා කිරීමෙන් අප්‍රමාදයේ ඇති අයෝමය ශක්තිය අවබෝධ කරගත හැකි ය.

අප්‍රමාදය නිසා ශක්‍ර දේවේන්ද්‍රයා දෙවියන් අතර ශ්‍රේෂ්ඨත්වයට පත් වූ බව ධම්මපදට්ඨ කතාවේ ශක්‍ර දේවේන්ද්‍ර කතා වස්තුවෙන් හෙළි වේ. ප්‍රමාදයේ බිය දක්නා බුද්ධ ශ්‍රාවකයා සක්කාය දිට්ඨිය ආදී සංයෝජන ධර්ම දුරු කිරීමට පෙළඹෙන්නේ අප්‍රමාදය නිසා බවද, ධම්මපද අප්‍රමාද වර්ගයෙන් හෙළිවේ. මේ අනුව මෙලොව පරලොව ජයගැනීමට ද, ලෞකික ලෝකෝත්තර දියුණුව උදාකර ගැනීමට ද බුදුදහම පෙන්වාදී ඇති ප්‍රායෝගික විසඳුමක් ලෙස අප්‍රමාදය හැඳින්විය හැකි ය. මෙය බුදුදහමේ මූල ධර්මයක් ලෙස ද, සිද්ධාන්තයක් ලෙස ද භාවිත වී ඇති ආකාරය සූත්‍රගත මූලික කරුණු වලින් අනාවරණය වේ.

අප ගෞතම බුදුරදුන් සිය පන්සාළිස් වස මුළුල්ලේ ද අග්‍රශ්‍රාවක ආදී අරහත්ත ශ්‍රාවකයෝ ද භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසට අවවාද අනුශාසනා කළේ අප්‍රමාදීව කුසල ධර්මයන් සම්පූර්ණ කරන ලෙස ය. ඒ කුමක් සඳහාද යත් සංසාර දුක තරණය කර නිර්වාණාවබෝධය සපල කර ගැනීම පිණිස ය. අප බුදුරදුන් අවසාන බුදුවදන ඔස්සේද අනුශාසනා කළේ අප්‍රමාදයේ අගය ලොවට ප්‍රකට කිරීමට ය. සංස්කාර ධර්මයෝ නැසෙන සුළුය. විනාශ වන සුළුය. ඒ නිසා අප්‍රමාදී ව කුසල් සම්පාදනය කළ යුතුය. තමාට පිහිට වන්නේ තමා පමණයි. අප්‍රමාද වේ. සිහි බුද්ධියෙන් ක්‍රියා කරව්. සිල්වත් ගුණවත් බව වඩව්. සම්‍යක්ව සංකල්පනාවන්ගෙන් සිත රැකගෙන මෙම ශාසනය තුළ අප්‍රමාදී ව කටයුතු කර ජාති ජරා මරණ දුක්ඛ දෙමනස්සයන්ගෙන් පිරි සංසාර දුකෙන් නිදහස් වීමට කටයුතු කරන ලෙස බුදුරදුන් අවසාන වශයෙන් ඉල්ලා සිටී බව දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයෙන් ද අනාවරණය වේ. මෙහිදී සාධු ජනතාවට අප්‍රමාදයේ මෙලොව පරලොව සාධනීය ගුණය තීව්‍ර වන බව පැහැදිලි ය.


බුදු දහමේ පෙන්වා දී ඇති ලාමක ධර්ම අතරට ප්‍රමාදය ද අයත් වේ. ලෝභය, ද්වේෂ ය, මෝහය ආදිය ලාමක ධර්ම වලට අයත් වේ. එසේ නම්, අප්‍රමාදය අයත් වන්නේ අලාමක ධර්මයක් ලෙසටය. මදය , ප්‍රමාදය ආදී සෙසු ලාමක ධර්ම නිසා මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය අප අතරින් ඈතට ගමන් කරයි. එය මෙලෙව පරලොව සසර ගමනට බාධාවකි. ප්‍රමාදය වෙනුවට අප්‍රමාද ආදී අලාමක ධර්මතාවලට අනුව කටයුතු කිරීමෙන් චතුරාර්ය සත්‍ය අවබෝධයට මනා පිටිවහලක් උදාවන බව මජ්ඣිම නිකායේ ධම්ම දායාද සූත්‍රයෙන් ද අනාවරණය වේ. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ , උද්ධච්ච, කුක්කුච්ච සහ විචිකිච්ඡා යනුවෙන් නිවන් මඟ අවුරාලන ධර්මතා පහක් බුදු දහමේ ඉගැන් වේ. මේවා දුරු කරගැනීමට උපයෝගී වන්නේ අප්‍රමාදී ව කුසල ධර්ම සම්පාදනයෙනි. ප්‍රමාදී පුද්ගලයා පංචනීවරණ ධර්මවල ගොදුරක් බවට පත්වන බව මජ්ඣිම නිකායේ සුභ සූත්‍රයෙන් ද අනාවරණය වේ. පංච නීවරණ යනු දෙලොව පිරිහෙන නිවන් මග වසාලන ප්‍රබල කෙලෙස් පහකි.

දිනක් බුදුරදුන් කොසොල් මහ රජතුමා හමු වූ අවස්ථාවේ අප්‍රමාදයේ අගය රජුට පැහැදිලි කළසේක. යම් දහමක් මෙලොව සහ පරලොව අභිවෘද්ධිය යන දෙලොව අභිවෘද්ධිය සලසන්නේ නම්, ඒ එකම දෙය අප්‍රමාදය පමණි. ඇවිදින ප්‍රාණීන්ගේ පිය සටහන් සියල්ල ඇතාගේ පා සටහන තුළට ඇතුළත් වීමට හැකි වේ ද. හස්ති රාජයාගේ පා සටහන අග්‍ර බවට පත්වේද එපරිදි අප්‍රමාදය ද එලෙස සියලු ධර්මතා අතර අග්‍රස්ථානයට පත්වන බව සංයුක්ත නිකායේ අප්‍රමාද සූත්‍රයේ සඳහන් වේ.

යම් ධර්මතාවයක් ඉමහත් අනර්ථය පිණිස මෙලොව - පරලොව පරිහානිය පිණිස ඉවහල් වේ නම්, ඒ එකම ධර්මය ප්‍රමාදය නම් වේ. ප්‍රමාදය මහත් අනර්ථය පිණිස අවැඩ පිණිස පවතින්නේ ය. යමක් මෙසේ ඉමහත් අනර්ථය පිණිස , මෙලොව පරලොව සුබසිද්ධිය දියුණුව පිණිස පවත්නේ ද අප්‍රමාදය තරම් ඒ එකම ධර්මයක්වත් ලොව නොමැති ය. අප්‍රමාදය එසේ මහත් අර්ථය පිණිස හිත වැඩ පිණිස පවතින එකම ධර්මතාවය බව අංගුත්තර නිකායේ පමාද වර්ගයේ සඳහන් වේ. මෙම කරුණු වලින් ද ඉහත සඳහන් ප්‍රස්තුතය මැනවින් අවධාරණය කර ඇත. ප්‍රමාදයේ දෝෂ නිර්මාණය වන තරමට අප්‍රමාදී ගුණය ආලෝකමත් වේ. අප්‍රමාදය ජීවිතය එළියකරන මහා ප්‍රදීපයකි. ප්‍රමාදය ගනදුර වැන්න.

කාය , දුශ්චරිතය දුරුකිරීමටත් කාය සුචරිතය වර්ධනයටත් වාග් දුෂ්චරිතය දුරුකිරීමට වාග් සුචරිතය වර්ධනයටත් මනෝ දුෂ්චරිතය දුරුකිරීමටත්, මනෝ සුචරිතය වර්ධනයටත් ඉවහල්වන්නේ අප්පමාදී කුසලතාවයි. මිථ්‍යා දෘෂ්ටිය දුරලා සම්මා දිට්ඨිය දියුණු කරගැනීමට ද අප්‍රමාදීව ක්‍රියාකිරීමේ වැදගත්කම අංගුත්තර නිකායේ අප්‍රමාද සූත්‍රයේ අවධාරණය කර ඇත.

මේ අනුව අප්‍රමාදී ව ක්‍රියා කර මෙලොව සහ පරලොව ජය ලබාගැනීමට සැම දෙනාම අධිෂ්ඨාන කර ගත යුතු ය.




හෝමාගම පුරාණ විහාරධිපති
සහකාර අධ්‍යපන අධ්‍යක්ෂ(පිරිවෙන්)
**මාදෝවිට වජිරබුද්ධි හිමි**

> **අප්‍රමාදය නිවනට, කෙලෙස් නැසීමට මාර්ගය වේ. ප්‍රමාදය මරණයට, අකුසලයට හේතු වේ. අප්‍රමාදී වූවෝ නොමියෙන බවත්, ප්‍රමාද වූවෝ ජීවත් වුව ද මළවුන් මෙන් කටයුතු කරන බවත් බුදු දහමේ පිළිගැනීම වේ.**

**හේමමාලා රන්දුනු**

# උත්තරීතර සැනසුම් මාර්ගය



**ලොවුතුරා බුදුරජාණන් වහන්සේ බරණැස් නුවර ඉසිපතනාරාමයේ දී ප්‍රථමයෙන් චතුරාර්ය සත්‍ය දේශනා කළා, දම්සක් සූත්‍රය, සාමුක්කංසික දේශනාව වශයෙන් ද චතුරාර්ය සත්‍ය දේශනාව හඳුන්වනවා.**

දුක්ඛ සත්‍ය යනුවෙන් සඳහන් කළ විට කාටත් තේරෙනවා. ඉපදීම යනු මහා දුකක්. මව් කුසේ වාසය කරන කාලයේ මවත්, දරුවාත් අපමණ දුක් වින්දා. සතර අපාගත වුවත් සීමාවක් නැතිව දුක් විඳිනවා. අංග විකල, මන්ධ බුද්ධික අය කොපමණ දුක් විඳිනවා ද? උපතින් පසු සිදුවන අපහසුකම් නිසා කොපමණ දුක් විඳිනවා ද? අධ්‍යාපනය, රැකියාව, ගේ දොර, ඇඳුම් පැළඳුම් නැතිව කොපමණ දුක් විඳිනවා ද? මේ සියල්ල ඇත්තේ ජාති දුක නිස යි. ජරා ජීර්ණ ව, කෙස් පැසී, දත් වැටී, ඇඟ රැළි වැටෙනවා. ඔත්පල වෙනවා. ලෙඩ රෝග ආදී නානා විධියේ රෝග පීඩාවන්ට පත් වෙනවා. එය ව්‍යාධි දුක යි. ඉන් නොනැවතී මරණයට පත් වෙනවා. එයට සැවොම බය යි. උපත සහ මරණය අතර තවත් දුක් රාශියක් තිබෙනවා. අඬනවා, සෝක දුක. වැළපෙනවා, පරිදේව දුක. කායික – මානසික දුක, දැඩි ආයාසය, කැමැති දෑ නොලැබීමේ දුක, අසද්පුරුෂයන් සමඟ එක්වීමේ දුක, සද්පුරුෂයන්ගෙන් වෙන්වීමේ දුක, කෙටියෙන් ම සඳහන් කරනවා නම්, මේ ශරීරය ආදී පංච උපාදානස්ඛන්ධ දුක් ආදී සියල්ල ම දුක්ඛ සත්‍යයට අන්තර්ගත යි. ඒ නිසා සැවොම එය දුකක් වශයෙන් වටහාගෙන දුක්ඛ සත්‍ය අවබෝධ කර ගැනීම සඳහා මහන්සි ගත යුතු යි.

සමුදය සත්‍ය යනු තණ්හාව යි. දුකට හේතුව යි. උපත ලබන්නේ, දුක් විඳින්නේ මොකද? යනුවෙන් ඇසුවොත් තණ්හාව නිසා කියනවා. එහෙමනම්, පින්වතුනි දුකට මුල තණ්හාව යි. එය සමුදය සත්‍ය යනුවෙන් සඳහන් කරනවා. කාම තණ්හාව යනු පංචකාම වස්තූන් පිළිබඳ ඇති තෘෂ ්ණාව යි. භව තණ්හාව යනු භවයට ඇති තෘෂ්ණාව යි. විභව තණ්හාව යනු මරණින් මතු උපත නොලබන අදහස යි. එය භයානක මතයක් වන අතර උච්ඡේදවාද දෘෂ්ටිය යි. කවදාකවකවත් මරණින් මතු උපත ලබන්නේ නැහැ යනුවෙන් කිසිවෙක් නොසිතන්න. උපත නොලබන්නේ රහතන් වහන්සේ පමණයි. එලෙස උච්ඡේදවාදී දෘෂ්ටියක් ගත්තොත් පංචානන්තරීය පව් වලට වඩා දරුණු යි. ඒ නිසා තම තමා මිසදිටුකම් අත්හැර දමා සම්මා දිට්ඨියේ පිහිටා කටයුතු කළ යුතු යි.

නිරෝධ සත්‍ය යනු දුක, තණ්හාව තියෙනවා, එයින් නිදහස් වීම, දුකින් නිදහස්වීම තණ්හාව ප්‍රහාණය කිරීමෙන් නිවන සාක්ෂාත් කරගත හැකි යි. දිගු කලක් දන් දීම, සිල් රැකීම, භාවනා කිරීම, ප්‍රඥාව දියුණු කිරීම, වීර්යය දියුණු කිරීම, ඉවසීම, සත්‍යවාදී බව, හොඳ අධිෂ්ඨාන තිබීම, මෛත්‍රී භාවනා කිරීම, මධ්‍යස්ථ බව ආදී කරුණු දහය දියුණු කළොත් මාර්ග ඵල නිවන් සුව ලබන්න පුළුවන්. නිර්වාණය ලෝකයේ තිබෙන උත්තරීතර සැනසුම් මාර්ගය යි. ඒ සැනසුම සොයාගෙන යි අප ගමන් කළ යුත්තේ.

දාන, සීල, භාවනා පින්කරගෙන ගමන් කරන්නේ නිර්වාණය අවබෝධ කර ගැනීමේ අදහස් ඇතිව යි. නිර්වාණ ධර්මය වාසනාවන්ත ධර්මයක්. නිර්වාණයට නාමයන් රාශියක් ඇති අතර ඉපදීමක් නැති නිසා නිර්වාණය අජාති නම් නිර්වාණය යි. ජරාවක් නැති නිසා අජර නිර්වාණය යි. ලෙඩ රෝග



අම්බලන්ගොඩ, කහව ගල්දූව ආරණ්‍ය සේනාසනයේ කම්මට්ඨානාචාර්ය ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද

**කහගොල්ලේ සෝමවංශ හිමි**

නැති නිසා අව්‍යාධි නිර්වාණය යි. මරණයක් නැති නිසා අමති වෙයි. ඇඬීමක් නැති නිසා අශෝක වෙයි. වැළපීමක් නැති නිසා අපරිදේව වෙයි. කායික දුකක් නැති නිසා අදුක්ඛ වෙයි. මානසික දුකක් නැති නිසා අදෝමනස්ස වෙයි. දැඩි ආයාසයක් නැති නිසා අනුපායාස වෙයි. රාගය නැති නිසා වීතරාග වෙයි. ද්වේශය නැති නිසා වීතදෝස වෙයි. මෝහය නැති නිසා වීතමෝහ වෙයි. කාමාශ්‍රව, භාවශ්‍රව, දිට්ඨාශ්‍රව, අවිද්‍යාශ්‍රව නැති නිසා නිර්වාණය අනාශ්‍රව යනුවෙන් ද සඳහන් වෙයි. ඒ නිසා නිර්වාණය ශාන්ත යි, ප්‍රණීත යි යනුවෙන් මෙනෙහි කළ යුතු යි. අපටත් මේ නිවන අවබෝධ වේවා යනුවෙන් සිතිය යුතු යි.

දාන, ශීල, භාවනා පින්කර දෙව් ලොව පතන්න එපා. රාජ සම්පත්, සක්විති සම්පත් පතන්න එපා, මේ පිනෙන් මට නිවන් සැප ලැබේවා, යන එකම පැතුමෙන් ඕනෑම පිනක් කිරීමෙන් නිවනට සමීප වෙයි. උපත ලැබීම අඩුවී යයි. කල්ප ගණනින් සසර කෙටි වෙයි. ඒනිසා කරන සියලුම පින්කම් නිවන් සුව පතාගෙන කළොත්, ඊටවඩා ඉහළ පැතුමක් ලොවේ නැහැ. එය ධර්මඡන්ද ප්‍රාර්ථනාව යනුවෙන් හඳුන්වනවා. එනම් නිර්වාණය ප්‍රාර්ථනා කිරීම යි.

බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේ ඒ තනතුරු ප්‍රාර්ථනා කළ නිසා තනතුරු සහිතව ම නිවනට ප්‍රවිශ්ඨ වුණා. එසේම අපත් හැකිතාක් පින් දහම් කර, නිවන් සුව පැතූ විට නිවනින් සැනසිය හැකි යි. සංසාරයේ කොතැන බැලුවත් දුක මිසක් සැප නැහැ. ඊළඟට නිවනට යා යුතු මඟක් තිබෙනවා. ඒ මාර්ගය ආර්ය මාර්ගය, විශුද්ධි මාර්ගය, නිවන් මාර්ගය, ආර්ය අෂ්ටාංගික මාර්ගය යනුවෙන් හඳුන්වනවා. මේ මාර්ගය නිවනට යන ඍජු මාවත යි. ඒ ගැන බුදුන් වහන්සේ කරුණු අටකින් අනු දැන වදාළා. හොඳ නුවණක් තිබීම සම්මා දිට්ඨිය යනුවෙන් ද, නිවැරැදි අදහස් සම්මා සංකප්ප, නිවැරැදි වචන සම්මා වාචා, නිවැරැදි වැඩ කටයුතු සම්මා කම්මන්ත, නිවැරැදි දිවි පැවැත්ම සම්මා ආජීව, නිවැරැදි උත්සාහය සම්මා වායාම, නිවැරැදි සිහිය සම්මා සති, නිවැරැදි චිත්ත සමාධිය සම්මා සමාධි ආදිය වෙයි.

මේ කරුණු අට කෙටිකළ විට සීල, සමාධි, ප්‍රඥා නම් වෙයි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප යනු ප්‍රඥාව යි. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යනු සීලයට නමක්. සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යනු සමාධියට නමක්. එවිට සීල, සමාධි, ප්‍රඥා යනු ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. ආර්ය අෂ්ටාංගික මාර්ගය යනු සීල, සමාධි, ප්‍රඥාව යි. එහෙමනම් බුදු දහම සීල, සමාධි, ප්‍රඥාවට අන්තර්ගත යි.


සැම කෙනෙකුම ඕනෑම පින්කමක් මේ කරුණු අට වැඩෙන සේ කළ යුතු යි. දන් හැන්දක් බෙදුවත්, සලාක දාන පිරිනැමුවත්, බණ පදයක් ඇසුවත්, මල්, පහන්, ගිලන්පස පූජාව, බුදුන් වැඳීම, ආදී සැම මොහොතකම මේ කරුණු අට හෙවත් සීල, සමාධි, ප්‍රඥා වැඩුණොත් පින බොහොම මහත්ඵල යි.

**"දිගු කලක් දන් දීම, සිල් රැකීම, භාවනා කිරීම, ප්‍රඥාව දියුණු කිරීම, වීර්යය දියුණු කිරීම, ඉවසීම, සත්‍යවාදී බව, හොඳ අධිෂ්ඨාන තිබීම, මෛත්‍රී භාවනා කිරීම, මධ්‍යස්ථ බව ආදී කරුණු දහය දියුණු කළොත් මාර්ග ඵල නිවන් සුව ලබන්න පුළුවන්. නිර්වාණය ලෝකයේ තිබෙන උත්තරීතර සැනසුම් මාර්ගය යි."**

**ජම්මිකා ප්‍රබෝධනී වැලිකල**

# නිවන් මගට මඟ පෙන්වන අටලෝ දහම





පොල්පිටිමූකලානේ පඤ්ඤසිරි හිමි

**ශ්‍රද්ධාවන්ත පින්වතුනි , ලෞකික ජීවිතයක් ගතකරන පුද්ගලයකුට සමාජයේ ජීවත්වන විට විවිධ ආකාරයේ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වෙනවා. ඒ නිසා බුදුරජාණන්වහන්සේ යම් කෙනෙකුට මේ සමාජයේ ජීවත් වීමට අවශ්‍ය කරන මානසික ශක්තිය ඇති කරදීම පිණිස උපකාරීවන කරුණු රාශියක් දේශනා කර වදාළා . ඒ අතර අටලෝ දහම පිළිබඳ කරන ලද දේශනාව අති විශිෂ්ටයි . මහා මංගල සුත්‍රයේ මෙසේ සඳහන් වෙනවා**

"ඵුට්ඨස්ස ලෝක ධම්මේහි
චිත්තං යස්සන කම්පති

යම් කෙනෙකුගේ සිත අටලෝ දහමින් කම්පා වෙන්න හොඳ නැහැ . මේ අටලෝ දහම යනු කුමක්දැයි අපි විමසා බලමු .ලෝකයේ සෑම කෙනෙකුටම මුහුණ දීමට සිදුවන ධර්මතා අටක් පිලිබඳවයි මෙහි සදහන් වෙන්නේ .

"ලාභෝ අලාභෝ අයසෝ යසෝච
නින්දා ප්‍රශංසාච සුඛංච දුක්ඛං"

ආදී වශයෙන් ඉපදුණු සත්ත්වයාට මේ වෙනස්වන කරුණු අටට මුහුණ දීමට සිදුවෙනවා .ලාභයක් ඇතිවුණොත් අලාභයක් ඇතිවෙනවා. ඒ වගේම කීර්තියක් ඇතිවුණොත් අපකීර්තියක් ඇතිවෙනවා. නින්දා ඇතිවුණොත් ප්‍රශංසා ඇතිවෙනවා. සැප ඇති වුණොත් දුක ඇති වෙනවා .මේවායින් ගැලවුණු කෙනෙක් මේ ලෝක ධාතුව තුළම නැහැ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා.

සම්පූර්ණයෙන්ම නින්දාවට පත් වූ කෙනෙක් මේ ලෝකයේ නැහැ. සම්පූර්ණයෙන්ම ප්‍රශංසාවට පත් වූ කෙනෙකුත් මේ ලෝකයේ නැහැ.එහෙමනම් අප හැම කෙනෙක්ටම අටලෝ දහමට මුහුණ දෙන්නට සිදුවන බව දැනගන්නට ඕනේ. අප කිසිම දෙයකින් කම්පාවට පත් වෙන්න හොඳ නැහැ .ඒ සඳහා අප දියුණු කළ යුතු ගුණාංගය උපේක්ෂාවයි. අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය උපේක්ෂාවයි.

බොහෝ දෙනෙකුට මෛත්‍රිය පතුරවන්න පුළුවන් . ඒ වගේම බොහෝ දෙනෙකුට අනුන්ගේ දුකේදී තම සිත කම්පනයට පත් වී ඒ අය කෙරෙහි කරුණාවෙන් කටයුතු කරන්නත් පුළුවන්. අන් අයගේ සැපතේදී ඊර්ෂ්‍යාව යටපත් කරලා සතුටු වෙන්නත් පුළුවන් . නමුත් බොහෝ පිරිසකට ජයගන්න අමාරුම දේ උපේක්ෂාවයි . මධ්‍යස්ථ ස්වභාවයට පත්වීමයි . එක්තරා අවස්ථාවකදී විදේශ රටක භාවනාව බොහෝ දියුණු කළා යැයි කියන භික්ෂුන්වහන්සේ නමක් සිංගප්පූරුවට වැඩම කළා.. ඒ අවස්ථාවේදී වීසා ලබාදෙන පිරිස උන්වහන්සේට සිංගප්පූරුවට ඇතුල්වීමට අවසර ලබා දුන්නේ නැහැ . එහිදී උන්වහන්සේ බොහෝ නොසන්සුන්තාවයට පත්වුණා . ඒ අවස්ථාවේදී තමයි උන්වහන්සේට අවබෝධ වෙලා තිබෙන්නේ තමන් උපේක්ෂාව දියුණු කළා යයි සිතා ගෙන සිටියත් දියුණු වෙලා නැහැ කියලා .

සමහරු කියනවා ඕනෑම ප්‍රශ්නයකට මම මුහුණ දෙනවා කියලා. ප්‍රශ්නයක් ඇතිවුනාට පසුවයි තේරෙන්නේ තමන්ට එය දරාගන්න බැහැ කියලා. සමහරු අටලෝ දහමින් අකම්පිත ව සිටීමේ නොහැකියාව නිසා තමන්ගේ ජීවිතයෙන් සමුගන්නවා . විශේෂයෙන්ම අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් විභාගයෙන් අසමත් වීම නිසා තමන්ට සිදුවුණු අලාභය ගැන හිතලා ජීවිතයෙන් සමුගන්නවා. ඇතැම් අය පවුල් ජීවිතවල තියන ප්‍රශ්න මුල් කරගෙන ජීවිතයෙන් සමුගන්නවා. මේ වගේ තමාගේ ජීවිතයෙන්ම වන්දි ගෙවන අය අද ඉන්නවා. ඒ නිසයි බුදුරජාණන් වහන්සේ අපට මේ කාරණාව මෙපමණ ගැඹුරින්ම අවධාරණය කර දේශනා කළේ.

වර්තමාන සමාජයේ මිනිස්සුන්ට දරාගැනීමේ ශක්තිය අඩුබවක් පෙනෙනවා. ඒ තත්වය මේ කාලයේදී වඩාත් වැඩියි . මේ තත්වයට මව්පියන්ද වගකිව යුතුයි . දරුවා කුඩා කාලයේදී ඉල්ලන දේ දුන්නේ නැති උනාම අඬනවා. බඩු පොළවේ ගහනවා. බිම පෙරළී අඬනවා. ඒ දරුවා පොඩි කාලයේ සිටම අකම්පිත භාවයට වඩා කම්පා වෙන ස්වභාවයක් තමයි පෙන්නුම් කරන්නේ. ඉල්ලන දේ දෙනවා. මේ දරුවන් වැඩිහිටි භාවයට පත්වූ පසුව හැසිරෙන්නේ නොහික්මුණු ආකාරයෙන්. ඒ නිසා පොඩි කාලයේ සිටම දරුවාට යථාර්ථය කියලා දෙන්න ඕනේ . අද කන්න තියෙන්නේ සම්බෝලයි බතුයි නම් ඒක කන්න පුරුදු කරන්න. ළමයාට කියල දෙන්න අපි අමාරුවෙන් ජීවත් වෙන්නේ කියලා. ඒ නිසයි අපි මෙහෙම කන්නේ බොන්නේ කියලා. ඒ නිසා අපි දියුණු වෙන්න ඕනේ ,මහන්සි වෙලා ඉගෙන ගන්න ඕනේ කියලා. ඒ වගේ ඇත්ත කතා කරලා දරුවාට නිවැරැදි මාර්ගය කියා දෙන්න ඕනේ. නමුත් අපි ළමයා රවට්ටලා ගෙන යන ක්‍රමයක් තියෙන්නේ. මව්පියන් තමන්ට කරන්න පුළුවන් සීමාවට වඩා කරන්න හදනවා. පුළුවන් තරම් බලන්නේ ළමයා තරඟයක දුවවන්න.

අධ්‍යාපනය, නිලය, ධනය, බලය, කුලය, වංශය, රූපය , ජනප්‍රියකම , රැකියාව ,තනතුර උසස් කරගැනීම , තනතුර රැකගැනීම පසුපස දුවනවා. මෙවැනි දේවල් පසුපස යාමටයි මිනිසුන්ගේ මනස ක්‍රියාත්මක වෙන්නේ. ගුණධර්මයක් තුළ මනස හික්මවන්න කටයුතු කරන්නේ නැහැ . දරුවාට කුඩා කල සිටම ගුණ ධර්ම පුරුදු කරන්න ඕනේ . එවිට අටලෝ දහමින් කම්පා නොවී සිටින්න කියලා අමුතුවෙන් පුරුදු පුහුණු කිරීමට අවශ්‍ය නැහැ. ළමයා නිරායාසයෙන්ම හැදෙනවා. ඕනෑම ගැටලුවකට ඔරොත්තු දෙන දරුවකු හැදෙනවා.

මේ ගුණධර්මවලින් තොරව දරුවන් හැදීමේ ප්‍රධාන ගැටලුවකට තමයි අද අපි මුහුණ දී සිටින්නේ. ඒ නිසා නූතන සමාජයේ මානසික අසහනය දිනෙන් දින වැඩිවෙන බවක් පෙනෙනවා.

**මෙම ලිපියේ ඉතිරි කොටස ඇසළ අව අටවක පෝදා ( 12 වනදා) පත්‍රයේ පළවේ.**

**අයන්ති විතාන**





# අටවිසි බෝධි පුරාණය

**බොදුජන සිත් පහන් කරවන බෝධි පූජාව අනාදිමත් කාලයක සිට සිරිලක් දෙරණේ පවතින්නේ ය.**

ලෙඩක් දුකක් කරදරයක් ඇති වූ විට හෝ, නොකෙරුණු කරකාර බන්ධනයට හෝ, දරුවෙකු පිළිසිඳ ගැනීමට හෝ විභාගය සමත්වීමේ අදිටනින් හෝ ආදී කුමන හෝ අපේක්ෂාවක් සපල කරගැනීමට කෙනෙක් බෝධීන් වහන්සේගේ ආශිර්වාදය පතති.

එවැනි කිසිදු අපේක්ෂාවකින් තොරව හුදෙක් පින් එල නෙළා ගැනීමේ බලාපොරොත්තුවෙන් ම සැදැහැවත් උපාසක උපාසිකාවෝ ඉමහත් ගෞරවයෙන් භක්තියෙන් බෝ සමිඳුන් පුදති.

විශේෂයෙන් ම බුදුරජාණන් වහන්සේ පරිහරණය කළ ස්ථානයක් බැවින් පාරිභෝගික ධාතුව හෙවත් පාරිභෝගික චෛත්‍ය වශයෙන් හඳුන්වන්නේ ද බෝධීන්වහන්සේ ය. බෝධීන් වහන්සේ යනු ඉහත සඳහන් කළ පරිදි වෘක්ෂයකි. බුදුරජාණන් වහන්සේ සේ ම තවත් බුදුරජාණන් වහන්සේලා පිටදුන් බෝධීන් පිළිබඳව දේශනා කර ඇත.

එනම්, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ අංක 08 දීඝ නිකායේ ද්විතීය භාගයේ අන්තර්ගත මහා පදාන සූත්‍රයේ සඳහන් වන්නේ මෙසේය.

විපස්සී භික්ඛවේ, භගවා අරහං සම්මා සම්බුද්ධෝ පාටලියා මූලේ

අභිසම්බුද්ධෝප සිඛී භික්ඛවේ, භගවා අරහං සම්මා සම්බුද්ධෝ පුණ්ඩරීකස්ස

මූලේ අභිසම්බුද්ධෝ, වෙස්සභූ භික්ඛවේ, භගවා අරහං සම්මා සම්බුද්ධෝ

සාලස්ස මූලේ අභිසම්බුද්ධෝ, කකුසන්ධෝ භික්ඛවේ, භගවා අරහං සම්මා

සම්බුද්ධෝ , සිරීසස්ය මූලෙ අභිසම්බුද්ධෝ,කොණාගමනො භික්ඛවේ භගවා

අරහං සම්මා සම්බුද්ධෝ උදුම්බරස්ස මූලේඅගිසම්බුද්ධෝ, කස්ස පො භික්ඛවේ භගවා අරහං සම්මාසම්බුද්ධෝ නිග්‍රෝමධස්ස මූලේ. අභිසම්බුද්ධෝ අහං

භික්ඛවේ එතරහි අරහං සම්මාසම්බුද්ධෝ අස්සත්ථස්ස මූලේ අභිසම්බුද්ධෝ

"මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ විපස්සී භාග්‍යවත්හු පලොල් රුකක් මුල සත්‍යාවබෝධ කළහ. මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ සිඛී භාග්‍යවත්හු හෙළඹරුකක්මුලැ සත්‍යාවබොධය කළහ.මහණෙනි, අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ වෙස්සභූ භාග්‍යවත්හු සල්රුකක්මුලැ සත්‍යාවබෝධය කළහ. මහණෙනි, අර්හත් සම්මා සම්බුද්ධ වූ කකුසන්ධ භාග්‍යවත්හු මහරී රුකක්මුලැ සත්‍යවබෝධය කළහ. මහණෙනි, අර්හත් සම්මා සම්බුද්ධ වූ කොණාගමන භාග්‍යවත්හු දිඹුල්රුකක් මුලැ සත්‍යාවබෝධය කළහ. මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ කාශ්‍යප භාග්‍යවත්හු නුගරුකක් මුලැ සත්‍යවබෝධය කළහ. මහණෙනි මේ කලැ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ මම් ඇසතු රුකක් මුලැ සත්‍යවබෝධය කළෙමි."

යම්කිසි බෝසතාණන් වහන්සේ නමක් බුද්ධත්වය ලබාගැනීමේ දී වැඩ සිටීමට ආධාර වූ රුක බෝධිය වශයෙන් සලකා තිබෙන බව මෙහි දී පැහැදිලි වන කරුණකි. ගෞතම බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයෙන් සත් සතියක් ගත කළ බව ප්‍රචලිත වුවත්, ත්‍රිපිටකයෙහි සඳහන් නොවේ. විනය පිටකයට අයත් මහාවග්ග පාලියේ සති සතරක් පමණක් සඳහන් ය. අනිමිස ලෝචන පූජාව පිළිබඳව සඳහන් වන්නේ සමන්තපාසාදිකා නම් විනය අටුවා ග්‍රන්ථයේ ය. මේ පිළිබඳ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඉතිහාසය හා තදනුබද්ධ සංස්කෘතිය රචනා කළ වැලිමිටියාවේ ධම්මරක්ඛිත නා හිමියෝ මෙසේ පැහැදිලි කරති. එනම්, පූජාර්හභාවය සනාථ කිරීමට මෙන් බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් දෙවන සතිය බෝධිය දෙස ඇසිපිය නොහෙලා බලා සිටීමෙන් අනිමිස ලෝචන නම් පූජෝපහාරයක් ද කළ සේක. මෙම අනිමිස ලෝචන පූජාව පිළිබඳ ව ග්‍රන්ථාන්තරයන්හි විවිධ විචාර පළ වී ඇතත් , හමුවී ඇති වාර්තා අනුව බුදුරදුන් විසින් බුද්ධත්වය ලබාගන්නා අවස්ථාවේ තමන්ට සෙවණත්, සිසිලත්, ගෙන දුන් බෝධි වෘක්යට ස්වකීය කෘතඥතාව පළ කර සිටි බවට නම් කිසිදු සැකයක් නැත.

අප තථාගත බුදුරජාණන් වහන්සේ පිටදුන් බෝධිය අශ්වත්ථ වෘක්ෂයයි. ඒ පිළිබඳ ව ශ්‍රී ලංකාවේ බෝධි සංස්කෘතිය පොතේ කර්තෘ අලුත්වැව සෝරත හිමියෝ මෙසේ සඳහන් කරති.

එනම්, අශ්වත්ථ වෘක්ෂය නමින් වේද ගන්ථවල සඳහන් වන ඇසතු වෘක්ෂය වෙනත් ගස්වලට වඩා පවිත්‍ර එකක් ලෙස පිළිගැනී තිබිණ. වෛදික ඉගැන්වීම් අනුව අති ශ්‍රේෂ්ඨ සෝම පූජාව සඳහා අවශ්‍ය භාජන සාදන ලද්දේ එහි ලී වලිනි. එපමණක් ද නොවේ එකල වෛද්‍යවරුන්ගේ රහසිගත ඖෂධ තැන්පත් කළ හෙප්පු සාදන ලද්දේත් , ගුප්ත දෙයක් සේ සැලකුණු , ගිනි නිපදවීම සඳහා යොදනු ලැබූ , "ගිනි යතුරේ", උඩ කොටස සාදන ලද්දේත් මෙම ගසේ ලී වලිනි.

"අශ්වත්ථ වෘක්ෂය සතුරන් විනාශ කිරීමේ සුවිශේෂ බලයකින් යුක්ත වූවක් ලෙස සැලකිණ. අථර්ව වේදයේ එන යාචිඤා ඛණ්ඩය ඒ බව පෙන්නුම් කරයි."

මෙම අශ්වත්ථ හෙවත් ඇහැටු ,ඇසතු වශයෙන් හඳුන්වන වෘක්ෂය වනස්පති ශබ්දයට ද යොදා ඇත. මෙහි විද්‍යාත්මක නාමය නම් ficus-religisa වේ. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් වැලිමිටියාවේ ධම්මරක්ඛිත නා හිමියන්ගේ පර්යේෂණාත්මක ඉහත නම් සඳහන් ග්‍රන්ථයේ අන්තර්ගත වේ .

බුද්දක නිකායට අයිති බුද්ධ වංසය අටුවාවෙහි ගෞතම බුදුරජාණන් වහන්සේ සමඟ විසිපස් නමක ගේ විස්තර ඇතුළත් වේ. එහි අට්ඨ කථාව වූ බුද්ධවංශට්ඨ කථා නැතහොත් බුද්ධවංස අටුවා කතාවේ එම බුදුරජාණන් වහන්සේලා ගේ බෝධීන් වහන්සේ නාමික ව සඳහන් වේ. ඒ සෑම අවස්ථාවකදී ම වෘක්ෂය බෝධි නාමයෙන් හඳුන්වනු ලැබේ.

මෙම ලිපියෙහි ඉතිරි කොටස ඇසළ අව අටවක පෝද (12 වැනිදා) පත්‍රයේ පළවේ.

**හේමමාලා රන්දුනු**

**පිළියන්දල ප්‍රදේශයේ විහාරස්ථානයකට ආවතේවකරුවකු අවශ්‍යයි.**
විහාරාධිපති 0770064577

**අනුරාධපුර**
පූජා භූමියට ආසන්න අභිනවයෙන් ඉදිවන වනසෙනසුනක විවේකීව
**මහනදම් පුරන්නට කැමති ස්වාමින් වහන්සේලාට ආරාධනා.**
**076-9711528**

අවුරුදු 36 ක
**උපසපන් හිමි නමක් විහාරස්ථානයක් සොයයි.**
T.P. 0712275718

**තායිලන්තයෙන්**
ගෙන්වන ලද, අඩි 1 1/2 ක් උස, අඩියක් පළල පිත්තලෙන් සාදන ලද, **ඉඳිපිළිම** හා අඩි 4 1/2 ක් දිග, අඩි 2 1/2 ක් පළල, පිත්තලෙන් සාද රන් ආලේප කළ **ශ්‍රී පතුල් 2 ක්** විකිණීමට.
**0718-071009**

**සියම් නිකායට අයත් භික්ෂූන් වහන්සේ නමක්**
**වැඩ වාසය කිරීමට සුදුසු විහාරස්ථානයක් සොයයි.**
**(දකුණු පළාත අවටින් විශේෂයි)**
**071-3655744**

**පැවිදිවීමට ආරණ්‍යයක් හෝ පන්සලක් ලබාදෙන්න.**
**එම ස්ථානයේ දියුණුවට ලක්ෂ 10 මුදලක් ලබාදෙමි.**
077-6415107

**නිවසේ එදිනෙදා කටයුතු කිරීමට හැකි කාරුණික කාන්තාවක් සොයයි.**
**විමසීම් : 0757672796**

ගම්පහ පිහිටි අප වැඩිහිටි නිවාසය රැකබලා ගැනීමට
**පාලිකාවක් අවශ්‍යයි.**
වැඩිහිටි අයට
**නේවාසික පහසුකම් ඇත.**
**අමතන්න :** 0773732795

**සියම් නිකායික**
සියලු ආගමික කටයුතු කිරීමෙහි දක්ෂ මැදිවියේ සාමණේර හිමි නමක් කාරුණික ගුරු හිමියන් කෙනෙක් යටතේ පැවිදි උපසපන් බව ලබා ස්ථානයක් භාරව කටයුතු කිරීමට සොයයි.
**(කොළඹ - ගම්පහ) විශේෂයි.**
**දු.ක. 077-6080940**

**භාවනා !**
මෛත්‍රී සමාධියෙන් නිවන් මගට මෙම වටිනා දහම් පොත තැපැලට රු. 45/- ක මුද්දර එවා නොමිලේ ලබාගන්න.
071-0927121
R.A. **රණසිංහ**
**පාදෙනිය පාර - කොබෙයිගනේ.**

**පිං බිමක නවාතැන්**
මධ්‍යම පළාතේ අසපුවකට යාබදව චෛත්‍ය, බෝධීන් වහන්සේ පෙනෙන දුරින්, ධර්ම දේශනා ඇසෙන දුරින්, ආගමානුකූලව ජීවත්වන බෞද්ධ කාන්තාවන් සඳහා කුඩා ඇනෙක්සියක්.
**0765281180**

**වැඩිහිටි නිවාස**
මවුවරුන් සඳහා ඉඩ ඇත.
රාත්‍රියට සැහැල්ලු ආහාර, අන්තර්ජාල මගින් දිනපතා ධර්ම දේශනා කතෝලික වැඩසටහන් සමග පහසු ගාස්තුවකට.
**විමසීම් : රණවිරු කුමාර ලියනගේ ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවහන - ජාඇල.**
0117179727, 011-2228059

**පිහිට පතයි**
පහල අත්තන්ගනය, නල්ලදරන්කට්ටුව ලිපිනයේ පදිංචි
**M.R.K. ප්‍රනාන්දු මහතාට**
"O" පොසිටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍යකර ඇත.
පරිත්‍යාගශීලියෙකු සිටීනම්
**0779654409, 0762562092**
**අංක වෙත දන්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටියි.**

# උඩුගම මහ බෝ වන්දනාව

ගාල්ල, උඩුගම ශ්‍රී ශාසනාලංකාරාරාම පුරාණ මහා විහාරස්ථානයේ විරාජමානව වැඩසිටින දඹදිව ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛා බෝධීන් වහන්සේට උපහාර පූජා පිණිස වාර්ෂිකව පවත්වනු ලබන 'මහ බෝ වන්දනා' වැඩසටහන මේ මස 05 දින සිට 11 දින දක්වා දිනපතා පැවැත්වේ. මේ මස 05 දින සිට 11 වන දින දක්වා පෙරවරු 5.00 ට ශ්‍රී මහා බෝධීන් වහන්සේට කිරි ආහාර පූජාව (තේවාව සහිතව) දිනපතා රාත්‍රී 6.00 සිට රාත්‍රී 10.00 දක්වා ඖෂධ වර්ග 108 ක ඖෂධ පූජාව, අටපිරිකර පූජාව, සුවඳ පැනින් බෝ සමිඳුන් නැවීම, මල්මාලා 1008 ක් ශ්‍රී මහා බෝ සමිඳුන්ට පූජා කිරීම, මහා බෝධි පූජාව, තෙළඹමල් පූජාව, කෙටි අනුශාසනය පංච මහා දේවාලය සඳහා රාත්‍රී 9.30 ට මුරුතැන් පූජාව පැවැත්වේ.

# වේඩරුවේ විජිත නා හිමියන්ගේ තෙමස සමරු පින්කම

පොල්ගස්ඕවිට හෙරලියාවල ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාරය, කඩුවෙල කොතලාවල ශ්‍රී සිද්ධාර්ථ බෞද්ධ මධ්‍යස්ථානය යන උභය විහාරාධිපතිව වැඩ සිටි වේඩරුවේ විජිත ස්වාමීන් වහන්සේ අපවත්වීමෙන් තෙමසක් පිරීම නිමිත්තෙන් ගුණ සමරු පුණ්‍ය උත්සවයක් පසුගියද පැවැත් වුණි. ඉත්තෑපාන ධම්මාලංකාර නා හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සංඝගත දක්ෂිණාවක් ද, සංඝාවාස ගොඩනැගිල්ලක් නම් කිරීම ද, බුදුසරණ පුවත්පත් බෙදදීමක් ද, එහිදී සිදුකෙරිණ. **එස්. පත්තිල, පොල්ගස්ඕවිට සමූහ.**

# පිහිට පතයි

බොරල්ල ප්‍රදේශයේ පදිංචි පී.කේ.සී. ඩබ්ලිව්. කරුණාරත්න (44) මහතා දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට "ඒ හෝ ඕ" වර්ගයේ වකුගඩුවක් ඉක්මණින් බද්ධ කළයුතු බවද දක්වා සිටියි. දෙදරු පියෙකු වන ඔහුට වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමැති අයෙක් වේ නම් 0763210887 හෝ 071 7257900 දුරකථන අංකවලට අමතන ලෙස ඉල්ලීමක් කරයි.

---

බටුවත්ත, රාගම අංක 264/ඩී/2 හි පදිංචි එන්.එල්. ලලිත් චමින්ද (42) මහතාට "ඕ පොසිටිව් හෝ ඕ නෙගටිව්" වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මණින් අවශ්‍ය බව කියයි. වකුගඩුවක් පරිත්‍යාග කළහැකි අයෙක් වේ නම් පහත දුරකථනයන්ට අමතන ලෙස ඉල්ලීමක් කෙරේ. 077 513 5637, 077 647 2741

---

කඩවත ප්‍රදේශයේ පදිංචි ඩබ්ලිව්.ඒ.එස්. සෙනෙවිරත්න මහතා මේ වන විට වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඔහුට "බී පොසිටිව් හෝ බී නෙගටිව්" වර්ගයේ හෝ "ඕ පොසිටිව් හෝ ඕ නෙගටිව්" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බැවින්, පරිත්‍යාගශීලී අයෙක් වෙතොත් දුරකථන අංක 077 500 5600 දැනුම් දෙන ලෙස ඉල්ලා සිටියි.


---

දිවුලපිටිය, කුඩගම්මන, වතුයාය අංක 32 හි පදිංචි විශ්‍රාමික ගුරුවරයෙකු වන උඩවත්තගේ සීලදාස (67) මහතා දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට "ඒ, බී පොසිටිව්" වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය ඇති බව ද, පරිත්‍යාගශීලියෙකු වේ නම් දුරකථන අංක 070 3891640 දන්වන ලෙස ද ඉල්ලීමක් කෙරේ.

---

වැලිපැන්න, ලේවන්දුව, අඹගහවත්ත ලිපිනයේ පදිංචි ප්‍රේමරත්න ලියනගේ (57) (විශ්‍රාමික ආබාධිත රණවිරු) දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට ඕ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළයුතු බව කියයි. පරිත්‍යාගශීලියෙකු වෙතොත් 0712746701 දුරකතනයට දන්වන ලෙසද කියයි. මුදලින් ආධාර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් අංක 100450543357 ගිණුමට මුදල් බැරකළ හැකි බව කියයි.

# "පූජනීය අටමස්ථානය"




පුරාවිද්‍යා ශාස්ත්‍රපති කුසුම්සිරි විජයවර්ධන මහතා විසින් රචිත 'පූජනීය අටමස්ථානය' පසුගිය දා කොළඹ මරදානේ, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවතේ, දයාවංශ ජයකොඩි සහ සමාගමේ නව පොත් ප්‍රදර්ශනාගාරයේ දී නිකුත් කෙරුණි.

අටමස්ථානය වන්දනා කරන සැදැහැවතුන්ට මෙන්ම පුරාවිද්‍යා නටබුන් හා පූජනීය ස්ථාන ගැන කරුණු සොයා යන කාටත් වැදගත් වන වටිනා කරුණු එක්රැස් කළ කෘතියක් ලෙස 'පූජනීය අටමස්ථානය' වැදගත් වේ. මෙම කෘතියෙහි අටමස්ථාන සංකල්පයේ ඉතිහාසය, රුවන්වැලි මහ සෑය, ජය ශ්‍රී මහා බෝධිය, ලෝවාමහාපාය, ලංකාරාමය, ථූපාරාමය, මිරිසවැටිය, අභයගිරිය හා ජේතවනාරාමය යන පරිච්ඡේද ඔස්සේ කරුණු පෙළ ගස්වා තිබේ.

# මෙවර වස් විසීම අගෝස්තු 04 වැනිදා

2020 අගෝස්තු මස තුන්වැනි (03) සඳු දින යෙදී තිබෙන නිකිණි පුර පසළොස්වක පොහෝ දින මහා සංඝයා වහන්සේ පොහොය කොට අගෝස්තු මස හතරවැනි (04) කුජ දින පෙරවස් විසීම.

සැප්තැම්බර් මස පළමු කුජ දිනට යෙදෙන බිනර පුර පසළොස්වක පොහෝ දින පොහොය කොට සැප්තැම්බර් දෙවැනි (02) බුධ දින පසුවස් එළඹීම.

ඔක්තෝබර් මස තිස් එක්වැනි (31) ශනි දිනට යෙදී ඇති අධි වප් පොහෝ දිනයෙහි පොහොය කොට එදින ම පෙරවස් පවාරණය.

නොවැම්බර් මස විසිනව වැනි (29) රවි දින (ඉරිදා) වප් පුර පසළොස්වක පොහොය දින පොහොය කොට එදින ම පසුවස් පවාරණය සිදු කිරීමට නියමිත ය.

# රද්දොළුව ශ්‍රී අමර මහා විහාරය

සීදුව, රද්දොළුව ශ්‍රී අමර මහා විහාරස්ථානයේ නිකිණි පෝය (04) වෙනුවෙන් පින්කම් මාලාවක් සංවිධානය කර ඇත. පණ්ඩිත ගෞරව ශාස්ත්‍රවේදී සීදුවේ සුමනවංස නා හිමියන්ගේ මෙහෙයවීමෙන් වැඩසටහන පැවැත්වේ.

පෝද අලුයම 5.00 ට ශ්‍රී දළද වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේ උදෙසා ප්‍රණීත කිරි ආහාර පාත්‍ර 32 ක් පූජා කිරීම, උදෑසන 6.00 ට අෂ්ඨාංග උපෝසථ සීලයෙහි පිහිටුවීම හා අනුශාසනාව විහාරාධිපති සීදුවේ සුමනවංස නා හිමියන්, 6.45 ට ආහාර බුද්ධ පූජාව හා තෙරුවන් වන්දනාව, පෙරවරු 8.00 – 9.00 දක්වා ධර්ම දේශනාව ගෞරව ශාස්ත්‍රවේදී ඇඹිලිපිටියේ සාරද හිමි, 9.00 සිට 10.15 දක්වා ධර්ම සාකච්ඡාව, කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අශෝක ප්‍රියදර්ශන මහතා, ධර්මාචාර්ය ගෞරව ශාස්ත්‍රවේදී ඒ.එන්. ඉන්ද්‍රසේකර මහතා ධර්මාචාර්ය අනුර සිරිමාන්න මහතා, ශාස්ත්‍රපති තිල් ධර්මප්‍රිය බණ්ඩාර මහතා, ධර්මාචාර්ය කේ.ඒ.එස්.ආර්. දයානන්ද මහතා, 10.45 ට ව්‍යාංජන, පලතුරු, කැවිලි වර්ග 32 ක් ඇතුළු ශ්‍රී දළද වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේලා උදෙසා මුල්තැන් බුද්ධ පූජා කිරීම, පස්වරු 12.00 සිට 12.30 දක්වා සක්මන් භාවනාව, 12.30 – 1.30 දක්වා ජාතක ධර්ම දේශනාව 1.30 සිට 2.30 දක්වා භාවනාව සහිත ධර්ම දේශනාව, මොණරාගල සෝමසාර හිමි, 4.15 සිට 5.15 දක්වා ධර්ම දේශනාව දෙමිපේ සියනෑ ජාතික පාසලේ සහකාර විදුහල්පති, ශාස්ත්‍රපති ඇල්ලේ ඉන්ද්‍රජෝති හිමි, සවස 6.00 ට සැමට සෙත්පතා අටවිසි බුද්ධ පූජාව සහිත පහන් පූජා, බෝධි පූජා පින්කම සහ තුන්සූත්‍රය, ගිරිමානන්ද සූත්‍රය, ධම්මචක්කපවත්තන සූත්‍රය, ජය පිරිත දේශනා පැවැත්වීමට දකටයුතු කර ඇත.

# ඓතිහාසික ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරය

පෙරවරු 6.00 – 6.30 සීල සමාදානය ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරයේ කෘත්‍යාධිකාරී ශාස්ත්‍රවේදී රත්දිලිගම මහින්ද හිමි, 8.00 – 9.00 භාවනාව ශ්‍රී කල්‍යාණී උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නා හිමි, 9.00 – 10.00 පෙරවරු ධර්ම දේශනාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරවාසී, අනුරාධපුරයේ අරියඥාණ හිමි, 10.00 – 11.00 ධම්ම පදයෙන් බිඳක් කොලොන්නාව පුරාණ විහාරවාසී, ශාස්ත්‍රවේදී කැලණියේ ශාසනවංශ හිමි, 11.00 – 11.30 දිවා බුද්ධපූජාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරවාසී, ගොඩපොල නන්ද හිමි, පස්වරු 2.00 – 3.00 වෛද්‍ය දේශනය වසංගත රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය පබා පළිහවඩන මිය, 3.00 – 4.00 පස්වරු ධර්ම දේශනාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරවාසී, කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය දෙනියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි, 4.00 – 5.00 දම්සක් පැවතුම් සූත්‍රය මහසඟරුවනසමඟ පෙහෙවස්සමාදන් වූ සියලුදෙනා, 5.00 – 6.00 භාවනාව ශ්‍රී කල්‍යාණී උභය රාජමහා විහාරාධිපති මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නා හිමි, 6.00 – 7.00 ගිලන්පස බුද්ධ පූජාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරවාසී මාවුස්සාගොල්ලේ මුදිත හිමි, 7.00 – 8.00 සන්ධ්‍යා ධර්ම දේශනාව කැලණියේ පියදස්ස නා හිමි.

# හුණුපිටිය ශ්‍රී විජය සුන්දරාරාමය

වත්තල හුණුපිටිය ශ්‍රී විජය සුන්දරාරාම පුරාණ විහාරස්ථානයෙහි ඇසළ පෝද පෙරවරු 6.00 සිට පසුද පෙරවරු 6.00 දක්වා දන, සීල, භාවනා ධර්ම දේශනා ඇතුළු වැඩ සටහන් රාශියක් පැවැත්වීමට විතදෝෂි සමිතිය, දායක සභාව, කාන්තා සමිතිය හා ධර්මාශෝක දහම් පාසල කටයුතු යොද ඇත. වැඩසටහන් විහාරාධිපති වලවෙල හේමානන්ද නා හිමියන්ගේ අනුශාසනා පරිදි දේවගොඩ පියරතන, බුත්කන්දේ රතනජෝති, ගල්කිස්සේ ධම්මිස්සර, ඇලපිටිවල නන්දවිමල, වේවැල්දුවේ ධම්මකිත්ති යන හිමිවරුන්ද ගාල්ලේ සුධම්මචාර දසසිල් මාතාවද වැඩසටහන් වලට වැඩම කිරීමට නියමිත ය.

# බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන

පෙරවරු 06.00 – 07.00 සීල සමාදානය, 07.00 – 07.30 තෙරුවන් වන්දනාව, 08.15 – 10.00 භාවනාව, 10.00 – 11.00 ධර්ම දේශනාව, 11.00 – 11.30 තෙරුවන් වන්දනාව පෙරවරු වැඩසටහන් මෙහෙයවීම ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමි. පස්වරු 12.30 – 01.00 සූත්‍ර සජ්ඣායනාව, 1.00 – 2.00 ධර්ම දේශනය තල්පත්කන්දේ සිරිනන්ද හිමි, 2.00 – 3.30 ධර්ම සාකච්ඡාව ලේනව මංගල හිමි, 4.00 – 5.00 ධර්ම දේශනය තිස්සමහාරාමයේ නන්දවිමල හිමි, 5.00 – 6.00 ධර්ම දේශනය වේරදුවේ මහින්ද හිමි, පස්වරු 07.08 අටවිසි බුද්ධ වන්දනාව.

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්

### ඇසළ පුර පසළොස්වක පෝය

ජූලි 04 සෙනසුරාදා පූර්වභාග 11.34 ට පුර පසළොස්වක පෝය ලබා 05 ඉරිදා පූර්වභාග 10.14 ට පෝය ගෙවේ. සෙනසුරාදා සිල්.

### ඇසළ අව අටවක පෝය

ජූලි 12 ඉරිදා අපර භාග 03.48 න් අව අටවක ලබා 13 සඳුදා අපර භාග 06.09 න් ගෙවේ. ඉරිදා සිල්.

### ඇසළ අමාවක පෝය

ජූලි 20 සඳුදා පූර්වභාග 00.10 න් අමාවක පෝය ලබා එදිනම අපරභාග 11.02 න් ගෙවේ. සඳුදා සිල්.

### නිකිණි පුර අටවක පෝය

ජූලි 27 සඳුදා පූර්ව භාග 07.09 පුර අටවක පෝය ලබා 28 අඟහරුවාදා පූර්වභාග 04.58 න් පෝය ගෙවේ. සඳුදා සිල්.



මහාචාර්ය

**මැදගම්පිටියේ විජිතධම්ම හිමි**

# ලෝක ප්‍රකට රීස් ඩේවිඩ්ස් පාලි පඬිතුමා



**තෝමස් විලියම් රීස් ඩේවිඩ්ස් (1843 - 1922 ) පඬිතුමා යුරෝපයේ පාලි බුදු දහම පතළ කිරීමෙහි ලා විශිෂ්ට සේවයක් කළ ඓතිහාසික පුද්ගලයෙකි. 1864 වසරේ දී සිවිල් සේවකයෙකු වශයෙන් ලංකාවේ සේවයට පැමිණි එතුමා නීතිඥයකු ලෙස කටයුතු කරද්දී පාලි භාෂාව හැදෑරීමට යොමු වී තිබේ.**

බෙන්තොට වනවාස විහාරයේ වැඩසිටි යාත්‍රාමුල්ලේ ධම්මාරාම හිමියන්ගෙන් මෙන්ම හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන්ගෙන් ද පාලි භාෂාවත්, බුදු දහමත්, සිංහල භාෂාවත් හැදෑරූ මෙතුමා සිවිල් සේවයෙන් ඉවත්ව සිය මව්රටට ගොස් වර්ෂ 1881 දී ලන්ඩන් නගරයේ දී 'පාලි ග්‍රන්ථ සමාගම' පිහිටුවිය. එහි දී කලක් ලංකාවේ සිවිල් සේවයේ නියැළී සිටි රොබට් චයිල්ඩර්ස්, ජර්මන් ජාතික උගතකු වූ හර්මන් ඔල්ඩන් බර්ග්, ඩෙන්මාර්ක් ජාතික උගතකු වූ විගො පෞස් බෝල් යන මහත්වරු ද එතුමා සමග එක් වූහ. එතුමාගේ මූලිකත්වයෙන් ඇරඹි පාලි ග්‍රන්ථ සමාගම අදටත් පාලි ත්‍රිපිටක හා අටුවා ඇතුලු බෞද්ධ පොතපත ප්‍රකාශයට පත් කරමින් හා ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරමින් සුවිශේෂී මෙහෙවරක් ඉටුකරයි.

එම සමාගම පිහිටුවීමේ දී එතුමාට ලංකාවාසී භික්ෂූන්ගේ මූල්‍යමය ආධාර සේ ම මාර්ගෝපදේශ ද ලැබිණ. ගාල්ලේ මිනුවන්ගොඩ පරමානන්ද විහාරාධිපති වූ බුලත්ගම ධම්මාලංකාර ශ්‍රී සුමනතිස්සාභිධාන මාහිමියන් විසින් එතුමාට යැවුණු පහත දැක්වෙන ලිපියෙන් අප රටෙහි තෙරවරු එතුමාට උපදෙස් දුන් ආකාරය ප්‍රකට වේ.

අන්නතාශීර්වාද ස්තුති පෙරටුව වරද හැර ලියා මතක් කර එවන වග හැටි නම්,

ටී. ඩබ්. රීස් ඩේවිඩ්ස් නම් ඇති පින්වත් මහත්මයාණනි,

තමුන්නාන්සේ ඇතුළත් වූ බස්නාහිරදිසාවාසී වූ යුරෝපීය ශාස්ත්‍රවන්ත මහතුන් සභාවක් විසින් අප ශුද්ධ වූ බුද්ධාගමේ බුද්ධදේශිත සූත්‍රාභි ධර්ම විනය සංඛ්‍යාත ත්‍රිපිටක පාලි පොත් ඉංග්‍රීසි අක්ෂරවලින් තිබෙනවා යයි යන වග ගාල්ලේ ඊ. ආර්. ගුණරත්න අතපත්තු මුදියන්සේ රාළහාමිගෙන් දැන කියාගත් ලංකාවාසී ගිහි පැවිදි අපි බොහෝ සමූහයක් එම තමන්නාන්සේලාගේ මාහැඟි උතුම් වැඩේ ගැන ඉතා ප්‍රීතියට පැමිණියා පමණක් නොව ඒ ගැන තමුන්නාන්සේලාට මුළු හෘදයෙන් අප්‍රමාණ ස්තුති ද කරනවා ය.

එසේ මහත් සන්තෝස වූ දැන උගත් ලංකාවාසී පණ්ඩිතවරුන්ගේ ඔය ගැන ඇති කල්පනා දැනගත් මවිසින් වැඩි වශයෙන් කරුණා සිතින් දන්වා සිටින්නට නම් පූර්වදිග උපන් තථාගත අප සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ත්‍රිපිටක ධර්මයේ පොත් සියම්, බුරුම රාමඤ්ඤ රටවල පවතින්නේ වී නමුත් ඒ ත්‍රිපිටක දේශනා පොත් ඊට බුද්ධඝෝෂාදි අටුවාචාරීහු ද, සාරිපුත්තාදි ටීකාචාරීහු ද, ගණ්ඨිපද විවරණාදි ප්‍රකරණදැයි යන බුද්ධාගමේ සියලු ම පොත් කලින් ලිවුවේත් මේ අප ලංකාද්වීපයේ ය. එසේ ලිවූ සියලු ම පොත් දෙවනු සියම් බුරුම රාමඤ්ඤ රටවලට ගෙන ගොස් ලියා ගැනීමෙන් දැන් දක්වාත් පවතින්නේ එම පොත් ම ය. ඒ ඈර පූර්වදිශාවේ පවත්නා සියලු භාෂා අතුරෙන් ප්‍රාකෘත, සංස්කෘත, සිංහල භාෂා තුන ම තත්සම භාෂාය හෙවත් බොහෝ සෙයින් සමාන ව පවතින භාෂා යි.

යම් බුරුම ආදී අනිකුදු භාෂා පාලි භාෂාවට සමහර සුවල්ප වචන සම නමුත් බොහෝ සෙයින් විසදෘශයි හෙවත් සම නොවෙයි. එබැවින් සියම් බුරුමාදි රටවල පාලි නූගත් ලිපිකරුවෝ ලියන පොත්වල තමතමන්ගේ භාෂි රීති පුරුදුවේ සැටියට අකුරු සහ වචනත් ලියවීමෙන් වරද ඇති බව අපි දැනගෙන තිබෙන්නේ ය. ඉන් නිසා තමුන්නාන්සේලාට බොහෝ ලෝකයට මහත් උපකාර සඳහා බොහෝ වෙහෙස මහන්සි දරමින් ද වියදමින් ද ඉංග්‍රීසි අකුරුවලින් අච්චුගස්වන ත්‍රිපිටක පොත්වලට වැඩි වසයෙන් ලංකාවේ සිංහල අකුරු පොත්වලින් එක එක වර්ගේ පොත් කීපයක් බැගින් සපයා ගෙන එකට සමාන න පොත් බලා එම පොත් ලංකාවේ පොත් ගුරු පොත්වලට ගෙන එයට සම නොවන සියම් බුරුම පොත්වල තිබෙන යම් යම් අක්ෂර වචනවල වෙනස් තිබුණොත් ඒ මේවාය කියා සටහන් කිරීමෙන් පොත් අච්චුගස්වන්ට ඉතා යුතු යයි සිතමි.

> එතුමාගේ මූලිකත්වයෙන් ඇරඹි පාලි ග්‍රන්ථ සමාගම අදටත් පාලි ත්‍රිපිටක හා අටුවා ඇතුලු බෞද්ධ පොතපත ප්‍රකාශයට පත් කරමින් හා ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරමින් සුවිශේෂී මෙහෙවරක් ඉටුකරයි.

ඉතිරි කොටස ඇසළ අව අටවක පෝද (12 වැනිදා) පත්‍රයේ පළවේ.

## අග්ගමහාපණ්ඩිත කොටුගොඩ ධම්මාවාස මහ නාහිමි චරිතාපදානය එළිදකී



ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක ධුරන්ධර අග්ගමහාපණ්ඩිත මහා මහෝපාධ්‍යාය කොටුගොඩ ධම්මාවාස මහ නා හිමි

**දුර්ලභ පුරුෂයන් පහළවීම හැමදාටම ලෝකයේ කොතැනකත් අතිශය දුර්ලභ කරුණක් ය. එවන් මහා පුරුෂයෙක් පහළ වූ ගමත්, රටත් නිරතුරුවම බබළන්නේ ය.**

අලුත්කුරු කෝරලේ කොටුගොඩ ගම්මානය දියත පතළ වූයේ එවන් මහා දුර්ලභ යතිවරයාණන් වහන්සේ නිසා ය. ඒ අග්ගමහා පණ්ඩිත මහෝපාධ්‍යාය අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක කොටුගොඩ ධම්මාවාස මහා නාහිමියන් නිසාම යැයි කීම අතිශයෝක්තියක් නොවේ ය.



ප්‍රවීන මාධ්‍යවේදී

**උපාලි සමරසිංහ**

අසූ හත් වැනි වියෙහි පසුවන ධම්මාවාස නාහිමියන්ගේ ජීවිතයේ ගමන්මග පීරා මාධ්‍යවේදී උපාලි සමරසිංහ අතින් ලියැවුණු චරිතාපදානය පසුගිය දිනෙක ජනගත විය. පරිච්ඡේද නමයක් පුරා විහිදෙන මෙම චරිතාපදානය කොටුගොඩ ධම්මාවාස මහ නාහිමියන්ගේ ජීවිතයේ සියලු තතු නිරාවරණය කොට ඇත.

1948 අගෝස්තු මස 17 දින පැවිදි දිවියට පිවිසි උන්වහන්සේ රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙනෙහි සිය ආගමික අධ්‍යාපනය ආරම්භ කළහ.

එතැන් පටන් මෙරට ආගමික පුනර්ජීවනය මෙන්ම සමාජීය මෙහෙවර උදෙසා උන්වහන්සේ සිය ආගමික ජීවිතය කැප කළහ. කොටුගොඩ ධම්මාවාස මාහිමියන් මෙරට වඩාත් ප්‍රචලිත වූයේ මිහිරි බණ දේශනාවන් නිසා ය. උන්වහන්සේගේ දේශනා තුළ වාග් චාතුර්ය, මධුර බව, කන්කලුබව, ශ්‍රාවකයින්ගේ සිත ඇද බැඳ ගත්තේ ය. එමෙන්ම උන්වහන්සේ තුළ තිබූ කෘතහස්ත ලේඛන හැකියාව ද ඉතා ප්‍රබල එකක් විය.

මහණ දිවිය අරඹා ධර්මදූත මෙහෙවරෙහි නිරතවන උන්වහන්සේ මෙරට ගම් නියම් ගම්වලද, පසුව විදෙස් රට වලද ධර්මදූත සේවයෙහි යෙදුණේය. එමෙන්ම මෙරට පුනරුත්ථාපන කඳවුරුවල සිරකරුවන්ගේ සිත් දහම් සිසිලෙන් පෝෂිත කරන්නට සිදුකළ මෙහෙය අපමණ ය.

බුදුදහම සම්බන්ධයෙන් සමාජයේ විටින්විට පැණ නැගුණු විවිධ ප්‍රශ්නයන් සඳහා උන්වහන්සේ ඍජුව කරුණු ඉදිරිපත් කළ අතර එයින් නිවැරදි අවබෝධයක් සමාජගත කරන්නට සිය ඥානය මෙහෙය වූහ.

එවන් සමාජ හා ආගමික ප්‍රබෝධය උදෙසා කොටුගොඩ ධම්මාවාස නා හිමි කළ මෙහෙවර උන්වහන්සේගේ චරිතාපදානය ඔස්සේ ගොඩනගන්නට කතුවරයා උත්සාහ දරා තිබීම ප්‍රශංසනීය ය.

සිය ජීවිතයේ මෙරට ආගමික පුනර්ජීවනය උදෙසා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක කොටුගොඩ ධම්මාවාස මහා නා හිමිපාණන්ට ශාසනික මෙහෙවරෙහි යෙදෙන්නට සාධු සිතින් නමස්කාර පූර්වකව දිගාසිරි පතමු.

**වසන්ත**

## සද්ධර්මරත්නාවලියෙන්



# දෙවියන්ගෙන් පුත් රුවනක්

**අපගේ ජීවිතවලට යහපත උදාකර දෙන, සැපය උදාකර දෙන යම් උදාර දෙයක් ඇත්නම් ඒ අනෙකක් නොව ගෞතම බුදු සසුනයි. මේ ලෝකයේ කාමය ඇතුලු අනෙක් සියලුම සැප සම්පත් ඉතාම තාවකාලික ය. නමුත් බුදු සසුනක් තුළින් ලැබෙන සැපය , සැනසුම, ආරක්ෂාව සදාකාලික ය. නුවණැති දෙව් මිනිසුන්ට බුදු සසුන තුළින් එම සැපය , සැනසුම, ආරක්ෂාව තම තම නැණ පමනින් උපදවා ගත හැක.**

සද්ධර්මරත්නාවලිය යනු එවන් ලෝ සතුන්ට තම දහම් මඟ දියුණු කර ගැනීම පිණිස උපකාරී වන පහනක් වැනි ය. මං මුළාවූ කෙනෙක්ට නිවැරදි මඟ පෙන්වන කලණ මිතුරෙක් වැනි ය. පිපාසිතයෙකුට මිහිරි පැන් පොකුණක් වැනි ය.ඉතාම සුන්දර ලෙස අලංකාර උදාහරණයන් ඇතුළත් කරමින් රචනා කොට ඇති මෙම පොත් වහන්සේ අප ඉතාම ගෞරවයෙන් පරිශීලනය කළ යුතු ය.

තුන්වනවන විජයබාහු , දෙවන පැරකුම්බා , හතරවන විජයබාහු , පළමුවන බුවනෙකබාහු , යන රජවරුන්ගේ පණස් වසරක පමණ රාජ්‍ය කාල සීමාව තුළ ධර්මසේන ස්ථවිරයන් වහන්සේ විසින් මෙමපොත් වහන්සේ රචනා කරන ලදී. බුදු ගුණ , දම් ගුණ , සඟ ගුණ, රහතන් වහන්සේලා පිළිබඳ සුන්දර කතා වස්තු, ඇතුලු අපගේ ජීවිතවලට ඉතාම වටිනා දහම් කරුණු මෙම ග්‍රන්ථ රත්නය තුළ ඇතුළත් වේ.සැබවින් ම මෙම පොත් වහන්සේ මැණික් ආකරයක් බඳු නිධානයකි.එම මැණික් ආකරයෙන් එක් එක් මාණික්‍ය රත්නයන් අප මෙසේ ඔබට දක්වන්නෙමු.

ශාස්ත්‍රපති
**මහව කලයාණඝදණ හිමි**

### චක්ඛුපාල මහ රහතන් වහන්සේ

බුදුරජාණන් වහන්සේ ජීවමාන ව වැඩ වාසය කරන කාලයේ සැවැත් නුවර මහා සුමන නම් සිටුවරයෙක් වාසය කළා.මෙම සිටුවරයාට කෙතරම් ධනය තිබුණ ද, කොතරම් බලය තිබුණ ද දරුවන් සිටියේ නැහැ. ගස් වල පල හටගන්නා අවදියේ දී පල හට නොගන්නේ යම් සේ ද මෙම සිටුවරයාට, සහ පවුලේ සියලු දෙනාටම මෙය විශාල ප්‍රශ්නයක් බවට පත් වුණා.දවසක් මෙම සිටුවරයා ගඟට ගොස් දිය නාගෙන පැමිණෙන අතරතුර අතු පතර විහිදී ගිය සුවිශාල මහා නුග රුකක් දැක්කා.අනෙකුත් සියලුම රුක්ෂයන් අභිබවමින් මනස්කාන්ත ලෙස තිබෙන වනස්පති නුග රුක දුටු මෙම සිටුවරයාණෝ බොහෝ පැහැදී මෙම රුක්ෂය වටා ප්‍රාකාරයක් බන්දවා, සුදු වැලි අතුරුවා ධජ පතාක ආදියෙන් සරසවා පුද පූජාවන් පැවැත්වූවා.මෙසේ පුද පූජාවන් පවත්වා එම රුක්ෂයට අධිගෘහිත දේවතාවුන් වහන්සේට තමන්ට දරු සම්පත් නොමැති බව පවසා දරු සම්පත් ලබා ගැනීම පිණිස උන් වහන්සේගෙන් උදව් ඉල්ලුවා.ඒ තම පැතුම ඉෂ්ට වුවහොත් ඒ සඳහා නැවත ප්‍රතිඋපකාර කරන බවට සිහිපත් කොට, බාරයක් වී තම නිවසට පිටත් වුණා.මෙසේ කෙටි කාලයක් ගතවන විට ගසකට වතුර නැතිව, පලදාව ප්‍රමාද ව සිට පැන් ලැබුණ සැනින් පලදාව ලැබෙන්නා සේ දේවතාවුන් වහන්සේගේ උපකාරය ඇතිව ඔවුනට පුත්‍ර රත්නයක් ලැබුණා. දේවතාවුන් වහන්සේගේ උපකාරයෙන් පුතණුවන් ඉපදුණ නිසා මහා පාලිත යයි නම තිබ්බා. කාලයාගේ ඇවෑමෙන් තවත් පුතණු කෙනෙක් ලැබුණා. ඔහුට චුල්ලපාලිත යයි නම් තිබ්බා.මෙසේ කාලයත් සමඟ මෙම කුමාරවරු දෙදෙනා බොහොම යහපත් ලෙස තරුණ වියට එළඹුණා.

එකල සැවැත් නුවර වාසීන්ගෙන් බොහෝ පිරිසක් තෙරුවන් සරණ ගොස් නිතරම පින්කම් කරමින් කලය ගත කළා. උදය වරුවේ දී පිණ්ඩපාත ආදී දන් පුදමින් පින් රැස් කරන පිරිස හවස් වරුවේදී තෙල් මල් පහන් ආදී පූජා ද්‍රව්‍ය රැගෙන ජේතවනයට යනවා. දවසක් පාලිත කුමාරයා මෙසේ බොහොම අලංකාර අයුරින් සැරසී බුදු පුදට යන උපාසක උපාසිකාවන් දැක ඔවුන් ගෙන් විස්තර විමසා , ඔහු ද දෙව්රම බලා පිටත් වුණා.

**ඉතිරි කොටස ඇසළඅව අටවක පෝද (ජූලි 12 වැනිද) පත්‍රයේ පළවේ.**

# ආසියාවේ ආලෝකය

## The light of the Asia

### ඉංග්‍රීසි බසින් ලියැවුණු පළමු බෞද්ධ සාහිත්‍ය නිර්මාණය

**සිරිමත් එඩ්වින් ආනල්ඩ් එංගලන්ත ජාතිකයෙකි. 'ද ලයිට් ඔෆ් ද ඒසියා" නැමැති බෞද්ධ කාව්‍යය රචනා වන්නේ ඔහුගේ විශිෂ්ට නිර්මාණයක් හැටියට ය. ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ කීර්තිමත් විද්‍යාර්ථිකයෙකු වූ මෙතුමා සම්මානනීය කෘති රාශියක් ලෝකයට දායාද කළහ.**

ඒ කෘති අතර , එතුමාට ද මහත් ආලෝකයක් වූ ආසියාවේ ආලෝකය කෘතිය සුවිශේෂී වේ. 1849 වර්ෂයේ දී රචනා වූ මෙම කෘතියෙහි තේමාව අප ගෞතම බුදුරදුන් ය. මෙම කෘතිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලියවුණු පළමු බෞද්ධ සාහිත්‍ය නිර්මාණය යි. ලාංකේ ය බෞද්ධයන් ලෙස එය අගයකට යුතු ය.

අන්‍ය ආගමික ලෝකයට බුදුරදුන්ගේ චරිතය සහ එම යථාර්ථවාදී දහම හඳුන්වා දීමේ ප්‍රධාන ගෞරවයක් මෙම කෘතියට හිමිවිය යුතු ය. අබෞද්ධ ලෝකය තුළ ඇතැම්විට බුදුදහම පිළිබඳ වූ අශුභවාදී අදහස්වලට මෙයින් නියම පිළිතුර ලැබුණු බවට සැකයක් නැත. බොහෝ අශුභවාදී අදහස් ප්‍රතික්ෂේප වීමට මෙම නිර්මාණය උපකාරී විය . යථාර්ථවාදී බුදුදහම අසාවත් නොසිටි දස දහස් සංඛ්‍යාත පිරිස් ලොකු අවබෝධයක් සහ පැහැදීමක් නිර්මාණය කරගත්හ. එසේම පෙරදිග ඓතිහාසික චින්තනය අපරදිගට හඳුන්වාදීමේ ගෞරවය මෙම කෘතියට හිමිවේ.

සියවසක් තුළ එංගලන්තයේ පමණක් මුද්‍රණවාර හැට ගණනකින් මෙම කෘතිය එළි දක්වන්නට යෙදුණි .එසේම එක්සත් ජනපදයේ සියයකට අධික සංඛ්‍යාවකින් එළි දක්විණි. මේ තුළින් පිළිබිඹු වන්නේ මෙම ග්‍රන්ථය දිනූ පොදු ප්‍රසාදය යි. අන් සියලු ප්‍රධාන යුරෝපීය භාෂාවලට ද පරිවර්තනය වූහ.

ආනල්ඩ් මහතාගේ සාහිත්‍යකරණය කෙතරම්ම විශිෂ්ඨ ද යනවග පෙන්වාදීමට බොහෝ උදහරණ සපයාගත හැක. ඒ අතර වික්ටෝරියා රැජින විසින් ලබාදෙන ලද නයිට්නාමය ප්‍රධාන වේ. එසේම ලයිට් ඔෆ් ද ඒෂියා කෘති යෙහි විශිෂ්ටත්වය අවබෝධ කරගත් සියම් රජු ඔහුට office of the white Elephant නම් ගෞරව නාමය ප්‍රදානය කළහ.

ආසියාවේ ආලෝකය නම් කෘතිය තුළින් ආනල්ඩ් මහතා බෞද්ධ අබෞද්ධ සමාජය තුළ බුද්ධ ප්‍රතිරූපය ඔපගැන්වූ අතර ඊටත් එහා බෞද්ධ ලෝකයාගේ ගෞරවයට එතුමා පත්වූයේ බුද්ධගයාව බේරාගැනීමේ සටනේදී දැක්වූ දයකත්වය මත ය. 1886 දී ලංකාවට පැමිණි අවස්ථාවේ හින්දූන්ගෙන් බුද්ධගයාව බේරා ගැනීම පිළිබඳ මතය, පළමුවරට ඉදිරිපත් කළහ. ඉන්පසුව ආතර් ගෝඩ්න් ආණ්ඩුකාරවරයාට මෙන්ම මදුරාසි ආණ්ඩුකාර කොන්නෙමර සාමිවරයාට ඉහත කාරණය පිළිබඳ දැනුවත් කළහ. ඉන් නොනැවතුන එතුම කල්කටා ආණ්ඩුකාර ඔෆරින් සාමිවරයා ද අමතා මෙහි අවශ්‍යතාවය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා දුන්හ. තවද අති දුෂ්කර අත්‍යවශ්‍යම කාර්ය තමාගේ ජීවිත මෙහෙවර සේ පිළිගතයුතු බව අනගාරික ධර්මපාලතුමා වෙත අවධාරණයෙන් ම දන්වා සිටියේ එඩ්වින් ආනල්ඩ් ය. එංගලන්තයේදී බුද්ධගයාව බෞද්ධයන් අතට ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ ඇතැම් ව්‍යාපාර ද ආරම්භ කළහ.

ලාංකික , බෞද්ධයන් පිළිබඳ අසීමිත ගෞරවයක් මෙන්ම ආදරයක් එතුමා තුළ වීය. වැලිගම ශ්‍රී සුමංගල හිමියන් වහන්සේ එතුමා විසින් අමතනු ලැබුවේ තමාගේ ප්‍රඥවන්ත කල්‍යාණ මිත්‍ර යන, ගෞරව නාමයෙනි. ලංකාවේ බෞද්ධයන් මාගේ කල්‍යාණ මිත්‍රයන් වශයෙන් සලකන බව පැවසී ය.

එතුමන් බුදුරදුන්, බුදුදහම සහ බෞද්ධයන් පිළිබඳ අසීමිත ආදරයක්, ගෞරයක් දැක්වීය.

අප විසින් බුද්ධ චරිතය ඇතුළු බොහෝ කෘති කියවා ඇතිමුත් මෙම කෘතිය ඊට වෙනස් ය. වෙහෙර බිමක පින්කම් පොළක අසා ඇති බුදු දහමට වෙනස් ස්වභාවයක් මේ නිර්මාණය තුළ දැකිය හැකිය. මේ තුළ සුළු සුළු වෙනස්කම් සහිත මිහිරි කෘති පුවතක් අඩංගු වේ. මෙහි ඇතැම් ලෞකික බවක් පෙනේ. ඇතැම් තැනක රසය උද්දීපනය කර ඇති බවක් පෙනේ. ඒ තුළින් රස වැගිරෙන ස්වරූපයක් පෙන්නුම් කෙරේ. ආසියාවේ ආලෝකය නැමති කෘතිය හුදු බුදු බණ පොතක් නොවේ. එය බුද්ධ චරිතය ආශ්‍රයෙන් ගෙතුණු මිහිරි කවි පොතකි. මෙම පොතෙහි වටිනාකම හඳුනාගත් මහාචාර්ය විනී විතාරණ ශූරින් 2001 වර්ෂයේදී සිංහල බසට නැගුහ. ආසියා පෙහෙළිය ලෙස එතුමා එය නම්කොට බොහෝ පිරිසකට මහත් ප්‍රයෝජනයක් ලබාදීමට ක්‍රියා කළේ ය.

සර්ග අටකින් නිම වන ලද එම කාව්‍ය පාදකකොටගෙන එහි සරල අදහස ලාංකේය බෞද්ධ අබෞද්ධ ජනයා අතර බෙදා ගැනීමට මෙය හොඳම කාලය යි. ඒ තුළ ආනල්ඩ් ශූරින්ට මෙන්ම විනී විතාරණ ශූරීන්ට ද සසර කෙළවර කරගැනීමට මඟ පැදේ. එසේම බුද්ධ චරිතය රසවත්ව අධ්‍යයනය කිරීමේ හැකියාව බුදුසරණ පාඨකයන්ට හිමිවේ. එහෙයින් මෙය කොටස් ලෙස ඉදිරි කලාපයන්වලදී කියවීමට අවස්ථාව සැලසේ.




කොළඹ මහානාම විද්‍යාලයේ ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

# Buddhism for overcome Youth agitation

**For the continuation and useful existence of a society and for the event of a rustic youth is lifeblood and therefore the main vigorous active facet of a country that perceptive everything from the society effectively and sensitively. The restlessness will be recognized united of the dominant factors that demonstrates ethical, moral and social degeneration of the younger generation.**

The agitation can be defined as "characteristics by showing inability to remain at rest, unquiet, uneasy as a person, the mind or the heart". The youth agitation has been recognized as a very important social undeniable fact that ought to obsessionally be mentioned and given effective solutions. The arising of youth agitation may be seen in varied varieties of social phenomena like social, instructional, economical, sexual, relational, non-secular etc. the explanations and effectives for growing up youth agitation in each social context need to be recognized and understood to seek out solutions.

As a country in which the Buddhism exists, a certain contribution can really be gained in applying the



**Kundasale Subhagya Meheninwahance**
Lecturer, Religious course coordinator;
Intercollegiate Sri Lanka Education
Affiliated to the
University of Peradaniya

teaching of the Buddha to overcome the youth restlessness before being a stringent social problem.A pressure group is one that attempts to influence decision-makers or 'governing elite' for its own interests or the interests of a larger group that it represents. It wants the existing norms to be interpreted to benefit it. In an agitation, there is always a pressure group tactics but in a social movement, it may or may not be there.

The difference between an agitation and a social movement is that social movement may take the form of agitation but every movement does not do so. Many movements are peaceful, for example, women's liberty movement, the prohibition movement or the antinuclearmo vement. These peaceful movements are the result of cultural drift. Youth agitation is the behavior of the youth whose goal is neither injury to a person nor destruction of public property but social protest. It is neither the result of innate destructive drive nor it is an inborn reaction to frustrations. It is a learned behavior. Various forms of youth agitations are: demonstrations, slogan shouting, strikes and hunger strikes. We can see many solutions from the Buddhism for this agitation.



Buddhism does not want people to be like a withered log or a dead fire and to talk about the sufferings of this world in a serious manner all the time. Buddhism is a happy religion and hopes that everyone will find supreme peace and happiness. If Buddhism is a happy religion, why does it emphasize the suffering of life? It is because if you do not know suffering, you will not know happiness. Buddhism manly connects with the mind and teaching about the psychological background of the mind. Agitation is manly connecting with the mind setup. According to the Buddha, agitation cause to many social corruptions.

Jayaverapasavati
dukkhasetipar jito
upasantosukhaseti
hitvajayaparajaya.
(Dhammapada Verse 201, KosalarannoParajayaVatthu)

Every sentient being is so unique and has been gifted with talents to deal with life in their own way, since every one of us are coming along with habitual collection of so many different experiences through many lifetimes. Even in this life, we come across different people, environments and are influenced accordingly. So, the process of judgment differs from one person to another, due to different frames of references, different conditional process and simple habits that we are ingrained within from childhood. So, no book and person can meet the various requirement of every individual. Therefore, I am here to share some of my ideas to deal with conflicts and disputes.

**To be continued on 12th of July Asala Awa Atawaka Poya paper**

# ඡත්ත මානවක ගාථා

**සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩසිටින කාලයේ ඡත්ත නම් දරුවෙක් සිටියා. මේ ඡත්ත ශිල්ප ශස්ත්‍ර හැදෑරීම සඳහා ඈත ප්‍රදේශයකට ගියා.**

ඉගෙනීම අවසන් කළ ඡත්ත තම ගුරුවරයාට ගුරු පඬුරු ගෙන ඒම සඳහා නිවසට පැමිණියා. පඬුරුත් රැගෙන නැවතත් ගුරු ගෙදර බලා මහා වනයක් මැදින් ගමන් කළා.

එදින මහ කරුණාවෙන් ලොව දෙස බලන බුදුරජාණන් වහන්සේ ඡත්ත ව දිවැසින් දුටුවා. එදින ඔහුගේ මරණය සිදුවන බව බුදු ඇසට පෙනුණා. ඡත්ත මානවක කෙරෙහි උපන් අනුකම්පාවෙන් බුදුරජාණන් වහන්සේ ඔහු එන මාවතට වැඩිම කළා. ඔහු භාග්‍යවතුන් වහන්සේට වන්දනා කළා.

ඒ වනවිට ඡත්ත මානවක තෙරුවන් සරණ ගැන හෝ සිල්පද ගැන දැනගෙන සිටියේ නැහැ. බුදුරජාණන් වහන්සේ ඡත්ත මානවකගෙන් මෙසේ විමසා සිටියා.

" ඡත්ත ඔබ බුද්ධ, ධම්ම, සංඝ රත්නය ගැන දන්නවා ද? ඒ වෙලාවේ ඔහු කිව්වේ ඒ ගැන කිසිවක් දන්නේ නැහැ කියලයි. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ඡත්ත තෙරුවන් සරණයෙහි පිහිටවූවා. ඉන්පසුව පඤ්ච සීලයේ සමාදන් කරවූවා.

" ඡත්ත ඔබ අපිරිසුදු වූ නානාප්‍රකාර ප්‍රාණඝාත කරන්න එපා. ප්‍රාණීන් කෙරෙහි සංයමය නැති අය ගැන නුවණැති අය වර්ණනා කරන්නේ නැහැ. ඡත්ත ඔබ, පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි කියා පළමු සිල් පදය සමාදන් වෙන්න."

" ඡත්ත අනුන් විසින් රකින දේ තමන්ට දීලා නැත්නම් ඒ නොදුන් දේ ගන්න එපා. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි කියා දෙවැනි සිල්පදය සමාදන් වෙන්න".

" ඡත්ත අනුන් විසින් ආරක්ෂා කරන කාන්තාවන් ඉන්නවා. ඔවුන් කරා යන්න එපා. එය පහත් දෙයක්. එනිසා කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන තුන්වැනි සිල්පදය සමාදන් වෙන්න.

"ඡත්ත ඔබ අසත්‍ය බව දැන දැනත් එය කියන්න එපා. බොරු කීම නුවණැත්තන් වර්ණනා කරන දෙයක් නොවේ. මුසාවාද වේරමණී සික්ඛාපදසං සමාදියාමි කියන සිල්පදයේ සමාදන් වෙන්න."

"ඡත්ත පුරුෂයෙකුගේ හොඳ සිහිය නැතිවෙන්නේ යම් බීමත් කමකින් නම් ඒ හැම මද්‍යපානයක්ම දුරින් ම දුරු කරන්න". සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි පස්වන සිල්පදයේ සමාදන් වෙන්න.

ඡත්ත මානවකට විශාල සතුටක් ඇතිවුණා. ඔහු බොහෝ ම ගෞරවයෙන් බුදුරජාණන් වහන්සේ වන්දනා කර මුළු හදවතින් ම තෙරුවන් සරණ ගියා. සිල්පද ආරක්ෂා කරන්න පොරොන්දු වුණා. ඉන් පසුව සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඔහුට ගාථා තුනක් ඉගැන්වූවා.

**යොවදතං පවරෝ මනුජේසු –
සක්‍යමුනී භගවා කතකිච්චෝ
පාරගතෝ බලවිරිය සමංගී –
තං සුගතං සරණත්ථමුපේමි**

කතාබහ කරන මනුෂ්‍ය වර්ගයා අතර උත්තම වූ යම් කෙනෙක් ඉන්නවා. උන්වහන්සේ තමයි නිවන් මග සම්පූර්ණ කළ ශාක්‍ය මුනීන්ද්‍ර වූ භාග්‍යවතුන් වහන්සේ.තමන් වහන්සේගේ ප්‍රඥා බලමහිමයත්, චතුරංග සමන්වාගත වීර්යයත් නිසා සංසාරයෙන් එතෙරට වැඩියා. ඒ සුගතයන් වහන්සේ සරණ යන්න.

**රාග විරාග මනේජ මසෝකං–
ධම්මමසංඛත මප්පටිකූලං
මධුරම්මං පගුණං සුවිභත්තං
– ධම්මමිමං සරණත්ථමුපේමි**

ධර්මයක් තිබෙනවා. ඒ ධර්මයෙන් රාගය දුරු කරනවා. තෘෂ්ණාව නැති ශෝක නැති, පිළිකුල් රහිත වූ අසංඛත නිවනයි ඒ ධර්මය. මේ ධර්මය මධුරයි. හොඳින් ප්‍රගුණ වෙනවා. විස්තර විභාග සහිතයි. මේ ධර්මයත් සරණ යන්න.

**යත්ථ ච දින්න මහප්ඵලමාහු –
චතුසු සුචීසු පුරිසයුගේසු
අට්ඨ ච පුග්ගල ධම්මදසාතේ –
සංඝම් මං සරණත්ථමුපේමි**

යම් ආර්ය පිරිසකට දනයක් පූජා කළවිට මහත්ඵල ලැබෙනවා කියා කියනවා නම්, උන්වහන්සේලා පාරිශුද්ධ යුගල හතරකින් යුක්තයි. පුද්ගල වශයෙන් අට දෙනෙක් වෙනවා. මේ ආර්ය සංඝරත්නය ද සරණ යන්න

ඡත්ත බුදුරජාණන් වහන්සේට වන්දනා කර ගුරු ගෙදර බලා පිටත් වුණා. කැලයේ මැදින් ටික දුරක් යනවිට හොරු කණ්ඩායමක් මොහුට පහර දුන්නා. එහිදී ඡත්ත සිහි කළේ තිසරණය යි. තමන් සමාදන් වූ සිල්පද ගැනයි. ඔහු මිය යනවාත් සමගම තව්තිසා දිව්‍ය ලෝකයේ දිව්‍ය කුමාරයෙක් ව උපන්නා.

නයනා නිල්මිණී

## වෙහෙර වහන්සේ

බෞද්ධ විහාරස්ථානයක් දුර සිටම හඳුනාගත හැකි සලකුණ වෙහෙර වහන්සේයි. බුදු, පසේබුදු, මහරහත් ශාරීරික ධාතූන් වහන්සේ, පාරිභෝගික ධාතූන් වහන්සේ තැන්පත් කර ඇති පූජනීය වස්තුවක් නිසා බුදුන්,වහන්සේ, රහතන් වහන්සේ මෙන් බෞද්ධ ජනතාව වෙහෙර වහන්සේ යනුවෙන් ගෞරවාදරයෙන් සලකති. පොත්පත්වල ස්තූප වර්ග හයක් ගැන සඳහන් වේ. බුබ්බුලාකාර, ඝණ්ටාකාර, ධාන්‍යාකාර, ඝඨාකාර, පද්මාකාර හා ආම්ලාකාර වශයෙනි. දිය බුබුළක හැඩැති බුබ්බුලාකාර, ඝණ්ටාවක හැඩැති ඝණ්ටාකාර, වී ගොඩක හැඩැති ධාන්‍යාගාර ස්තූප අප රටේ ප්‍රධාන වශයෙන් දැකිය හැකි ය. ස්තූපය, ශක්තිමත් වෘත්තාකාර වේදිකාවක පේසාවළලු මත ධාතු ගර්භය, හතරැස් කොටුව, දේවතා කොටුව, කොත් කැරැල්ල හා චූඩා මාණික්‍යය යන අංගවලින් යුක්ත විහාරස්ථානයක උසම ගොඩනැඟිල්ල ලෙස ඉදිකර ඇත.

**නුගේගලයායේ මංගල හිමි**
4 ශ්‍රේණිය
බෝධිලංකාර මූලික පිරිවෙන
කතරගම

## බුදු හිමියනි



බුදු සමිඳු වඩින වා
නෙත් කැලුම් දිලෙන වා
හද බැතියෙන් පිදෙන වා
සාධු හඬ නැගෙන වා

දළදා සමිඳුන් අප නමදින් නේ
සිරි දළදා බුදු ගෞතම වන් නේ
දළදා සමිඳුගේ පිහිට ලබෙන් නේ
එපින් බලෙන් මට නිවන් ලැබෙන් නේ

**වැල්ලවාය සුබෝධ හිමි**
1 ශ්‍රේණිය
ශ්‍රී සුමන සාමනේර ආයතනය
හඳපානාගල

## අනගාරික ධර්මපාල තුමා



වර්ෂ 1864 සැප්තැම්බර් මස 17 වැනි දින මාතර හිත්තැටියේ දී මෙතුමා උපත ලැබී ය. මව්පියන් විසින් දෙන් ඩේවිඩ් හේවාවිතාරණ යනුවෙන් නම තබන ලද්දේ ය. පාසල් කිහිපයක ම අධ්‍යාපනය ලද ඩේවිඩ් උසස් අධ්‍යාපනය ලැබුවේ ගල්කිස්සේ තෝමස් විදුහලෙනි. ඩේවිඩ් නම් ඉංග්‍රීසි නාමය වෙනුවට 'ධර්මපාල' යන සිංහල නාමය තබාගත්තේ ය.

වර්ෂ 1891 දී මහාබෝධි සමාගම ආරම්භ කළේ ය. 'සිංහලයෙනි නැගිටිව් බුද්ධගයාව බේරා ගනිව්' යනුවෙන් බුද්ධගයාව බේරා ගැනීම පිණිස ජනතාව දැනුම්වත් කළ මෙතුමා පෙර අපරදිග රටවල පවා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කළේ ය. එතුමා දඹදිව වෙසක් උත්සව පැවැත්වීමට ද කටයුතු කළේ ය. මහාබෝධි නමින් සඟරාවක් ද ආරම්භ කළ අතර සිංහල බෞද්ධයා නමින් පුවත්පතක් ද ආරම්භ කළේ ය. 1933 දී පැවිදිබව ලැබූ උන්වහන්සේ ඉන්දියාවේ මූලගන්ධකුටි විහාරස්ථානයේ දී අපවත් වූ සේක.

**පී.ඒ. රෙසඳු බණ්ඩාර**
3 වසර
ශ්‍රී ප්‍රඥානන්ද මහ පිරිවෙන
මහරගම



# සදහම් අරණ

සංස්කරණය
**නයනා නිල්මිණී**

## ඇස් මහින්ද හිමි

තෂිනම්ගල නමින් ටිබටයෙ උපත ලැබ
කුල දෙටු නොමැති කල අයියගෙ සරණ ලැබ
ආවා ලක් දෙරණට 1914 දී ඉඩක් ලැබ
සුදුස්සාට සුදුසුම තැන ලොවින් ලැබ

අතට ගත් පෑනෙන් ලීවේ මගෙ රට ගැනය
ජාතික තොටිල්ලයි ලංකා මාතා නිදහස් දැහැනය
රට ගැන එන කැක්කුම මගේ දේශහිමානය
මැදින් මාසයේ උන්වහන්සේගේ ගුණානුස්මරණය

**දීත්ම සජාර ජයසිංහ**
2 වන ශ්‍රේණිය
සිරිවිමලසිරි ඉංග්‍රීසි දහම් පාසල
පොල්පිටිමූකලාන

## ස්වර්ණමාලී මහා සෑය

රන් රිදී මුතු මැණික් මැව්වලු සෑය ඉදිකරවන ලෙසින්
සුවඳ මල් වැහි සෑය වැන්දලු සක් දෙවිඳුගෙ අනුහසින්
පංචසිඛ දෙව්වරුන් ආවලු සෑය වඳිනට හදබැතින්
කොත් පළන්දන විට දී වැඩියලු රහත් හිමියන් සිව්කොණෙන්

ඓතිහාසික වරම් ලද සිව්බුදුවරුන් වැඩි පින්බිමයි
නාලොවින් ධාතූන් ගෙනත් තැන්පත් කළේ පූජා මැදයි
අනාගතයේ දහම රැකුමට නවවරක් ගිලි හුමියයි
උතුම් රන්වැලි මහා සෑ බිම තැනූ රජු දුටුගැමුණු වෙයි

**ඕෂධී කණිකා ශ්‍රී විද්‍යාතිලක**
රතනපාල දහම් පාසල, බලංගොඩ

## ආදර අම්මා



සැපදුක් විමසා නිතරම ළඟ සිටි
කවා පොවා සෙනෙහස පුදකර සිටි
කරුණා ගුණයෙන් ලොවේ උතුම් පිරි
අම්මා ලෙස ඇය ලොවේ සිටී

දරු දිවි මංපෙත අඳුරෙන් මුදවන
දිවි මං පෙත තුළ මිණි පහනක් වන
දරුවන්ගේ තුටු වෙනුවෙන් වෙහෙසෙන
දෙවනි බුදුන් ඇය නිවසේ සැමදින

**ඩබ්.ඒ.ඉෂාරා හංසනී**
11 ශ්‍රේණිය
බප/ගම් හේමමාලි මහා විද්‍යාලය
ගණේමුල්ල

## මෙත් වඩමු

මෙත්තා යනු මෛත්‍රිය යි. මිත්‍රකම, හිතවත් බව යනු මෛත්‍රිය යි. මෛත්‍රිය වඩන අයට ආනිසංස රාශියක් ලැබෙන බව මෙත්තානිසංස සූත්‍රයේ දක්වේ. හොඳින් නින්ද යෑම, හොඳින් අවදිවීම, නරක සිහින නො දැකීම, අමනුෂ්‍යයන්ට පවා ප්‍රිය වීම, මිනිසුන්ට ප්‍රිය වීම, දෙවියන්ගේ රැකවරණය ලැබීම, වස විස ආදියෙන් ගින්නෙන් හානි නොපැමිණීම වැනි අනුසස් රාශියක් ලැබේ.

මම වෛර නැත්තෙක් වෙම්වා, මම තරහ නැත්තෙක් වෙම්වා, මම දුක් පීඩා නැත්තෙක් වෙම්වා,

මම බිය උවදුරු නැත්තෙක් වෙම්වා, මම සුවපත් වෙම්වා, මා මෙන්ම ගුරු දෙගුරු, හිතවත්, අහිතවත්, මැදහත් අයට මෙන්ම සියලු සත්ත්වයින්ට මෙත් සිත පැතිරවිය හැකි ය.



**ඩබ්ලිව්. විශ්මි සංශෝතා**
07 වසර
අරන්දර සුචරිතවර්ධන දහම් පාසල
පොතුකොළණිය

## පැන විසඳුම්

දයාවංශ ජයකොඩි සහ සමාගම


**පහත සදහම් ප්‍රශ්නයට පිළිතුර පැහැදිලි ව ලියා අප වෙත එවන්න.**

උතුම් ආමිස පූජාව පිළිබඳව කෙටියෙන් නිර්මාණාත්මකව ලියා අපවෙත එවන්න.

.................................................................................

ජයග්‍රාහී දරුවෙකුට දයාවංශ ජයකොඩි සහ සමාගමෙන් දහම් පඩුරක් පිරිනැමේ.

## ළමා ප්‍රහේලිකා අංක 19




**ප්‍රථම ජයග්‍රාහකයා සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම් කේ.කේ. සුගතපාල මහතාගේ අනුග්‍රහයෙන් වටිනා ත්‍යාගයක් පිරිනැමේ.**

### හරහට

1.පස්මහ බැලුම් වලින් පළමුවැන්නයි
4.සිංහල සංදේශ කාව්‍යයන්ගෙන් එකකි
5.මෙවන් වෙලාවකින් වැදගත් කටයුතු ඇරඹීම මෙරට පවතින සිරිතකි
7.නව ග්‍රහයන්ගෙන් එකකි
8.සිත කිලිටි කරන ධර්මවලට කියන නමකි

### පහළට

1.පුද්ගල ශරීරයේ ආයතනවලින් එකකි
2.ශාක්‍යයන්ගේ මානය නැසීම වැනි අවස්ථාවලදී බුදුරජාණන් වහන්සේ මෙවන් මහා ප්‍රාතිහාර්යය පෑ සේක.
3.දෙව්ලොව පවතීයයි දක්වන මල් වර්ගයකි
6.මෙම මාසය තුළ අකුණු ගැසීම අධික යයි පැවසේ
7.බුදුරදුන් තපස්සු සහ භල්ලුක දෙබෑයන්ට දුන්නේ මෙම ධාතුන් ය

# මිතුරාගේ නික්ම යෑම

## මණිකණ්ඨ ජාතකය

**"ඉල්ලීම නම් කවුරුත් නොකැමැති දෙයකි. බොහෝ සම්පත් ඇති අය පවා ඉල්ලීමෙන් අමනාප වේ."**

තථාගතයන් වහන්සේ අලව් නුවර අග්ගාල චෛත්‍ය භූමියෙහි වැඩ වාසය කරන සමයේ මහ කාශ්‍යප මහ රහතන් වහන්සේ දිනක් අලව් නුවර පිඬු සිගා වැඩියා. කාශ්‍යප තෙරුණ් වහන්සේ දුටු සැණින් මිනිසුන් ගෙවල් දෙරවල් වසා සැඟවෙන්න වුණා. දන් පිඬක් බෙදන්නට කිසිවෙකුත් ඉදිරිපත් වුණේ නැහැ. පසුව උන් වහන්සේ බොහෝ දුර ඇවිදලා දුක සේ පිණ්ඩපාතය ලබා ගෙන වැළඳුවා. එදා ම බුදු රජාණන් වහන්සේ බැහැ දැක

" ස්වාමීනි, පෙර අලව් නුවර පිඬු සිඟා වඩින විට බොහෝ සිව්පසයෙන් සංග්‍රහ ලැබෙනවා. එහෙත් මෙවර මා පිඬු සිඟා ගිය ද දුටු දුටු මිනිසුන් හියෙන් තැති ගෙන අප මඟ හැර සැඟව යනවා." යි කියා සිටියා.

සර්වඥයන් වහන්සේ ඒ සැඟවෙන්නා වූ කාරණය දැන අලවු නුවර වාසි සියලු භික්ෂූන් වහන්සේලා කැඳවා

" තොප විසින් අලව් නුවර වැසියන්ට හිරිහැර වන අයුරින් 'අපට ගෙවල් ඉදි කරන්නට කැති දෙවයි, පොරෝ දෙවයි,' කිය කියා නොයෙක් බඩු බාහිරාදි දේ ඉල්ලා කරදර කරන බව සැබෑවක් ද ? යි විචාළා. ඒ භික්ෂූන් වහන්සේලා ද තම වරද පිළි අරගෙන " එය සැබෑවයි ස්වාමීනි " කියා පිළිතුරු දුන්නා.

" මහණෙනි ඉල්ලීම නම් කාට වුවත් නොසතුටු අකමැති දෙයක්. සාමාන්‍ය වැසියා පමණක් නොව මහත් ධන සම්පත් ඇති අය පවා තමන්ගෙන් යම් දෙයක් ඉල්ලනවට අකමැතියි. පෙරත් එක් මණිකණ්ඨ නම් නාග රාජයෙකු තමාගේ ගෙල තිබූ කණ්ඨ මැණික්‍ය ඉල්ලූ කල්‍යාණ මිතුරු තාපසතුමාවත් අතහැර දා පලා ගියා. එනිසා මහණෙනි ඉල්ලීම නම් නුසුදුසුම වෙයි." යනුවෙන් වදාළා. රැස්ව සිටි භික්ෂූණ් වහන්සේලාගෙන් ලද ආරාධනාවෙන් බුදු රජාණන් වහන්සේ ඒ අතීත කතාව ගෙනහැර දැක්වූවා.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්ම දත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන සමයේ අප මහා බෝධිසත්වයන් වහන්සේ එක් බමුණු කුලයක ඉපදුණා. ඔහු වැඩි වයසට පැමිණි පසු සහෝදර මලණුවන් සමඟින් ගිහිගෙය සම්පත් අතහැර දමා හිමාල වනයට පිවිස ගඟක් සමීපයෙහි ආරාම සකස් කර ගත්තා. වැඩිමහල් සහෝදරයා ගඟ ඉහළත් බාල සහෝදරයා ගඟ පහළත් පන්සල් ගෙවල් සාදා තවුස් දම් පුරමින් බවුන් වඩන්නට වුණා.

බෝධිසත්වයන්ගේ මලණුවන් වසන්නා වූ පන්සල ඇති කිට්ටුව ගඟෙහි මණිකණ්ඨ නම් නාග රාජයෙක් හිටියා. දිනපතා පැමිණ මනුෂ්‍ය වේශයෙන් ඒ තාපසයාගේ පන්සල සමීපයේ සක්මන් කරමින් සිටියා. නිතර දකින්නට ලැබුණු නිවුණු, තරුණ තාපසයාගෙන් කරදරයක් නොමැති බව දැනගත් නා රජු තාපසයා සමඟ කල්‍යාණ මිත්‍රකමක් ඇතිකර ගත්තා.

දිනපතා පන්සලට පැමිණ මනුෂ්‍ය වෙශයෙන් සිට ආපසු යන අවස්ථාවේ නාග වේශයෙන් තාපසයාව වෙලා සෙනෙහසින් සිප පෙනය හිස මත තබාගෙන ටික වේලාවක් සතුටින් සිට නැවත දරණවැල හකුලා තාපසයාට වැඳ නාග භවනයට නික්ම යාම සිරිතක් කර ගත්තා.

සැමදාම මෙසේ පැමිණ ඇඟ වෙලන අවස්ථාවේ තාපසයන්ගේ ඇඟ ගැවෙත් ගැවෙත්ම බියෙන් වෙවුලා ගියා. තාපසයා ටික දිනකින් ම ඉතා දුර්වල ව ශරීරය සුදු මැලි වී වැහැරී ගියා.

මේ අතර එක් දවසක් බෝධිසත්ව තාපසයා තමන්ගේ සහෝදර තාපසයා දකින්නට ගඟ පහළ පන්සලට ගියා. බෝධිසත්වයෝ තාපසයාව දැක

" ඔබගේ ශරීරය මෙලෙස දුර්වල වන්නට හේතුව කුමක් දැ' යි ඇසුවා.

"සහෝදරයාණෙනි, මණිකණ්ඨ නම් නාග රජයෙක් දිනපතා පැමිණ මා වෙලාගෙන ආදරයෙන්, සෙනෙහසින් හිස මත පෙනය තබාගෙන සතුටින් නික්ම යනවා."

"මා එයින් බියට පත්ව වෙවුලා යනවා. ඔහු ඉවත්ව යනතුරු මා සිටින්නේ දැඩි අපහසුතාවයෙන් මෙන්ම බියකින්. මාගේ ශරීරය දුර්වල ව වැහැරී යන්නට හේතුව එයයි." කියා තාපසයා පිළිතුරු දුන්නා.

" එසේ නම් ඒ නාගයා සමීපයට නොපැමිණෙන්නේ නම් ඔබ කැමැති ද?"

" එය ඉතා යහපත්, නා රජු නොඑන්නේ නම් මා සිත සමාධිගත වෙයි. "

" ඒ නා රජ්ජුරුවන් පැළඳගෙන එන්නේ කුමන ආභරණයක් ද?"

" කර පළඳිනා මණිකණ්ඨ මාණික්‍යයි"

" එහෙනම් ඒ නාග රජු තොප සමීපයට ආ පසු උන් පැළඳගෙන ආවා වූ කණ්ඨ මාණික්‍යය ඉල්ලන්න."

'එවිට නා රජු ඔබෙන් පලා යයි. දෙවන දවස් ඔබ වෙලා නොගෙන සමීපයට වී සිටී. එවිටත් එම මාණික්‍යය ඉල්ලන්න.

තෙවන දවස් ඇතින් ම සිට ඔබට කතා කරයි. එවිටත් මාණික්‍යය ඉල්ලන්න.

සිවුවන දින ගඟින් ගොඩට නැවිත් ජලයේම සිට ඔබ දකී. මෙසේ ඔබ නිතර ඔහු සතු වටිනාම සම්පත ඉල්ලන්න. එවිට ඔහුගේ නොපැමිණීම සිදු වෙනවා. "යි බෝධිසත්වයෝ පැවසුවා.

මෙසේ ඒ තාපසයෝත් නා රජු පැමිණ ඇඟ වෙලා ගත් විට ම

" ඔබගේ ගෙල තිබෙන කණ්ඨ මාණික්‍යය මට දෙන්නැයි" ඉල්ලුවා.

නා රජු වෙලාගත් දරණ බුරුල් කර තාපසයාගෙන් ඉවත්ව සිටියා. දෙවන දවසත්, තෙවන දවසත් මෙසේ මාණික්‍ය ඉල්ලුවා. නා රජු දියෙන් මතු වී තාපසයා දෙස බලා සිට "මට අහාරපාන ආදි බොහෝ ලාබ සත්කාර ආදිය උපදවා දෙන කණ්ඨ මාණික්‍යය කෙසේ නම් ඔබට දෙන්නේ ද? එසේ හෙයින් තොපගේ පන්සලට නැවත නොඑන්නේමි." කිවා.

'මාගේ බොහෝ සම්පත් තිබියදී මා පණ මෙන් රකින කණ්ඨ මාණික්‍යයම තොප ඉල්ලයි.' දිනක තාපසයා විසින් මාණික්‍යය පැහැර ගනී' යන බියෙන් නා රජුගේ පැමිණීම නතර කරදියේ කිමිදී නාග භවනයටම ගියා.

එතැන් පටන් නා රජු එත්දැ යි නිතර විපරමින් කල් යවන්නට තාපසයාට සිදු වුණා. තමා බියෙන් හෝ ආදරය කළ සෙනෙහස දැක් වූ ඒ නාග රජුගේ නොපැමිණීම නිසා ශෝකී තත්ත්වයට පත් තාපසයෝ තවත් දුර්වලව වැහැරී ගියා. බෝධිසත්ව තාපසතුමා තම මලණුවන්ගේ සුව දුක් දකින්නට පසු කලෙක පැමිණියා. පෙරටත් වඩා සුදු මැලි වුණු සිරුරින් දුර්වලවී සිටින මලණුවන් දැක "කුමක් නිසා දැන් ඔබ මේ දුර්වල වූයේ දැ' යි විචාළා.

"කල්‍යාණ මිත්‍ර වූ මාගෙ යහලුවා, මණිකණ්ඨ නා රජු නොදැකීමෙන් දුර්වලව ගියෙමි." පිළිතුරු දුන්නා.

"මොහු නාගයා කෙරෙහි මහත් සෙනෙහස උපදවා සිටී. එනිසා නයා කෙරෙහි සෝකයෙන් මරණයට පත් වුවහොත් මොහුගේ පරලොවත් දුගතියට යනවා. මා මොහුට උපන් සෝකය දුරු කළ යුතුයි" සිතා.


" මලණ්ඩ නොඉල් විය යුතු දෙය ඉල්ලීමෙන් ඊට සෝක උපදියි" එනිසා සෝකය අත් හරින්න. තමන් කැමති, ආදරය කරන, තමාගේ වටිනා වස්තූන් ඕනම කෙනෙකුට තියෙන්න පුළුවන්. එය නිතර නිතර කිසි විටකත් නොඉල් වන්න. එසේ ඉල්ලීමෙන් යහලුකම්, සහෝදරකම්, ඥාතිකම් පවා අතහැර දමන්නට පෙළඹෙනවා. එයින් උපදින්නේ සෝකයක් පමණී."

යනුවෙන් බෝධිසත්වයෝ බොහෝ අවවාද කොට තමන්ගේ පන්සලට ම ගියා. මල් තාපසයා ද තම සිත් වූ සෝකය අත් හැර දැමුවා. දෙදෙනාම බවුන් වඩා පංච අභිඥා, අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන ලාභින් වුණා. පසුව නොපිරිහුනු ධ්‍යානයන්ගෙන්ම මරණයට පත්ව බඹ ලොව උපන්නා. යයි වදාරා බුදු රජාණන් වහන්සේ මණිකණ්ඨ ජාතක කතාව නිමවා වදාළා. "එසමයෙහි බෝධිසත්වයන්ගේ මලණුවෝ නම් ආනන්ද ස්ථවිරයෝ යි.

අවවාද කී තාපසයා නම් බුදු වූ මම්ම " නොවේ දැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.



අනුරාධපුර කුට්ටම්පොකුණ විහාරාධිකාරී ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**කිවුලතලාවේ සමිත හිමි**





## රාහුල මාතා දක්ම

පෙරුම් පුරා ආවෙමි මුළු සසර පුරා
ලෝ සත දනන් දුක් ගින්නෙන් මුදන තුරා
සන්තානයේ දැල්වුණි මෙත් සිසිල පෙරා
හිමිසඳු බුදු වුණා මගෙ නෙත් තිබෙන තුරා

**එල්. මල්ලිකා ජයසිංහ**
පානදුර

## පහන් සිතක කවි

## අබිනික්මන

සතර පෙර නිමිති දුටු ගිහි දිවියෙ දැක නුහුරු
නොතිර ජීවිතයෙ තතු හැඳින සිදුහත් කුමරු
අතැර තමනට උරුම රාජ සම්පත් ඉසුරු
එතෙර විය ගං තෙරෙන් චන්න සමගින් මිතුරු

පැළැඳි අභරණ සේල හතික පොදිබැඳ එකට
කරුණු පැහැදිලි කරන් දුණි චන්න මැති අතට
ගමන දෙස බලා සිටි කුමරු යන මග එපිට
පිනැති කන්ථක එතැන මියැදුණා ලද දුකට

වට්ටාරම **ටී. ඇම් . පොඩිරාලහාමි**

## කාලය

**අතීතේ**
**අනාගතේ**
**වත්මනේ**
**සිතිවිල්ලක්**
**කාලයක් නැහැ**
**කාලයම**
**මිත්‍යාවක්**

පරගම්මන – **නන්ද**



## ඇසළ සඳ

වෙසක් පොසොන් සඳ බැස ගොස් ඇසළ සඳ
පායාලා නිල් ගුවනේ දිලෙන විට
මුළු ලොව සිසාරා රැස් කඳ බෙදන විට
සිහිවේ උතුම් බුදු හිමිගේ නිමල ගුණ

බෝසත් කුමරු මහමායා මවු කුසෙහී
ඇසළ පෝයද ගැබ්ගත් සිරි අසිරී
අබිනික්මන් කළ රෑ ගුවනේ දිලිහී
ඇසළ සඳේ ඔබ සිටියා එළිය දිදී

සම්බුදු පදවි ලැබ කරමින් කෙලෙස් දුරු
ඉසිපතනයේ මිගදයට වැඩම කෙරූ
පස්වග තවුස් වෙත දම්දක් දෙසූ බුදු
හිමි දුටු ඇසළ සඳ අදටත් නුඹෙහි ගුරු

මාලබේ **කේ. ඩබ්ලිව් . සිරිසේන**

## කවි කිවිඳියනට සතර පෝ දාටම දහම් තුටු පඬුරු

**බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.**

**බුදුසරණ**
**පහන් සිතක කවි**
BCC

| | |
|---|---|
| **සම්පූර්ණ නම** | :- ........................................................ |
| **ලිපිනය** | :- ........................................................ |
| **දුරකථන අංකය** | :- ........................................................ |

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා, පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.**

# වැරදුණ තැනින් පටන් ගත්තා

**මිනිස්සු ජීවත් වීම සඳහා බොහෝ ක්‍රමෝපායන් සොයති. ඇතැමෙක් දැහැමිව ද ඇතැමෙක් අයථා මාර්ගයෙන් ද ධනය උපයති. ජීවිතයේ අපට වරදින්නට මහ වෙලාවක් යන්නේ නැත. එවැනි මඟ වැරදුණ මිනිසුන් සමාජයේ දී කොතෙකුත් හමුවේ.**



## දැවෙන සිත්

"හිරගෙදර විශ්ව විද්‍යාලයක් වුණා මට"

කලකට පෙර හිර ගෙදරදි හමු වූ ඔහු මා හා පැවැසුවේ මද සිනා ඇතිවය.

මහ උළුගෙදර තපින්නට වුණා යැයි කියමින් පසු තැවිලි වන මිනිසුන් අතර ජීවිතයේ නව මානයක් සොයා යන මිනිසුන් එහිදි අපට හමු වී ඇත. මේ එවන් මිනිසෙකුගේ කතාවකි.ඔහු පෙනුමින් හැඩිදැඩි ය. උස මහත ය. බැලූ බැල්මට මේ මහා නපුරු කෙනෙකැයි කෙනෙකුට සිතේ. ඇසකින් කඳුළක් නොසලන්නේ යැයි සිතිය හැකි මේ මිනිසා ධම්මික යන අන්වර්ත නාමයකින් ඔබට හඳුන්වා දෙමි.

කඳුළු පිරි දෙනෙතින් ඔහු පෙරදිනෙක පන්සල් වාට්ටුවේ දී සිය කතාව කීවේය.

"මට හිටියා ලස්සන පුංචි දුවක්. මගේ බිරිඳ රස්සාවක් කරනවා. මම සුළු ව්‍යාපාරයක් කළේ.

මට තිබුණේ පුංචි ගෙයක්. ඒ ගෙදර අප බොහෝම සතුටින් ජීවත් වුණා. නමුත් මගෙ යාළුවෝ ලොකු වාහන අරගෙන, මාලිගා වගේ ගෙවල් හදාගෙන බොහෝම ලස්සනට ජීවත් වෙනවා දැක්කා ම මටත් හිතුණා ඒ වගේ වෙන්න ඕන කියලා. මගේ බිරිඳ බොහෝම සරල ව ජීවත් වෙන්න කැමති කෙනෙක්. එයාට ඕන වුණේ දුවගේ අනාගතය හදන්න. මම ඉස්සර හම්බ කරන හැම රුපියලක්ම ගෙනැල්ලා දුන්නේ බිරිඳගේ අතට. ඇය ඒ මුදල් බොහෝම සීරුමාරුවට වියදම් කළේ. අපි දෙන්නා ම රස්සාවල් කළ නිසා ගෙදර අගහිඟකම් තිබුණේ නැහැ. අපේ පුංචි පවුල දිහා හැමෝම බලාගෙන හිටියා කියලා මම දන්නවා. ඒත් මට ඕන වුණා ලොකු සල්ලිකාරයෙක් වෙන්න. මම රෑ තිස්සේ කල්පනා කළා වැඩියෙන් සල්ලි හම්බ කරන්නේ කොහොමද කියලා.

"ඇයි රෑ තිස්සේ ඇහැරිලා කල්පනා කරන්නේ"

බිරිඳ මගෙන් කිහිප දවසක් ම ඇහුවා. ඒ වෙලාවට මම මොනවා හරි කියලා මගහැරියා. පෝසතෙක් වෙන්නේ කොහොමද කියලා කල්පනා කරන විට මට මතක් වුණා මගේ ස්ලලිකාර යාළුවෙක් ගැන. මම පසු දා ම ඔහු හමුවෙලා මේ බව කීවා.

"මා එක්ක එකතු වෙන්න... හැබැයි කිසිදෙයක් පිටට දෙන්න එපා"

ඔහු මට කිව්වා

මම මගේ ව්‍යාපාරය කරන ගමන් ඔහු සමග එක් වුණා. හැමදෙයක් ම වුණේ රහසිගතව ම. මම සල්ලිකාරයෙක් වුණා. දවසට මුදල් මිටි ගණන් ගෙදර ගෙනාවේ.

"කොහෙන්ද මෙච්චර සල්ලි. අම්මලා අහනවා මගෙන් මේ තරම් ලොකු වාහනයක් ගත්තේ කොහොමද කියලා."

බිරිඳ අහන්න ගත්තා.

"ඒවා වැඩක් නැතේ."

මම එහෙම කියලා මඟ හැරියා. සල්ලි ගැවසීමත් සමඟ අප, අපෙන් ඈත් වුණා. අලුත් යාළුවෝ ඇති වුණා. සමාජ ශාලාවලට ගියා. මට මගේ බිරිඳ හොඳ නැති වුණා. ලස්සන මදි වුණා. මගේ එකම දරුවා, බිරිඳ දවසින් දවස මගෙන් ඈත් වුණා. වෙනදාට වේලාසන ගෙදර ආ මම ඇතැම් දවසට ගෙදර එන එක මඟ හැරියා. අප අතර නිතර ආරවුල් ඇති වුණා. දවසක් බීමත් ව හිටපු මම බිරිඳට හොඳටම පහර දුන්නා. මට ඇය සහ දරුවන් පෙන්නන බැරිව ගියා. ඒ අය මහගෙදර ගියා. මගේ හිතුවක්කාර හිත සල්ලි මත්තෙම නැහැණා. මම ගෙරදට වෙනත් කාන්තාවක් ගෙනාවා. ඒ තමයි ජීවිතේ සතුට. මට හිතුණේ එහෙමයි. ඒත් දවසක් පොලිසියට අසුවුණා. මගෙ යාළුවා හැම වරදක්ම මා පිට දාලා බේරුණා. මගේ ගේ දොර හැමදේම නැති වුණා."

ධම්මික දෑසේ කඳුළු පුරවාගෙන පවසන්නට විය. බිරිඳ දරුවෝ සිහිකරන විට ඔහු දෑසේ පිරුණ කඳුළක් බිම වැටෙයි.

යාළුවත් එක්ක එකතු වෙලා මොකද කළේ.

යාළුවා ඒජන්සියක් කළා. මැදපෙරදිග, යුරෝපා රටවලට තරුණ තරුණියන් යැව්වා. අන්තිමට යාළුවා සල්ලි අරන් රටින් පැන්නා. ඔහු කිව්වේ ටික දවසකට යනවා කියලා. ඒත් හැම වරදකටම අහුවුණේ මාවයි. ඇත්තම කිව්වොත් මම වරදක් කළා. මම දැනගෙන හිටියා ඔහු ඒ දේවල් නීත්‍යානුකූල විදිහට කරන්නේ නැහැ කියලා. ඒත් සල්ලි වලට තියෙන ලෝභකම මගේ ජීවිතේ වරදටම ඇද දැම්මා. මට අවුරුදු ගණනක සිර දඬුවමක් නියම වුණා.

මම දන්නවා මගේ දරුවන් බිරිඳ අම්මා තාත්තා හැමෝම මම නිසා ලජ්ජාවට පත් වුණා කියලා. මගේ කියන කිසිම කෙනෙක් මා බලන්න ආවේ නෑ මුලදී වයසක අම්මයි තාත්තායි මාව, බලන්න එනවා.

මට මගේ හිත හදා ගැනීම පහසු වුණේ නෑ. කවදාවත්ම හිර ගෙදරකට ආවේ නැති මම බොහෝම අමාරුවෙන් තමයි මේ ජීවිතයට හුරුවුණේ."

අවුරුදු ගණනක් හිර ගෙදර ගතකරන ධම්මිකගේ හිත දැන් හැදිලද කියලා ඇහුවා ම ඔහු බොහොම් අහිංසක විදිහට හිනා වුණා.


ඔව්... බොහෝ දුරට හිත හැදිලා. හිරගෙදර කියන්නේ අපට වැරදි හදාගන්න හොඳ තැනක් කියලා මට හිතෙනවා. මට මෙහෙ ආව අලුත නින්ද ගියේ නෑ. මට හිතුණා ජීවිතේ නැති කර ගන්න ඕන කියලා. ඒත් අන්තිමට මම ධර්මය පැත්තට යොමු වුණා. භාවනා වැඩසටහන් වලට සම්බන්ධ වුණා. අපිට අපේ අකීකරු සිත හදා ගන්න තියෙන හොඳම ක්‍රමය තමයි භාවනාවට යොමු වීම. බුදුන්ගේ සද්ධර්මය අසුවාට විතරක් වැඩක් නැහැ. ඒ ධර්මය පිළිපැදිය යුතුයි. මම හැම පෝයටම සිල් සමාදන් වෙන්න පටන් ගත්තා. දැන් මගේ හිත බොහොම සන්සුන්. මට කිසිම කෙනෙක් එක්ක තරහක් නෑ. මගේ බිරිඳ පිටරටක ඉන්න එයාගේ ඥාතියෙක් ළඟට ගිහිල්ලා දරුවත් එක්ක. එදා මගේ සල්ලි නිසා මා එක්ක හිටිය කිසිම යාළුවෙක් , මා එක්ක ආව ගිය එකම කාන්තාවක් වත් දැන් මා එක්ක නැහැ. ඔවුන්ට මම කියලා කෙනෙක් හිටියද කියලත් මතක නැහැ. ජීවිතේ අප මේ කරන බොරුව මොකක්ද කියලා මට හරියටම වැටහෙන්න ගත්තේ හිරගෙදර ඇවිල්ලා ටික දවසක් ගියාට පස්සේ

අප ආශාවන්ට වහල් වුණා ම තමයි අපිට ජීවිතේ වරදින්නේ. මම හැමදාම නින්දට කලින් මෛත්‍රී භාවනාව කරනවා. මගේ හිත සන්සුන්. තවත් සති කිහිපයකින් මම මෙතැනින් නිදහස් වෙනවා." ධම්මික පවසන්නේ බොහෝ සන්සුන්ව.

අනොරක් නැතිව උපදින බලාපොරොත්තු හා ආශාවන් පසුපම යන්නකුට අවසනදී උරුම වනුයේ දුකම පමණි.

**ඉනෝකා සමරවික්‍රම**

# සිතෙහි සැනසුම තමන් තුළ ම ය



අස්ගිරි මහාවිහාරීය
කාරක සංඝ සභික
ඓතිහාසික බදුලු මුතියංගන
රාජ මහා විහාරීය භාරකාර
ආචාර්ය
**මුරුද්දෙනියේ ධම්මරතන නා හිමි**

**සිතක් දූෂිත කරන සිතිවිලි හා සිතක් පිරිසිදු කරන සිතිවිලි මනස තුළ පහළ වීම ලෞකික සිතක සාමාන්‍ය ලක්ෂණයකි. දූෂිත සිතිවිලි අකුසල හා පාප සිතිවිලි වන අතර ඒවා පහළවීමෙන් පුද්ගල මනස නිරතුරුව අපිරිසිදු කරයි. එවැනි සිතක් ඇති පුද්ගලයා අනර්ථයට පමුණුවයි. මනසට මහත් පීඩාවක් ගෙන දෙයි. මානසික සතුටක් නොදැනෙයි.**

## මනසට බර දෙන්නේ කුමටද?

දූෂිත සිතිවිලි මනසට මහත් බරක් ගෙනදෙයි. එනමුදු පිරිසිදු සිතිවිලි කුසල හා පුණ්‍ය සිතිවිලි වන අතර, එම සිතිවිලි පහළ වීමෙන් පුද්ගල මනස නිරතුරුව පිරිසිදු කරයි. එවැනි සිතිවිලි සහිත මනසක් හෙබි පුද්ගලයා යහපතට යොමු කරයි. එම සිතිවිලි මනසට මහත් අස්වැසිල්ලක් වේ. මානසික සතුට එවැනි සිතක නිරතුරුව රැඳෙයි.

මෛත්‍රී සිත අවෛර වූවක් හා, හිංසා පීඩා සහගත සිතිවිලි රහිත වූවක් වශයෙන් මහා සීහනාද සූත්‍රයෙහි දැක්වේ. ඒ අනුව මෙත් සිතිවිලිවලින් පිරුණු සිතක වෛරය හා අනුන්ට හිංසා පීඩා පමුණුවන සිතිවිලි නොමැත.

මෙත් සිත ප්‍රකට වන අවස්ථා තුනක් සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වේ. මෛත්‍රී සහගත කාය කර්මය පළමුවැන්නයි. ඒ ඒ අවස්ථානුකූලව කායික ව සිදු කරන යහපත් ක්‍රියාවන් මෙයින් අදහස් කෙරේ.

විහාරස්ථාන වෙත පිවිසීම, භික්ෂූන් වහන්සේලාගේ පිට හා පාද පිරියම් කිරීම, අන්‍යයන්ට පිහිටවීම, උපකාරයක් අවැසි පුද්ගලයන්ට උපකාර කිරීම, උදව් කිරීම, දෙමාපියන් වැඩිහිටි අසල්වැසි සැමටත්, තිරිසන් සතුන්ටත් උපකාර කිරීම හා ගහකොල ඇතුළු ස්වභාව ධර්මය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම, ගිහියන් විසින් බෝධිය සෑ ආදී ස්ථාන වන්දනා කිරීම, පිඬු පිණිස වැඩි භික්ෂූන් වහන්සේලාට පෙර ගමන් කිරීම, පාත්‍රය පිළිගැනීම, ආසන පැණවීම, පසුගමන් කිරීම වැනි කය මුල් වී සිදු කරන ක්‍රියාවන් මෛත්‍රී සාහගත කාය කර්මයන් ය.

තවද අසරණ වූ අයට පිහිට වීම, කිසිවෙකුට හිංසාවක් නොකිරීම, සියලු දෙනා තමා මෙන් සිතා කටයුතු කිරීම ආදිය ද මෛත්‍රී කාය කර්මයට ඇතුළත් වේ.

මෛත්‍රී සහගත වාචසික ක්‍රියාවන් දෙවැන්නයි. යම් පුද්ගලයෙක් අවස්ථානුකූලව තමන්ගේ හා අනුන්ගේ යහපත වෙනුවෙන් කියනු ලබන ප්‍රකාශයන් වචී කර්මයට අයත් වේ. යහපත් ක්‍රියාවන් සඳහා අනුන් දිරිමත් කරමින් යම් යම් දේ පැවැසීමත්, බුද්ධ දේශනාව සෙසු පිරිසට කියා දෙමින් සියලු දෙනාගේ සුභ සිද්ධිය ඇති කිරීමත් මෙත් පෙරටු කරගත් වචනයෙන් සිදු වේ. තවද කමටහන් පිළිබඳ කථා කිරීමත් "සෑ බෝධීන් වන්දනය සඳහා යමු, මල් පහන් පුදමු, සලාක බත් දෙමු, වස්සාවාසික පිරිනමමු, භික්ෂූන් සිව්පසයෙන් පුදමු" වශයෙන් සෙසු පිරිස උත්සාහවත් කරමින් කථා කිරීම ද වචී කර්මයයි.

මෛත්‍රී සහගත සිතින් ජනිත සිතිවිලි සහිත මනෝ කර්මය තෙවැන්නයි. මෙත් සිත පෙරටු කර ගත් නානාවිධ සිතිවිලිවලින් මනස පූර්ණය කර ගැනීම එහි ලක්ෂණයයි.



> මෙත් සිත නිරතුරුව වැඩිය යුතු දෙයකි. එසේම පුරුදු පුහුණු කළ යුතු සිතිවිල්ලකි. එය කෙමෙන් කෙමෙන් වර්ධනය කළ යුතු වූවකි. තමන්ටත් , පසුව සෙසු අයටත් පතුරුවාලීමෙන් මෙත් සිත වර්ධනය වේ.

## ශක්තිමත් සිතක්

මෙත් සිත නිරතුරුව වැඩිය යුතු දෙයකි. එසේම පුරුදු පුහුණු කළ යුතු සිතිවිල්ලකි. එය කෙමෙන් කෙමෙන් වර්ධනය කළ යුතු වූවකි. එනිසා තමන්ටත් , පසුව සෙසු අයටත් පතුරුවාලීමෙන් මෙත් සිත වර්ධනය වේ. මෛත්‍රී සහගත සිතිවිලි නිතර ක්‍රියාවෙහි යෙදවීමෙන් පුහුණුවක් ඇති වේ. එය පරිචය නමින් දැක්වේ. යහපත් සිතිවිලිවලින් ශක්තිමත් මනසක් ඇති එමෙන්ම, මනා පරිචයක් ඇති පුද්ගලයාට කුමන ස්ථානයක දී වුව ද කුමන පුද්ගලයෙකුට වුව ද මෙත් සිත පැතිරවීමේ හැකියාව උපදියි. ඔහුගෙන් තමන්ටත් අනුන්ටත් යහපතක් මිස අනර්ථයක් කිසිදාක සිදු නොවේ. එවැනි පුද්ගලයා තමාගේ දියුණුව මෙන්ම සෙසු අයගේ දියුණුවත් කැමැති වේ. එසේම මෙත් සිතක් ඇති පුද්ගලයා තමන්ටත් අනුන්ටත් නිසිලෙස ආදරය කරයි. මිනිස් තිරිසන් සැමටත් ගහකොළ වන සිව්පාවුන්ටත් ආදරය කරයි. සියලු දෙනාටත් සියලු දේටත් ඇලුම් කරයි.

මෙත් පැතිරවීමේ ක්‍රමවේදයන් කිහිපයක් සූත්‍ර දේශනාවල සඳහන් වේ. කරණීයමෙත්ත සූත්‍රය, ඛන්ධ පිරිත, මෙත්තානිසංස සූත්‍රය, මිත්තානිසංස සූත්‍රය යන දේශනාවන් පොදුවේ ප්‍රචලිත බුද්ධ දේශනාවන් ය. එම දේශනා අතර කරණීයමෙත්ත සූත්‍රය හා ඛන්ධ පිරිතෙන් පැහැදිලි කර ඇත්තේ සියලුම ප්‍රජාව කෙරෙහි මෙත් සිත පැතිර විය යුතු ආකාරයයි. එසේම මවක් තමාගේ එකම දරුවාට දක්වන සෙනෙහස යම් සේ ද එසේම සියලු ප්‍රජාව කෙරෙහි මෙත්සිත පැතිර විය හැකි නම් එවැනි මනසක ක්‍රියාකාරීත්වය සියලු ප්‍රජාව කෙරෙහි බොහෝ සෙයින්ම සාධාරණ ය. එය මෙත් සිතෙහි උපරිම තලයයි.

වර්තමාන සමාජයට වඩා වඩාත් අවශ්‍ය ගුණධර්මයක් වන්නේ මෛත්‍රියයි. ලෝකවාසී ප්‍රජාව මුහුණ පා සිටින ව්‍යසනකාරී අවස්ථාවක සියලු දෙනා තුළින් මුහුර්තිමත් විය යුතු ගුණාංගයන් අතර එක් ප්‍රධාන මානසික ක්‍රියාකාරීත්වයක් වන්නේ මෙත් සිත පැතිරවීමයි. මෙත් සිතක් ඇති පුද්ගලයා අනුන් ගැන සිතමින් අනුන්ගේ ආරාක්ෂාව, සුවපත් භාවය ප්‍රාර්ථනා කරමින් ආත්මාර්ථකාමී හැඟීම්වලින් බැහැරව කටයුතු කරයි.

ඇතැම් අවස්ථාවල සියලු දෙනා කෙරෙහි හිංසා සහගත සිතිවිලි සහිත ව කායිකව ක්‍රියා කිරීම නිසාත් අනුන්ට හිංසා පීඩා ගෙනදෙන අයුරින් හැසිරීම නිසාත් සියලු දෙනා වෙත වසංගත රෝග ව්‍යාප්ත වීමට අවස්ථාව උදාවේ. තමාගේ සුඛවිහරණය පමණක් සිතා කටයුතු කිරීම, සත්ව ප්‍රජාව පමණක් නොව ස්වභාව ධර්ම කෙරෙහි දයාවෙන් තොරව හිංසනය හා වෛරය පෙරදැරිව කටයුතු කිරීමත් මෙවැනි ව්‍යසනයන්ට මග පාදයි. ධනයෙන් හා බලයෙන් මත්වී සිටින පිරිස සෙසු අය කෙරෙහි දක්වන වෛරී සහගත සිතිවිලි හා ක්‍රියාකාරකම් නිසා හානිදායක ව්‍යසනකාරී තත්ත්වයන් සමාජය තුළ නිතර උද්ගත වේ.

## සොබා දහමට අනුව ජීවිතය

මෙත් සිතක් ඇති පුද්ගලයා බෙහෙවින් ස්වභාව ධර්මයට ඇලුම් කරයි. වර්තමානයේ උද්ගත වී ඇති ලෝක වසංගතය හමුවේ පැහැදිලි වෙන්නේ මිනිසා ස්වභාව ධර්මයෙන් දුරස් වීමේ අනිටු විපාකයන් ය. එබැවින් සියලු ලෝකවාසීන් එකමුතු ව නැවතත් ස්වභාව ධර්මයට අනුව ජීවත් වීමට

උත්සාහ ගැනීමකට මං විවර කරයි. නමුත් එය කෙතෙක් දුරට අනුගමනය කරයි ද යන්න ගැටලුවකි. පරිසරයට අනුගතව කටයුතු කරමින් තම අවශ්‍යතා පිරිමසා ගත් අවස්ථාවක් මොහොතකට හෝ මේ කාලයේ අපට දැකිය හැකි ය. දේශීය පැරණි බෙහෙත් වර්ග හා පාන වර්ග පානය කරමින් සෞඛ්‍ය සම්පන්න ව ජීවත් වීමට ගන්නා ලද උත්සාහයන් ද මෙම කාලයේ සාමාන්‍ය සාමාජීය ලක්ෂණයකි. මෙසේ අප නැවතත් අතීතයට පිය නගමින් ස්වභාව ධර්මයට ඇලුම් කරමින් කටයුතු කරනු දැකීම තුළින් ප්‍රකට වන්නේ ස්වභාව ධර්ම හා මිනිසා අතර බැඳීම තවදුරටත් ශක්තිමත් වීමකි.

යමෙක් ආත්මාර්ථකාමී, වෛරී, හිංසාසහගත යන සිතිවිලිවලින් දුරස් ව මෛත්‍රී සහගත සිතිවිලිවලින් කටයුතු කිරීම නිසා ස්වභාව ධර්මයෙන් හෝ මිනිස් නොමිනිස් සියල්ලන්ගෙන් ද හානියක් අකටයුත්තක් කිසිදාක සිදු නොවේ. ධර්මය ඔහුව ආරක්ෂා කරයි. ගුණධර්මවලින් දුරස් වී යන සමාජයක ගුණවත්කමින් පොහොසත් අයෙකු වීමට මෙත් සිත පුහුණු කිරීම හා වර්ධනය කිරීම එලදායී ක්‍රියාවක් වේ.



ප්‍රතිසංස්කරණය වන මහා සෑය

# උතුරෙන් හෙළිවන බොදු අභිමානය

## සපුමල්ගස්කඩ ඓතිහාසික පුරාණ රාජ මහා විහාරය



බුද්ධ මන්දිරය



පෞරාණික නටබුන්



රන්පත් බෝධීන් වහන්සේ



ගලිගමුවේ සන්තබෝධි හිමි



ඉපැරැණි නශ්ඨාවශේෂ



කැණීම්කරන ලද පුරා වස්තු

කාලයේ වැලි තලාවට හසුව වියැකී යන බොහෝ පෞරාණික දෑ මේ මහපොළව මත පැවතිය ද ලොව්තුරු බුදුරදුන්ගේ ආනුභාවයෙන් ප්‍රමුදිත වූ කිසිවක්, කෙදිනකවත් එසේ යටපත් ව විනාශ නොවන බැව් යථාර්ථයයි. එය මැනවින් හඳුනාගත හැකි පින්බිමක ආශ්චර්යය වසර ගණනාවකට පසුව යළිත් හෙළයන්ගේ උරුමයට එකතු වනුයේ එම ආනුභාවයේ අනුහස් මහපොළවේ උපදින නිසයි.

බුදුරදුන්ගේ පාද ස්පර්ශයෙන් පුණ්‍යවන්ත වූ භූමියක උරුමය ලද අප මේ මහා පොළවේ තවත් ඉසව්වක නොදුටු පින්බිමක තතු සොයා යන්නේ, උතුරුකරයේ බොදු උරුමය යළි උපදින මොහොතකයි.

වව්නියාව දිස්ත්‍රික්කයේ වව්නියාව උතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැලෑ බෝගස්වැව සිංහල ගම්මානවලට කිලෝමීටර් තුනක් පමණ දුරින් පිහිටා ඇති සපුමල්ගස්කඩ ඓතිහාසික පුරාණ රාජ මහා විහාර පින්බිමයි මේ. ඓතිහාසික පුරාවිද්‍යා වටිනාකම්වලින් පෝෂිත මේ පින් බිම ක්‍රි.ව. අටවැනි සියවස් කල රාජ්‍ය අනුග්‍රහයෙන් පෝෂිත ව සශ්‍රීක ව පැවැති බවට ශේෂව ඇති නටබුන් සාක්ෂි දරයි. එහෙත් මේ බිම කාලිංඝ මාඝ ආක්‍රමණයත් සමඟ ජනශූන්‍ය ව පැවැතෙන්නට ඇති බවයි සපුමල්ගස්කඩ පබ්බතාරාම පින්බිමේ විහාරාධිපති ගලිගමුවේ සන්තබෝධි හිමි සඳහන් කරනුයේ. රාජකීයන්ගේ පහස ලද පින්බිමක් වුව ද එහි පාලනය ලද හා ඉදිකළ විශේෂිත රජ කෙනෙකු පිළිබඳ කිසිදු ලිඛිත සාක්ෂියක් හමුවී නොමැත. එහෙත් වත්මනෙහි සිදුවන පුරා විද්‍යාත්මක කැණීම් මත එම ඉතිහාසය නුඳුරේදී ම හෙළි විය හැකි බවයි සන්තබෝධි හිමි සඳහන් කරනුයේ.

කලක් උතුරේ පාලනය රැගෙන ගිය සපුමල් බණ්ඩාර කුමාරයා මෙම පුණ්‍ය භූමියේ කටයුතු ඉදිකළ බව සඳහන් වෙන බව ජනප්‍රවාදයේ සඳහන් වෙයි.

තව ද වව්නියාව මඩුකන්ද විහාරස්ථානයේ වැඩ සිටි දළදා වහන්සේ ටික කලක් මෙම විහාර පින්බිමේ වැඩ සිටියා යැයි ජනප්‍රවාදයේ සඳහන් වෙන කරුණකි. එය මැනවින් තහවුරු වනුයේ විහාර පින් බිම වටා ඉදිකර තිබූ ආරක්ෂිත දිය අගල බව සන්තබෝධි හිමි සඳහන් කරනුයේ.

වසර පන්සියයකටත් එහා ගිය වයසින් යුත් කලුවර ගසින් වැසී ගිය මෙම පුණ්‍ය භූමියේ එම සාක්ෂි තවමත් නිරුපද්‍රිත ව ඇති අතර අක්කර දෙසීයක පමණ භූමියක් පුරා එහි නටබුන් විසිර පවතිනුයේ ප්‍රෞඪ ඉතිහාසයක සාක්ෂි හෙළිකරමිනි.

පෞරාණික චෛත්‍යයකින් ද, පිළිම ගෙය හා ආසනඝර කැටයම් සහිත කොරවක් ගල්, ගොඩනැගිලි ප්‍රතිමා, ගෘහය, ආරාම, සංකීර්ණ, බිසෝ කොටුව හා ඉපැරණි වැවකින් ද මෙම පුණ්‍ය භූමිය පෝෂිත ය.

පසුගිය කාලයේ රුදුරු ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයේ පැවැති මෙම විහාර පින්බිම ප්‍රදේශය තුල විනාශයන්හි සලකුණු තවමත් දැකගත හැකි නශ්ඨාවශේෂයන් ය.

එමෙන්ම කලක් නිධන් හොරුන්ගේ ග්‍රහණයට නතුව තිබූ බවට සාක්ෂි ද මෙම විහාර පින්බිමේ තැනින් තැන දැකගත හැකි ය. අතීතයේ සිංහල ජනතාව සිටිය ද පසු කාලීන ව සිංහල ජන සමාජය එම ප්‍රදේශයේ ශූන්‍ය ව ගිය ද යළිත් පවුල් කිහිපයක් පින්බිම වටා එකතුව ඇති බැව් සන්තබෝධි හිමි පවසනුයේ සොම්නසිනි.

වව්නියාව බෝගස්වැව නෙඳුන්කේති අතුරු මාර්ගයේ කිලෝමීටර් පහක් පමණ ගිය පසු පෙරියකට්ටිකුලම් රක්ෂිතයේ පලු, වීර, කලුවර, පිරි ඝන කැලෑවක් මැද අද නිසොල්මනේ මෙම රාජමහා විහාර පින්බිම විරාජමාන ව ඇත. වනඅලි, වලස්, දිවි, මුවන්, ගෝනුන් පිරි පරිසරයක සිටිමින් මෙම උරුමය රකින්නට අද ගලිගමුවේ සන්නබෝධි හිමි දරන මෙහෙය අපමණ ය.

වත්මනෙහි රෝපිත රන්පත් බෝධීන් වහන්සේ නමකගේ හා බෝධි ප්‍රාකාරය බොදුනු බැතිමතුන් වෙනුවෙන් වන්දනීය ව මේ පින්බිමේ ඇත.

මෑත යුගයේ දීර්ඝ කාලයක් තුළ උතුරේ කිසිදු චෛත්‍යරාජයාණන් වහන්සේ නමක ප්‍රතිසංස්කරණය නොවූ බව අප දන්නා කරුණකි. එම ඉතිහාසයට නැවුම් පිටුවක් එක්කොට සපුමල්ගස්කඩ රාජමහා විහාරයේ පුරාණ සෑය අද ඇසළ පොහෝ දින රාජ්‍ය අනුග්‍රහයෙන් ප්‍රතිසංස්කරණය වනුයේ ජාතියට උරුමවන ශ්‍රේෂ්ඨ පින් බිමක් ලෙසිනි.

අනුරාධපුර අටමස්ථානයට අයත් ථූපාරාම, දගැබ හා සමාන මෙම සෑය ජනාධිපති කාර්ය සාධක බලකාය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය එක්ව ඉදිකරනුයේ ලක්දිව බොදු උරුමයට වත්මනෙහි උතුරුකරෙන් හමුවන බොදු උරුමයේ අභිමානය එක්කරමිනි.

වසන්ත ජයසිංහ ආරච්චි

වර්ෂ 2020 ක් වූ ජූලි 04 වැනි ද සෙනසුරාදු කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.